# අමරපුර මහා නිකායේ
# මහාසාමි ධූරාවලිය



තල්ගහවෙල සුමේධ

# අමරපුර මහා නිකායේ
# මහාසාමි ධූරාවලිය

තල්ගහවෙල සුමේධ හිමි

# අමරපුර මහා නිකායේ මහාසාමි ධූරාවලිය

**තල්ගහවෙල සුමේධ හිමි**

**කර්තෘ**

පුත්තලම් දිසාවේ ඓතිහාසික බොදු උරුමය සොයා... (2020)
පුත්තලම දිස්ත්‍රික්කයේ ටැම්පිට පිළිමගෙවල් සහ ටැම්පිට දේවාල (2021)

හලාවත මුන්නස්සරම තුමුලසෝම මහ පිරුවෙන

ප්‍රාචීන ප්‍රාරම්භ ශ්‍රේණිය

2025.02.08

ISBN 978-624-208-801-3

# පිදුම

*අමරපුර සමාගම හෙවත් අමරපුර මහා නිකාය ශ්‍රී ලංකාවේ*

*ප්‍රතිෂ්ඨාපනය කළ*

***බෝධිසත්වගුණෝපේත මහාධම්ම රාජාධිරාජගුරු අතිගෞරවාර්හ***

***වැලිතර මහකරාවේ ශ්‍රී ඤාණවිමල තිස්ස***

*අමරපුර සංඝරාජයන් වහන්සේගේ ශ්‍රී නාමයට* ෴

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පටුන

පළමුවැනි පරිච්ඡේදය

**අමරපුර මහා නිකායයේ ආරම්භය විකාශය (වර්ෂ 1802 සිට මේ දක්වා) 07-25**

දෙවන පරිච්ඡේදය

**මහානායක පදවිය හෙබවූ මහතෙරුන් වහන්සේලා 26-150**

*පළමුවැනි පරිච්ඡේදය*

# අමරපුර මහා නිකායයේ ආරම්භය විකාශය (වර්ෂ 1802 සිට මේ දක්වා)

ශ්‍රී ලංකාවේ සුපාරිශුද්ධ උපසම්පදාව මහනුවර යුගය වන විට පිරිහී තිබුණු බැවින් පසු කලෙක සංඝරාජ පදවියට පත් වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේගේ අනුශාසනා පරිදි කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් වර්ෂ 1753 දී ශ්‍යාම දේශයෙන් ප්‍රවර උපාලි මහ ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ ශ්‍යාම වංශික තෙරවරුන් වැඩමවා මෙරට ශ්‍යාමෝපසම්පදාව පිහිටුවන ලදී. යම් යම් හේතු නිසා පහත රටට එම ශාසනාලෝකය නොලැබී ගිය නිසා වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේගේ සහ බෝවල ධම්මානන්ද හිමියන්ගේ[1] ශිෂ්‍යවර වැලිතර මහකරාවේ ශ්‍රී ඤාණවිමල සාමණේරයන් වහන්සේ උපසම්පදාව ගෙන ඒමේ අභිලාෂයෙන් සියම් දේශයට වැඩමවීමට සූදානම් විය. එසේ සියම් දේශයට යන අතරතුර ඤාණවිමල හිමියන් ඇතුළු දූත පිරිස බුරුමයට සම්ප්‍රාප්ත වූ අතර බුරුම රට පණ්ඩිත මහාධම්ම රාජාධිරාජ මහරජුගේ රාජානුග්‍රහයෙන් බුරුම අමරපුරයේ සුවණ්ණගුහා නම් බද්ධ සීමාවේ දී බුරුමරට ඤාණාභිවංස ධම්මසේනාපති සංඝරාජයන් වහන්සේ වෙතින් සුපාරිශුද්ධෝපසම්පදාව ලද්දේ ය.

[1] මෙම බෝවල ධම්මානන්ද මාහිමියන් යනු ප්‍රවර උපාලි හිමියන් වෙතින් මුල් සියම් උපසම්පදාව ලැබූ මුල්ගිරිගල සංඝ පරම්පරාවේ ආදිකර්තෘභූත වටරක්ගොඩ ධම්මපාල නාහිමියන්ගේ ශිෂ්‍යවර විල්ලද්දර විහාරාධිපති නලගම මණිරතන හිමියන්ගේ ශිෂ්‍යවරයාණ කෙනෙකි.

ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙදහස් තෙසිය සසාළිස් වැන්නේ (වර්ෂ 1802) මැදින් මස කොළඹ වරායෙන් ශ්‍රී ලංකාද්වීපයට වැඩම කළ මහාධම්ම රාජාධිරාජගුරු වැලිතර ඤාණවිමල තිස්ස අමරපුර ශ්‍රීමත් සංඝරාජ මහෝත්තමයාණන් වහන්සේ විසින් ලක්දිව කුලදරුවන් මහණ උපසම්පදා කොට මුම්මවංශික අමරපුර මහා නිකාය සම්බුදු පා පහස ලද මේ පුණ්‍යභූමියේ සුස්ථිර ලෙස ම ප්‍රතිෂ්ඨාපනය කොට වදාළහ. [2]

---

[2] දැනට ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව ලෙස හඳුන්වා දෙන සංවිධානයට අනුබද්ධ නිකාය සහ පාර්ශ්ව 22 කි. ඒවායෙහි ආරම්භය ප්‍රධාන භික්ෂූන් වහන්සේලා පස් නමකගෙන් සිදුව ඇත. ඒ

- **<u>අතිගරු වැලිතර ඤාණවිමල තිස්ස මාහිමි - වර්ෂ 1802</u>**
- අතිගරු බෝගහපිටියේ සිරි ධම්මජෝති මාහිමි - වර්ෂ 1808-1810
- අතිගරු කතලුවේ ගුණරතන තිස්ස මාහිමි- වර්ෂ 1810
- අතිගරු කපුගම ධම්මක්ඛන්ධ මාහිමි - වර්ෂ 1810
- අතිගරු අත්තුඩාවේ සිරි ධම්මරක්ඛිත මාහිමි - වර්ෂ 1813 දී (ලංකාවට පැමිණ 1817 දී පළමු උපසම්පදාව සිදුකරයි.) යන අයයි.

ඒ අනුව මුලදී අමරපුර සමාගම නමින් හැඳින්වූ අමරපුර මහා නිකාය මුල්වරට මෙරට පිහිට වූ ආදිකර්තෘන් වහන්සේ වන්නේ **අතිගරු වැලිතර ඤාණවිමල තිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේයි.** ඒ අනුව උන්වහන්සේගෙන් ආරම්භ වූ ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර අමරපුර සමාගම නමිනුත් පසුව අමරපුර මහා නිකාය නමිනුත් හැඳින්වීම සිදු කර ඇත. එම ප්‍රධාන අමරපුර මහා නිකායෙන්

- වර්ෂ 1886 පෙබරවාරි 25 වනදා වැලිතර ඤාණතිලක හිමි බුරුමයේ මහාගණ්ඨි නිකායෙන් උපසම්පදාව ලබා චූලගණ්ඨි නිකාය පිහිටුවන ලදී.
- වර්ෂ 1924 මැයි 01 වනදා අහුන්ගල්ලේ විමලධීර තිස්ස මාහිමියන් මූලවංශික නිකාය පිහිටුවන ලදී.
- වර්ෂ 1929/31 කාලයේ දී වස්කඩුවේ මේධාවිතිස්ස මාහිමියන් ශ්‍රී සම්බුද්ධ ශාසනෝදය සංඝ සභාව ද පිහිටුවන ලදී.

මේ ලෙස වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ගෙන් පසුව මෙරටට බුරුම උපසම්පදාව ගෙන ආ අනෙක් හිමිවරුන් සිව්නමගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා ද ශාඛාප්‍රශාඛාවලට බණ්ඩනය වී නිකාය පාර්ශ්ව 22ක් බිහිව ඇත. ඒ අනුව මෙරට අමරපුර උපසම්පදාවේ ආදිකර්තෘන් වහන්සේ වන වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ ඍජු අඛණ්ඩ ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර අමරපුර මහා නිකායයි.

එලෙස බුරුමයෙන් උපසම්පදාව ගෙන ආ උන්වහන්සේට බුරුම මහරජු විසින් මහාධම්ම රාජාධිරාජගුරු ගෞරවෝපාධිය සහිතව නායක පදවිය ප්‍රදානය කරන ලදී. එහෙත් උන්වහන්සේ අමරපුර සංඝයාගේ ගණනායක ස්වාමීන් වහන්සේ ලෙස පත් කරන්නේ 1825 වසරේ මැයි 21 දිනය. ඒ උන්වහන්සේට පසුව බුරුමයට ගොස් 1811 වසරේ උපසම්පදාව ගෙන ආ කපුගම ධම්මක්ඛන්ධ හිමියන්ට ඉංග්‍රීසි ආණ්ඩුව අමරපුර සංඝයාගේ නායක ධානාන්තරය ලබා දීමෙන් පසුවය. මෙයට හේතු වන්නේ ඤාණවිමල තිස්ස මාහිමියන් වහන්සේ 1798 වසරේ ලංකාද්වීපයෙන් සියම කරා වැඩම කරන විට පහතරට ප්‍රදේශ ලන්දේසීන් සතු වූ අතර උපසම්පදාව ගෙන ආපසු ලක්දිවට වැඩම වන විට එම ප්‍රදේශ ඉංග්‍රීසින් සතුව තිබීමයි. ඤාණවිමල තිස්ස හිමියන්ට උපසම්පදාව ලබා ගැනීම සඳහා උපකාර කළ සහබන්දු මුදලිතුමා ලන්දේසීන්ට පක්ෂව සිටි අයෙකි. ඒ වන විට බලපිටිය කප්පින වලව්වේ මුදලිවරයා ඉංග්‍රීසීන්ට පක්ෂව සිටි අතර 1811 වසරේ බුරුමයට ගොස් උපසම්පදාව ගෙන ආ කපුගම ධම්මක්ඛන්ධ හිමියන්ට ඒ සඳහා උපකාර කළේ කප්පින වලව්වේ ප්‍රභූන් ය. ඉංග්‍රීසි රජය මඟින් අමරපුර සංඝයාගේ නායක ධානාන්තරය කපුගම ධම්මක්ඛන්ධ හිමියන්ට ලබා දෙන්නේ මෙම දේශපාලන පක්ෂපාතීත්වය නිසා බව පහසුවෙන් අවබෝධ කරගත හැකිය.

මේ අනුව මූලාරම්භක සමය වන විට බුරුමයෙන් උපසම්පදාව ලැබූවන් වර්ෂ 1802 දී වැලිතර මහකරාවේ ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ පුරෝගාත්මීත්වයෙන් යුතු **අඹගහපිටි මූල මහා විහාර පරම්පරාව** සහ වර්ෂ 1811 දී කපුගම ධම්මක්ඛන්ධ මාහිමියන්ගේ

පුරෝගාමීත්වයෙන් යුතු **දඩලු මූල මහා විහාර පරම්පරාව** යන උභය පාර්ශ්වයන්ගෙන් යුතු විය. මෙම උභය පාර්ශ්වයන්ගේ මූලාරම්භක තෙරවරුන් දෙනම ම පෙනී සිටි **අමරපුර සමාගම** යන නාමයෙනි. මෙම දෙනම වහන්සේ වෙත ම බුරුම මහරජු විසින් නායක පදවි ලබාදුන් අතර ඉහත දී දැක්වූ පරිදි මෙරට පාලනයෙහි නියුතු ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අමරපුර සමාගමේ පළමු නායක පදවිය ලබා දුන්නේ කපුගම ධම්මක්ඛන්ධ නාහිමිපාණන්ට වේ. පසුව 1825 දී අම්බරුක්ඛාරාම මූල මහා විහාර පාර්ශ්වයේ ප්‍රධානියා වූ වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන් අමරපුර සමාගමේ නායකත්වයට පත්වෙයි. බුරුම රට පණ්ඩිත මහාධම්ම රාජාධිරාජ රජු විසින් වර්ෂ 1802 ජනවාරි 31 වනදා වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ට දුන් සන්නස් පත්‍රයේ උන්වහන්සේව සඳහන් කර ඇත්තේ **ලාංකික රාජගුරු නායක තෙරුන් වහන්සේ** ලෙසයි. වර්ෂ 1825 මැයි 21 වනදා ඉංග්‍රීසි ආණ්ඩුව මඟින් අමරපුර සමාගමේ නායකත්වය ප්‍රදානය කළ පත්‍රයේ සඳහන් වන්නේ **ලංකාද්වීපයෙහි මුහුදු කරේ තොටමුණුවල සිටින මහබද්දේ මහනුන්නාන්ෂේලාට නායක පදවිය** ලෙසයි. වර්ෂ 1811 ජූලි 11 වනදා මහබද්දේ සුපරෙන්තැන්දැන්ත් නිලයට පැමිණි ජෝන් වැල් බිෂොප් උන්නාන්සේ නිකුත් කළ ලිපියේ **අමරපුර සමාගමේ නායක උන්නාන්සේ** යනුවෙන් දක්වා ඇත. මේ අනුව තමන්වහන්සේ විසින් දුකසේ පිහිටවූ අමරපුර සමාගමේ නායක ධානාන්තරය දරමින් සිටි වැලිතර ඤාණවිමල තිස්ස ස්වාමීන් වහන්සේ වර්ෂ 1846 ඇසළ මස අපවත් වූ අතර උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමිපාණන් පසුව අඹගහපිටි මූල මහා විහාර පරම්පරාවේ නායකත්වයට පත්වෙයි. මෙම බේරතුඩුවේ ධම්මාධාර තිස්ස නායක ස්වාමීන්ද්‍ර සමයේ මීගමුව,

හලාවත, පුත්තලම ආදී බටහිර සහ වයඹ පළාත්හි සභාග සංඝයාට වෙන්ව කටයුතු කරගෙන යෑම සඳහා ප්‍රාදේශික සංඝ සභාවක් පවත්වාගෙන යෑමට අවසර ලබා දී ඇත. **අමරපුර නිකායේ ශ්‍රී සද්ධර්මෝදය සංඝ සභාව, සිරිසුගත සාසනෝදය සංඝ සභාව** යන නාමවලින් ප්‍රකට වූ මෙම ප්‍රාදේශික සංඝ සභාව වර්තමානයේ මූලවංශික නිකායානුබද්ධව කටයුතු කරනු හඳුනාගත හැකිය. බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමියන් 1868 වසරේ දී පමණ අපවත් වූ අතර උන්වහන්සේගේ අපවත් වීමෙන් හිස් වූ අඹගහපිටි මූල මහා විහාර පරම්පරාවේ නායක පදවියට උන්වහන්සේගේ ම ශිෂ්‍ය කහවේ ඤාණානන්ද තිස්ස හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යවරයා වූ මහකරාවේ විමලසාර තිස්ස හිමිපාණන් පත් වේ. ඒ වර්තමානය වන විටත් අමරපුර මහා නිකායයේ මහානායක පදවිය සඳහා හිමිවන **අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර** ගෞරවාභිධානය ද සහිතව ය. 1888 වසරේ අගෝස්තු මස 06 බ්‍රහස්පතින්දා එම මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත් වී වදාළහ. පුරප්පාඩු වූ මහානායක පදවිය සඳහා පාතේගම රාහුලාරාමාධිපති රන්දොඹේ චන්දජෝති තිස්ස හිමිපාණෝ පත්ව වදාළහ. රන්දොඹේ චන්දජෝති තිස්ස මහානායක හිමිපාණගේ ස්වර්ගස්ථ වීමෙන් පස්වැනි මහානායක ධානාන්තරයට පත් වූයේ කහවේ ඤාණානන්ද තිස්ස හිමියන්ගේ කණිෂ්ඨ ශිෂ්‍යරත්නය වූ ද මහකරාවේ විමලසාර තිස්ස අමරපුර තෙවැනි මහානායක මාහිමියන්ගේ පැවිදි සහෝදර වූ ද මොරගල්ලේ බුද්ධසිරි තිස්ස මාහිමිපාණන් ය. මොරගල්ලේ බුද්ධසිරි තිස්ස මහානාහිමියන් 1915 වසරේ අපවත් වූයෙන් හිස් වූ අමරපුර ප්‍රධාන ගණනායකත්වය සඳහා අම්බරුක්ඛාරාමයේ නිවැසි වැලිතර ඤාණවිමලතිස්ස මහානාහිමිගේ පරපුරේ ජ්‍යෙෂ්ඨ තෙරනමක වූ

බලපිටියේ සීලරතන තිස්ස හිමියන් පත්කරගනු ලැබිණි. උන්වහන්සේ 1924 වසරේ අප්‍රේල් මස ස්වර්ගස්ථව වදාළහ.

මේතාක් අඛණ්ඩව පැවති නිකාය වර්ෂ 1924 දී සයවන මහානායක පදවිය දැරූ අමරපුර ගණාචරිය බලපිටියේ සීලරතන තිස්ස මහානාහිමිපාණන් වහන්සේගේ අපවත් වීමෙන් පසු කොටස් දෙකකට ඛණ්ඩනය විය. බලපිටියේ සීලරතන තිස්ස මහානාහිමියන් 1924 අප්‍රේල් මස අපවත් වූ පසු 1924 මැයි 1 වනදා හිස් වූ මහානායක පදවියට සුදුසු තෙර නමක් තෝරාගැනීමේ ශතාධික සංඝසභාව වැලිතර අම්බරුක්ඛාරාමාධිපති වැලිතර අමරසිරි තිස්ස මාහිමියන් වහන්සේගේ දායකත්වයෙන් ද වස්කඩුවේ සම්බුද්ධ සාසනෝදය පරිවේණාධිපති සිරිසුගත සාසනවංසපාල ගණාචරිය අරියවංසතිලක මේධාවීතිස්ස නාහිමියන්ගේ සභාපතීත්වයෙන් ද යුතුව රැස් වූ අතර අමරපුර මහා නිකායයේ මහානායක මාහිමියන් වහන්සේ පත් කරගැනීමේ මහ සභාවට ගිහි ප්‍රභූන් වෙනුවෙන් සී.ඩබ්.ඩබ්. කන්නන්ගර අමාත්‍යතුමා ඇතුලු ප්‍රභූන් රැසක් සහභාගී විය. එම අවස්ථාවේ බහුතර සභාග සංඝානුමැතියෙන් මහකරාවේ විමලසාර තිස්ස අමරපුර මහා නිකායයේ තුන්වන මහානායක හිමියන්ගේ ශිෂ්‍යවර තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් මහානායක පදවියට තෝරාගෙන ඇත. එයට අකමැති වූ භික්ෂු පිරිසක් වෙනම මහානායක හිමිනමක පත් කොට ගෙන සිට ඇත. ඒ අනුව එසේ පත් කරගත් අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් ද අමරපුර මහා නිකායයේ සම මහානායක හිමිනමක ලෙස සලකයි. ඒ අනුව නිගමනය කළ හැක්කේ බලපිටියේ සීලරතන තිස්ස මහානායක හිමියන්ගෙන් පසුව අමරපුර නිකායයේ මහානායක පදවියට

තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් සහ අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් පත් වූ බවයි. අමරපුර මහා නිකාය "මූලවංශික" යන අභිධානයෙන් ද ප්‍රකටව පැවති අතර අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන්ගේ කණ්ඩායම පසුව මූලවංශික නිකාය යැයි ප්‍රකටව මුල් අමරපුර මහා නිකායෙන් වෙන්ව කටයුතු කරන්නට විය. අමරපුර නිකාය ම මූලවංශික නාමයෙන් ද ප්‍රකටව පැවති නිසා තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් මූලවංශික නිකායයේ මහානායක ලෙස ද හඳුන්වා ඇත. එහෙත් අභිනවයෙන් වෙන් වූ අහුන්ගල්ලේ පාර්ශ්වය මූලවංශික නිකාය යැයි ඍජුව තම කණ්ඩායම හඳුන්වා ගැනීමත් එනමින් වර්ෂ 1931 ලියාපදිංචි වීමත් නිසාවෙන් තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක හිමියන් ඇතුලු මුල් කණ්ඩායම අමරපුර නිකාය යන නාමයෙන් ම පෙනී සිට ඇත.

ඒ අනුව මුල් අමරපුර මහා නිකායෙන් වෙන්ව 1886 වසරේ පෙබරවාරි මස 25 වනදා වැලිතර ඤාණතිලක හිමියන් චූලගණ්ඨි නිකාය සමාරඟ කළ අතර පසුව මූලවංශික නිකාය යැයි අභිනව භික්ෂු සංස්ථාවක් ද මෙසේ ඇති විය. ආරම්භක නිකාය වන අමරපුර නිකායයේ මහානායක තෙරුන් ලෙස ලියාපදිංචි වූයේ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් වීමෙන් වැලිතර ඤාණවිමල තිස්ස හිමියන්ගේ පටන් සමාරබ්ධ ආරම්භක භික්ෂු පරපුර උන්වහන්සේගේ නායකත්වය පිළිගත් බවට සාධක වේ. මෙම අමරපුර මහා නිකායයේ මෙන්ම අභිනව මූලවංශික නිකායයේ ද මූලස්ථානය වූයේ වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරයයි. දෙපාර්ශ්වය ම තම උපසම්පදා කටයුතු ද බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේ දී සිදු කරන ලදී. තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් බුද්ධාංකුර උතුමෙකු සේ

ජනප්‍රසාදයට පත් මහතෙරනමකි. අනගාරික ධර්මපාලතුමන් සිරි දේවමිත්ත නමින් ඉන්දියාවේ දී ප්‍රව්‍රජාවට පත්වන විට පොරවා ඇත්තේ මුන්වහන්සේ පොරවා සිටි චීවරයක් ලක්දිවින් ගෙන්වා ගෙනය. ධර්මපාලතුමා නිතර තම ශාසනික සේවාවන් සඳහා සංඝානුශාසනා ලබා ඇත්තේ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙනි. උන්වහන්සේ වෙත ධර්මපාලතුමා සිය අත්සනින් එවා ඇති ලිපීන්ගෙන් ඒ බව මොනවට ගම්‍ය වේ. ත්‍රෛනිකායික මහ තෙරවරුන් අතර ධර්මධර විනයධර පණ්ඩිතමානී විචිත්‍ර දේශකයෙකු ලෙස ප්‍රකටව සිටි මෙම මහානාහිමියන් කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරුවනේ, මහනුවර දළදා මාලිගාසන්න මඟුල් මඩුවේ දළදා වහන්සේ පිළිබඳ කළ ඓතිහාසික දේශනාවක් ශාසන ඉතිහාසයේ ඉහළින් ම ලියැවී ඇත.

වර්ෂ 1941 ජූලි 01 වන අඟහරුවාදා තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක හිමියන්ගේ අපවත්වීමෙන් පුරප්පාඩු වූ අමරපුර ගණනායක පදවිය එවකට අනුනායක පදවිය දරණ ලද මහකරාවේ විමලසාර තිස්ස අමරපුර තුන්වන මහානායක හිමියන්ගේ පැවිදි ශිෂ්‍යවර උදම්මිට ධම්මරක්ඛිත තිස්ස හිමියන් වෙත සමර්පණය කරන ලදී. බුරුමයෙන් ගෙනා අමරපුර භික්ෂු කණ්ඩායම් සියල්ල ඒකාබද්ධ කොට **සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාව** සැකසීමට ද මූලිකත්වයක් ගෙන කටයුතු කළ මෙම මහනාහිමියන් එම සභාවේ සභාපති ධූරය ද දරමින් කටයුතු කළේය. 1971 වසරේ ජුනි 06 වනදා එම මහානායක හිමියන් අපවත් වූයෙන් තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහනායක හිමියන්ගේ ප්‍රියශිෂ්‍යවර රාජකීය පණ්ඩිත වලගෙදර සෝමාලෝක තිස්ස නාහිමියෝ අමරපුර ගණනායක තනතුරට පත්ව

වදාළහ. මෙසමය නිකායයේ ස්වර්ණමය අවධියක් ලෙස හඳුනාගත හැකි අතර දෙස්විදෙස් කුමන ප්‍රභූවරයෙකු මෙරටට පැමිණිය ද ඒ සැම දෙනා ම පැමිණෙන ස්ථානයක් බවට වලගෙදර සෝමාලෝක තිස්ස මහනාහිමියන් වැඩ සිටි රන්දොඹේ මහාචෛතිය පිරිවන පත් විය. බුරුමයේ පැවති සවැනි ධර්ම සංගායනාවේ දී ද අමරපුර මහා නිකාය නියෝජනය කරමින් වැඩම කළ මහානාහිමිපාණන් ත්‍රිපිටක සංස්කරණ මණ්ඩලයේ ද හිඳිමින් බුද්ධශාසනෝන්නතියට අනුපමේය සේවයක් ඉටු කර ඇත. එකල මහත් විනයධර තෙරුන් වහන්සේලා වැඩ සිටි නිකායක් ලෙස අමරපුර මහා නිකාය අන්‍ය සංඝයා අතර සම්භාවනාවට ද ලක්විය. 1970 දෙසැම්බර් 21 වනදා වලගෙදර සෝමාලෝක මහා නාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් පසුව නැවතත් නිකායයේ ඇතිවූයේ බෙදීම් තත්ත්වයකි.

ඒ අනුව රන්දොඹේ මහාචෛතිය පිරිවෙන් විහාරවාසී ඓතිහාසික නාගදීප රාජමහා විහාරාධිපති බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස හිමියන් සහ උදම්මිට ධම්මාලංකාර තිස්ස හිමියන් මහානායක පදවියට යෝජනා වූ අතර ධම්මාලංකාර තිස්ස හිමියෝ මහානායක පදවියට පත් වූහ. පසුව දක්ෂිණ ප්‍රදේශයේ මහාසංඝයා වහන්සේ වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය කේන්ද්‍ර කරගනිමින් බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මහානාහිමියන් යටතේ ද බටහිර - මීගමුව පළාත් ආසන්න සංඝයා වහන්සේ උදම්මිට උත්තමාරාම පුරාණ රාජමහා විහාරය කේන්ද්‍ර කරගනිමින් විහාරාධිපති උදම්මිට ධම්මාලංකාර තිස්ස මහනාහිමියන් යටතේ ද කටයුතු කරනු ලැබීය.

1979 වසරේ උදම්මිට ධම්මාලංකාර තිස්ස මහා නායක හිමියන්ගේ අපවත් වීමෙන් හිස් වූ මහානායක පදවිය සඳහා හීනටියන පොත්ගුල් මහා විහාරාධිපති හීනටියන ධම්මාලෝක තිස්ස හිමියන් පත් කරගන්නට යෙදුණි. හීනටියන ධම්මාලෝක තිස්ස මාහිමියන් වහන්සේ කොළඹ නාලන්ද විද්‍යාලයේ ආරම්භය සඳහා පුරෝගාමියෙකු වූ අතර එහි පළමු ධර්මාචාර්යන් වහන්සේ ද විය. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ පතාක යෝධයෙකු වූ මහානාහිමියන් හීනටියනින් ආරම්භ කළ මහජන සේවාව පිළිබඳ විමතියට පත් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරුන් සෝල්බරි සාමිවරයා පවා හීනටියනට පැමිණ ඇත. ඩී.සී. සේනානායක මහාතා ඇතුළු බෞද්ධ ප්‍රභූන් ඇරඹූ ශ්‍රී ලංකා ධර්ම ප්‍රචාරක වැඩ පිළිවලෙහි මූලිකයා වෙමින් විචිත්‍ර ධර්ම දේශකයෙකු ලෙස ලක්දිව සුපතලව සිටීමෙන් උන්වහන්සේ නිසා ම අමරපුර මහා නිකාය බැබළුණි. ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස වැනි රාජ්‍ය නායකයන්ගේ උපදේශකයා ද වූ නාහිමිපාණන් උසස් අධ්‍යාත්මික ගුණාංගයන්ගෙන් හෙබි මහතෙර නමක ලෙස කා අතරත් සම්භාවනාවට පාත්‍ර විය. අනගාරික ධර්මපාල, බලංගොඩ ආනන්ද යනාදී තෙරවරුන් සමඟ දෙස් විදෙස් පෙදෙස්වල බුද්ධ ශාසනය නඟා සිටුවීමට සිය ජීවිත කාලය ම නාහිමිපාණන් කැප කර තිබේ. උන්වහන්සේ 1981 දෙසැම්බර් 11 වන්දා අපවත් වීමෙන් පසු පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව කොළඹ නිදහස් චතුරස්‍රයේ දී රාජ්‍ය ආදාහන පූජෝත්සවය පවත්වා ඇත්තේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙනි.

පසුව හිස් වූ මහානායක ධුරය සඳහා උදම්මිට උත්තමාරාම පුරාණ රාජමහා මහා විහාරයට රැස් වූ මහා සංඝ සභාව විසින් කටාන

ශ්‍රී වර්ධනාරාමාධිපති කටුවැල්ලේගම අමරසිරි තිස්ස හිමියන් පත්කරගන්නා ලදහ. අමරසිරි මහානාහිමියන් මහනායක පදවියට පත්ව වසර පහක් යන විට කොටස් දෙකකට වෙන් ව පැවති බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මහානායක හිමියන්ගේ පාර්ශ්වය ද සම්බන්ධ කොට ගෙන 1985 ඔක්තෝම්බර් බස 24 වනදා කොළඹ විජේරාම මාවතේ චාරිකාරාමයේ දී සමගි සම්පන්න විය. මේ සඳහා එවකට බෞද්ධ කටයුතු කොමසාරිස් අභය වීරකෝන් මහතා ද සම්බන්ධ වූ අතර කාරක සංඝසභාන්තර්ගත සියලු සංඝයාගේ අනුමැතියෙන් කටුවැල්ලේගම අමරසිරි තිස්ස හිමියන් සහ බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස හිමියන් අමරපුර මහා නිකායයේ සමමහානායක හිමිවරුන් දෙනම ලෙස බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය. ඒ අනුව සමමහානායක හිමිවරුන් දෙනමගෙන් එක් හිමිනමක අපවත් වූවහොත් නැවත මහානායක ධුරයක් පත් නොකොට ඉතිරි මහානායක ස්වාමීන් වහන්සේ යටතේ සියලු අමරපුර නිකායික සංඝයා එක්සත් විය යුතු බව එදින ඇති කරගත් ගිවිසුමයි. ඒ ප්‍රකාවර එක් පසෙකින් නාගදීප රාජමහා විහාරාධිපති බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මහනාහිමියන් ද අනුනායක හිමිවරු දෙනම ද ඓතිහාසික කුරුවිට ශ්‍රී සුදස්සන පබ්බතාරාම දිවාගුහා රාජමහා විහාරාධිපති පාතේගම සුමනසිරි තිස්ස හිමියන් ඇතුළු ලේකම් මණ්ඩලය ද අනෙක් පසින් කටාන ශ්‍රී වර්ධනාරාමාධිපති කටුවැල්ලේගම අමරසිරි තිස්ස මහනාහිමියන් ද අනුනායක හිමිවරු දෙනම ද උදම්මිට ශ්‍රී උත්තමාරාම පුරාණ රාජමහා විහාරාධිපති උදම්මිට අස්සජී තිස්ස හිමියන් ඇතුළු ලේකම් මණ්ඩලය ද බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් අභය වීරකෝන් මහතා ඉදිරියේ අත්සන් තබා

ගිව්සුම්ගතව ඇත. සොළොස්මස්ථාන අතර එන ඓතිහාසික නාගදීප රාජමහා විහාරාධිපති ධුරය දැරූ බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මහනාහිමියන් 2003 අප්‍රේල් 15 වනදා අපවත් වී වදාළහ. පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව උන්වහන්සේගේ රාජ්‍ය ආදාහන පූජෝත්සවය නාගදීප රාජමහා විහාර පරිශ්‍රයේ දී පැවැත්වූයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙනි. බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස හිමියන් අපවත් වීමෙන් පසු නැවත මහානායක පදවියට භික්ෂූන් වහන්සේ නමක පත් නොකරගෙන සියලු දෙනාවහන්සේ කටුවැල්ලේගම අමරසිරි තිස්ස මහානායක හිමියන් යටතේ එක්සත් විය. උන්වහන්සේ 2005 සැප්තැම්බර් 14 වනදා අපවත් වූ පසු අනුනායක පදවිය උසුලමින් සිටි හීනටියන නන්ද තිස්ස හිමියන් අමරපුර මහා නිකායයේ ශ්‍රීමත් මහානායක පදවියට පත්ව වදාළහ.

වරින් වර බුරුමයට ගොස් උපසම්පදාව ලැගෙන ආ භික්ෂූන් වහන්සේලාගෙන් ව්‍යාප්ත වූ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා 22 ක් නිකායයන් නමින් හැඳින්වෙමින් පැවතුණි. කල්‍යාණවංශ නිකාය, චූලගණ්ඨි නිකාය, ධර්මරක්ෂිත නිකාය, මූලවංශික නිකාය, අමරපුර මහා නිකාය ආදි පරිද්දෙනි. මෙම භික්ෂු කණ්ඩායම් 22 ම ඒකාබද්ධ කොට අමරපුර මහා සංඝසභාව පිහිටුවීමෙන් කලක් ගිය පසුව අමරපුර මහා නිකාය ලෙස හැඳින් වූ අපගේ මුල් අමරපුර මහා නිකාය 2005 වසරේ සිට අඹගහපිටිය පාර්ශ්වය යන නව නාමයෙන් හැඳින්වීමට පටන් ගැනුණි. ඒ සමස්ත අමරපුර මහා නිකාය පිහිටුවා වදාළ වැලිතර ඥාණවිමලතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වැඩ සිටි අඹගහපිටිය මහා විහාරය අනුස්මරණය කරමිනි. පසුව 2024 වසරේ ජූලි මස 23 වනදා පැවති විංශත්වර්ගික කාරක මහා සංඝ සභාවේ දී අඹගහපිටිය

පාර්ශ්වය නමින් භාවිත කිරීමට වඩා මුල් අමරපුර මහා නිකාය අප වන බැවින් නැවත අමරපුර මහා නිකාය යන මුල් නාමය භාවිත කිරීමට සභාග සංඝයා තීරණය කරන ලදී. අමරපුර මහා නිකාය ලෙස හඳුන්වන්නේ මෙම මුල් නිකාය බව පැහැදිලිය. වර්තමානයේ සියලු පාර්ශ්ව ඒකාබද්ධව අමරපුර මහා සංඝසභාව පිහිටුවා ගැනීමෙන් සිදුව ඇත්තේ එතෙක් අමරපුර මහා නිකාය ලෙස හැඳින්වූ ලංකාවේ ප්‍රධාන නිකායත්‍රයෙන් එකක් වන අප භික්ෂු කොටසේ බලාධිකාරිය බිඳී යාමකි.

අමරපුර භික්ෂු වංශය මෙරට ආරම්භ කළ ආදිකර්තෘන් වහන්සේගේ ප්‍රධාන පරම්පරාව **අමරපුර මහා නිකාය** ලෙස ප්‍රසිද්ධව සිටි බව පැරණි යතිවරුන් සහ අතීතයේ ප්‍රකාශයට පත්කර ඇති විවිධ ලේඛනවලින් පෙනී යයි. අමරපුර මහා නිකායේ අටවැනි මහානායක හිමියන් ලෙස වැඩ සිටි තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මාහිමියන්ගේ ආදාහන පූජෝත්සවය සඳහා අමරපුර ධර්මරක්ෂිත නිකායේ මහානායක පැළෑනේ වජිරඤාණ මාහිමියන් වර්ෂ 1941 ජූලි මස එවන ලද ශෝක පණිවුඩයේ දැක්වෙන්නෙ ද **ලංකාවේ බුරුම නිකායන්ගේ මුල් නිකායේ මාහිමියන්** තොටගමුවේ පඤ්ඤාමොලි තිස්ස මාහිමියන් එනම් අමරපුර මහා නිකායේ අතිගරු මහානායක මාහිමියන් බවයි.

ආරම්භයේ සිට අප නිකාය භාවිත කළේ **අමරපුර මහා නිකාය** යන නාමයයි. 2018 වසරේ මහාචාර්ය ටී.ජී. කුලතුංග මහතා ප්‍රකාශයට පත් කළ ශ්‍රී ලංකාවේ බෞද්ධ නිකාය ඉතිහාසය ග්‍රන්ථයේ 142-143 පිටුවල අප භික්ෂු සමාගම හඳුන්වා ඇත්තේ **අමරපුර මහා නිකාය** නමින් වන අතර වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ සඟ පරපුර

බව පැහැදිලිව දක්වා ඇත. සිංහල විශ්වකෝෂයේ 640 පිටුවේ අමරපුර මහා නිකාය යනු කුමක්ද කියා විග්‍රහ කර ඇත්තේ "ශ්‍රී.බු.ව. 2346 දී අඹගහපිටියේ ඤාණවිමල තිස්ස තෙරුණුවන් විසින් ලක්දිව ඇතිකළ අමරපුර නිකායික භික්ෂු වංශයයි. කාලාන්තරයෙහි එහි ප්‍රධාන ශාඛා සතරකට බෙදී ගිය බව පෙනේ. අමරපුර මූලවංශ, අමරපුර සිරි සද්ධම්මවංශ, අමරපුර චූලගණ්ඨි, සම්බුද්ධ ශාසනෝදය සංඝ සභා යනුවෙනි." ඒ අනුව අමරපුර මහා නිකාය යනු පසු කාලයක බෙදී ගිය කුඩා කුඩා භික්ෂු කණ්ඩායම් නොවන බව පැහැදිලි වනු ඇතැයි සිතමි. අමරපුර මහා නිකායේ විවිධ කොටස් අනුකොටස් තිබුණ ද අනාදිමත් කාලයක සිට මෙරට සියම්, අමරපුර, රාමඤ්ඤ යන් තුන් නිකායේ අමරපුර මහා නිකාය ලෙස ප්‍රකටව සිටියේ අපගේ සඟ පරපුරයි. රුහුණු තිස්සමහාරාමය නැවත ප්‍රතිසංස්කරණය කොට කොත් පැළදවීමේ රාජ්‍ය උත්සවයේ දී අමරපුර මහා නිකාය වෙනුවෙන් මුලසුන ගෙන අනුශාසනාදිය පැවැත්වූයේ අමරපුර මහා නිකායේ මහානායක අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර තොටගමුවේ පඤ්ඤාමොලි තිස්ස මහානාහිමියන් මිස අමරපුර මහා නිකායේ කැඩී සිටින කුඩා කුඩා ශාඛා නිකායවල පාර්ශ්වවල මහානාහිමිවරු නොවේ. දිවංගත අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මහතාගේ අවමංගල උත්සවයේ දී අමරපුර මහා නිකාය වෙනුවෙන් මුලසුන ගෙන අනුශාසනා පැවැත්වූයේ එවක මහානායක අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර වලගෙදර සෝමාලෝක තිස්ස මහානාහිමියන් ය.

අමරපුර ධර්මරක්ෂිත මහා නිකායේ මහානායක මඩිහේ පඤ්ඤාසීහ මහානාහිමියන්ගේ බුද්ධවංසය - සාසනවංසය හා

අමරපුර වංසයේ අමරපුර මහා නිකාය හඳුන්වා ඇති අයුරු මෙසේයි. "අමරපුර මහා නිකායේ ආදිකර්තෘ සිරිඤාණවිමල මහ නාහිමිපාණන් වහන්සේ ඇතිකොට වදාළ නිකාය වේ. ඉන් විහිදී ගිය කොටස් වංශික, ගණ්ඨික, යුක්තිය ආදී වශයෙන් මතභේද ඇති කොට ගෙන මෙනමින් ව්‍යවහාරයට පත්කර ගනු ලැබිණ. 1931 වර්ෂයේ විහාර දේවාල ගම් පනත යටතේ සියම් මහා නිකාය, අමරපුර මහා නිකාය, රාමඤ්ඤ මහා නිකාය යන තුන ප්‍රධාන නිකාය වශයෙන් ද, වංශිකාදි වශයෙන් වෙන්කර කඩාගත් කොටස් ශාඛා නිකාය වශයෙන් ද ආණ්ඩුව පිළිගෙන තීරණය කොට තිබේ. ඒ අනුව ශ්‍රී ඤාණවිමලතිස්ස මහානායක ආදී කර්තෘන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරෙන් යථෝක්ත අප නිකායෙහි මහානායක පදවි අනුපිළිවෙළින් ලබා තිබේ. එම නිසා කඩා වෙන්කර ගත් නිකාය නොවන හෙයින් **අමරපුර මහා නිකාය** නමින් අද දක්වාත් පවත්වා ගෙන යනු ලැබේ.

සමස්ත අමරපුර මහා නිකාය විසින් භාවිත කළ නිල ලාංඡනය අමරපුර අඹගහපිටිය අප පාර්ශ්වය ද භාවිත කළ අතර පාර්ශ්වය සඳහා නිල ලාංඡනයක් නොතිබුණි. ඒ අනුව තල්ගහවෙල සුමේධ හිමියන් විසින් 2021 ඔක්තෝබර් මස 08 වන දින නිල ලාංඡනයක් නිර්මාණය කරන ලද අතර 2021 ඔක්තෝබර් 19 වන දින  කොළඹ දී පැවති කාරක සංඝසභාව වෙත මාදම්පාගම අස්සජී තිස්ස අනුනායක ස්වාමීන් වහන්සේ එය යොමු කොට එතැන් පටන් එය අප නිකායයේ නිල ලාංඡනය ලෙස භාවිත කිරීමට සම්මත කර ගත්තේය.

වර්ෂ 1802 මහාධම්මරට්ඨ රාජාධිරාජගුරු වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ පටන් වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය කේන්ද්‍රකරගනිමින් අඛණ්ඩව පැවැති උන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය

පරපුර සිරි අරියවංශාලංකාර අතිපූජ්‍ය බලපිටියේ සීලරතන තිස්ස මහානායක ස්වාමීන් වහන්සේ 1924 වර්ෂයේ අපවත් වීමෙන් දෙකොටසකට බෙදුණු පසුව එක් පාර්ශ්වයක් අමරපුර මහා නිකාය නමින් වැලිතර අම්බරුක්ඛාරාමය මූල මහා විහාරය කේන්ද්‍ර කරගනිමින් තොටගමුවේ සිරි පඤ්ඤාමෝලි තිස්ස හිමියන් යටතේ ද අනෙක් කොටස මූලවංශික මහා නිකාය නමින් වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය ම කේන්ද්‍ර කරගනිමින් අහුන්ගල්ලේ විමලතිස්ස හිමියන් යටතේ ද කටයුතු කරනු ලැබිණ. අතිගෞරවාර්හ බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මාහිමියන් වහන්සේගේ සමයේ පටන් අනුනායක තනතුරු පත්කිරීම පිළිබඳ තොරතුරු ලැබෙන අතර එතැන් පටන් වර්තමානය දක්වා අමරපුර මහා නිකායයේ අනුනායක ධූරාවලියේ මහ තෙරවරුන් විසි දෙනමකි.

වර්ෂ 1802 දී වැලිතර මහකරාවේ ඤාණවිමල තිස්ස හිමියන් සිරිලකට වැඩමවා වැලිතර ශ්‍රී අම්බරුක්ඛාරාම මූල මහා විහාරය කේන්ද්‍ර කර ගනිමින් මෙරට ම්‍රම්ම වංශික භික්ෂු සංස්ථාව ප්‍රතිෂ්ඨාපනය කළ සේක. උන්වහන්සේගේ පටන් ම්‍රම්මවංශික අමරපුර මහා නිකායයේ ශ්‍රීමත් මහානායක පදවිය මහානායක මාහිමියන් වහන්සේලා සොළොස් නමක විසින් ශෝභමාන කරමින් පාලනය කර වදාළහ. ඒ

1. බෝධිසත්වගුණෝපේත මහාධම්ම රාජාධිරාජගුරු අතිගෞරවාර්හ වැලිතර මහකරාවේ ශ්‍රී ඤාණවිමල තිස්ස සංඝරාජයන් වහන්සේ (වර්ෂ 1802-1846)

2. සිරිපවර විනයාචරිය, ත්‍රිපිටක පර්යාප්තිධර පණ්ඩිතාචරිය, මහාධම්ම රාජාධිරාජගුරු ඤාණාභිවංස ධම්මසේනාපති, සංඝරාජ ගණාචරිය අතිගෞරවාර්හ බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1846-1868)
3. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර අතිගෞරවාර්හ මහකරාවේ ශ්‍රී විමලසාර තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1868-1888)
4. සිරි සද්ධම්ම ජෝතිපාල අතිගෞරවාර්හ රන්දොඹේ චන්දජෝති තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1888-1909)
5. අමරපුර ගණාචරිය අරියවංසාලංකාර, අතිගෞරවාර්හ මොරගල්ලේ බුද්ධසිරි තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1909-1915)
6. අමරපුර ගණපාමොක්ඛාචරිය සිරිපවර අරියවංසාලංකාර අතිගෞරවාර්හ බලපිටියේ සීලරතන තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1915-1924)
7. සිරි අරියවංසාලංකාර අතිගෞරවාර්හ අහුන්ගල්ලේ විමලධීර තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1924-1926)
8. අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි අතිගෞරවාර්හ තොටගමුවේ පඤ්ඤාමොලි තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1924-1943)
9. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර අතිගෞරවාර්හ උදම්මිට සිරි ධම්මරක්ඛිත තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1943-1971)

10. තෙපිටක පරියත්ති විසාරද, අග්ගමහා පණ්ඩිත අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර අතිගෞරවාර්හ වලගෙදර සෝමාලෝක තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1971-1974)
11. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර, සිරිසුගත සාසන කවිධජ විනයාචරිය අතිගෞරවාර්හ උදම්මිට ධම්මාලංකාර තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1974-1979)
12. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර, ඤාණවිමල වංශාලංකාර, රාජකීය පණ්ඩිත අතිගෞරවාර්හ බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1974-2003)
13. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර, සද්ධම්මවාගීශ්වරාචරිය ධර්මකීර්ති ශ්‍රී අතිගෞරවාර්හ හීනටියන ධම්මාලෝක තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1979-1981)
14. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර, ශ්‍රී විමලධම්ම අතිගෞරවාර්හ කටුවැල්ලේගම අමරසිරි තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 1981-2005)
15. අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර, මහාමහෝපාධ්‍යාය අතිගෞරවාර්හ හීනටියන නන්ද තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 2005-2024)
16. සද්ධර්මවාගීශ්වරාචාර්ය, අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර, ආචාර්ය අතිගෞරවාර්හ මාදම්පාගම

අස්සජී තිස්ස මාහිමියන් වහන්සේ (වර්ෂ 2024 ජූලි 23 දා සිට) යන මහානායක මාහිමියන් වහන්සේලායි.

නිකායට අයත්ව වර්තමානයේ පළාත් නවයෙහි ම විසිරී විහාරස්ථාන 170 ක් පමණ පවතියි. කාරක මහා සංඝ සභාව විසි නමකින් සැකසුණු විංශත්වර්ගික සභාවකි. වාර්ෂිකව තෝරගත් ස්ථානයක සියලු විහාරාධිපතීන් වහන්සේලාගේ මහා සභාව පැවැත්වෙයි.

*දෙවන පරිච්ඡේදය*

## මහානායක පදවිය හෙබවූ මහතෙරුන් වහන්සේලා

වර්ෂ 1802 දී වැලිතර ඤාණවිමලතිස්ස මාහිමියන්ගෙන් ආරම්භ වූ අමරපුර මහා නිකාය ලෙසින් ව්‍යවහාර කළ භික්ෂු පර්ශදය වර්තමානයේ අඹගහපිටිය පාර්ශ්වය නමින් ද හඳුන්වනු ලබයි. එම භික්ෂු සමූහයේ මහානායක පදවිය භික්ෂූන් වහන්සේලා දහහතර නමක් දරා ඇති අතර වර්තමාන මහානායක මාහිමියන් උසුලනුයේ පහළොස්වන මහානායක පදවියයි. එම මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා පිළිබඳ සංක්ෂිප්තව කරුණු ගෙන හැර දැක්වීම මෙම පරිච්ඡේදයේ දී සිදු කර ඇත.

මහානායක පදවිය ප්‍රදානය කිරීමේ දී ගෞරවෝපාධියක් ද සංඝසභාව විසින් ලබා දෙන අතර බොහෝ මහානායක හිමිවරුන්ට අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර යන ගෞරවෝපාධිය ලැබී ඇත. අමරපුර නිකායයේ සමාරම්භක සමයේ පටන් ම පැවතී ඇති මෙම ගෞරවෝපාධිය මහානායක පදවිය සඳහාම භාවිත කොට ඇත. අමරපුර නිකායික සංඝයාගේ ගණනායක මහ තෙරුන් බව එම ගෞරවෝපාධි නාමයෙන් අදහස් කරයි.

01 බෝධිසත්වගුණෝපලක්ෂිත මහාධම්ම රාජාධිරාජගුරු අතිගෞරවාර්හ වැලිතර

ඤාණවිමල තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ

(බු.ව. 2345-2378, ක්‍රි.ව.1802-1846)



**ජන්ම ලාභය සහ ප්‍රව්‍රජාව**

අපරදිග ජාතීන් පහත රට පුරා තම බලය පැතිර වීමේ දී පහත රට විසූ ප්‍රභූවරුන් සම්බුද්ධ ශාසනය සුරක්ෂා කිරීමේ පරම අභිලාශයෙන් කටයුතු කොට ඇත. ඒ අතර කැපී පෙනෙන ප්‍රභූවරයෙකු ලෙස වැලිතර සහබන්දු වලව්වේ මුදලිඳු ප්‍රකට විය. වර්තමාන අම්බරුක්ඛාරාම මූල මහා විහාරය පවතින භූමිය එතුමාගේ වලව්ව පිහිටා තිබුණු ස්ථානයයි. සිය වත්තේ කෙළවර කුඩා ආරාමයක් බුද්ධ වන්දනාව සඳහා තිබුණු අතර එහි කිරිඅප්පු නම් ගණින්නාන්සේ කෙනෙකු වැඩ සිටියේය. තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජයන් වහන්සේගේ නාමානුස්මරණය කොට ඉදි කළ එම කුඩා ආරාමය රාහුලාරාමය නම් විය. කිරි අප්පු තවත් තැනක පීරි අප්පු ලෙස ද හඳුන්වා ඇත. ගණින්නාන්සේගේ ජ්‍යෙෂ්ඨ සහෝදරයා දකුණු ලක එවකට සුප්‍රසිද්ධ ගම් පියසක් වූ මහාකරාවේ ආරච්චි පදවිය ඉසිලූ අච්චාහන්දි කරෝලිස් ද සිල්වා නම් වෛද්‍යාචාර්යවරයායි. එම උගත් ආරච්චි මහතාගේ සහ ඔහුගේ බිරිඳ වූ මදලේනා නම් උපාසිකාවට 1765 වර්ෂයේ පෙබරවාරි මස 10 වන බ්‍රහස්පතින්දා[3] පින්වත් දරු උපතක් සිදු වූ අතර එම දරුවාට අමෙන්දියස් කරෝලිස් ද සිල්වා ලෙසින් නම් තබනු ලැබීය. ඒ අප කතානායක රාජගුරු ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ උප්පත්ති මංගල්ලය සිදු වූ දිනයි. සහෝදරයන් සතර දෙනෙකු සහ සොහොයුරියන් දෙදෙනෙකු යුත් පවුලේ ජ්‍යෙෂ්ඨයා වූයේ පිනැති අමෙන්දියස් කුල කුමරායි. උපතින් සත්විය සපිරුණු පසු අමෙන්දියස් කුල කුමරුට දැනුම ලබාදීමේ අදහසින්

---

[3] අහුන්ගල්ලේ විමලනන්දි තිස්ස ස්ථවිර, **රාජගුරු ශ්‍රී ඤාණවිමල තිෂ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රාපදානය** (වැලිතර අම්බරුක්ඛාරාමයඃ සාම විනිසුරු ඇන්.ඇස්. ද ඇස්. වික්‍රමසිංහ මහතා, 1973), 02.

මවුපියන් විසින් අමෙන්දියස්ගේ බාප්පා වූ කිරි අප්පු ගණින්නාන්සේ වෙත යොමු කරන ලදී. මේ සමය මහනුවර රාජ්‍යපත් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය ලැබ වැලිවිට සරණංකර තෙරුන් සියම් උපසම්පදාව පිහිටුවා සසුන බබුළුවන සමයයි. එම සියම් උපසම්පදාව ලබාගත් දකුණේ මූලගිරි විහාරයෙහි වටරක්ගොඩ ධම්මපාල හිමියන්ට ශිෂ්‍යයින් දොළොස් දෙනෙකු විය. ඉන් දෙවැන්නා වූයේ නලගම විහාරයෙහි වැඩ සිටි නලගම මණිරතන තෙරුන් වහන්සේයි. උන්වහන්සේට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පස්නමක සිටි අතර ඉන් කනිෂ්ට ශිෂ්‍ය රත්නය වූයේ මාතර පෙතන්ගහවත්ත විහාරයේ වැඩ සිටි බෝවල ධම්මානන්ද හිමිපාණන්ය.[4] උන්වහන්සේ පහතරට සිට මහනුවර මල්වතු විහාරයට යන ගමනේ දී රාහුලාරාමයේ මදක් නැවතී විවේක ගැනීම පුරුද්දක් කොට ගෙන සිටියේය. ඒ අනුව කිරිඅප්පු ගණින්නාන්සේ වෙතින් ශාස්ත්‍ර හදාරන මෙම බුද්ධිමත් කුල කුමරු දුටු බෝවල ධම්මානන්ද හිමියන් දුටු සැනින්ම මේ මහාපිනැති දරුවෙකු බව දැන කිරි අප්පු ගණින්නාන්සේගෙන් ද විචාරා මවුපියන් ද ගෙන්වාගෙන පැවිද්ද සඳහා අවසරය ලබා අමෙන්දියස් කුල කුමරු මල්වතු මහා විහාරය වෙත ගෙන ගියේය. පැවිදිවීම සඳහා අවශ්‍ය මූලික බණ දහම් දින කිහිපයක් තුළ බෝවල ධම්මානන්ද හිමියන් ඇසුරෙන් උගත් කුඩා දරුවා මල්වතු මහා විහාරයේ දී ශුභ මොහොතින් සරණංකර සංඝරාජයන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකු

[4] වස්කඩුවේ සිරිරතන හිමි, "ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ ප්‍රභවය සහ එහි විකාශය", **ශ්‍රී මහා මහින්ද වෙසක් සමරු කලාපය,** (සංස්.) මොරකැලේ සෝභිත තිස්ස හිමි (නාත්තන්ඩියඃ මාවිල සුමනකුසුමාරාම පුරාණ විහාරයේ ප්‍රකාශනයකි, 2014), 03.

ලෙස ඤාණවිමල නාමයෙන් 1778 වසරේ දී උතුම් සාසන දායාදය ලද්දේය.

**ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය**

සත් හැවිරිදි වියේදී කිරිඅප්පු ගණින්නාන්සේ නම් සිය බාප්පා ඇසුරින් මූලික දැනුම ලබා ගත් අතර ඤාණවිමල ලෙසින් ප්‍රව්‍රජාවට පත්දා පටන් මල්වතු මහා විහාරයේ වැඩ හිඳිමින් පාලි, සංස්කෘත, සිංහල ආදී පෙරදිග භාෂා ශාස්ත්‍රයන් ද ධර්මය විනය ද මැනවින් උගත්තේ ය. සිය ආචාර්යන් වහන්සේලා වූ සංඝරාජයන් වහන්සේගේ ද බෝවල ධම්මානන්ද හිමියන්ගේ ද නිසි ගුරු ඇසුරින් තම දහම් දැනුම වර්ධනය කර ගැනීමට ඤාණවිමල සාමණේරයන් වහන්සේට හැකි විය. විශේෂයෙන් ධම්මානන්ද හිමියන් සමීපයෙහි දී සිංහල, පාලි භාෂා ශාස්ත්‍රය ප්‍රගුණ කොට ඇත. වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරයේ පොත්ගුලේ තැන්පත් කොට ඇති ඇතැම් පුස්කොල පොත් අග "ඤාණවිමල තැනට ලියවා දෙන ලදී." ලෙස සඳහන් කර ඇති සංඝරාජයන් වහන්සේ විසින් ලබා දුන් ධර්ම ග්‍රන්ථවලින් ඤාණවිමල සාමණේරයන් වහන්සේ සංඝරාජයාණන් වහන්සේගේ ද සිත් දිනාගෙන ඉගෙනුම ලද බව පෙනේ.

**උපසම්පදා ප්‍රතිලාභය**

පැවිදි වීමෙන් පසුව 1778 ජූලි 18 වනදා[5] සරණංකර සංඝරාජයන් වහන්සේ අපවත් වන අතර ඒ වන විට ඤාණවිමල සාමණේරයන් වහන්සේ උපතින් දහතුන්වන විය පසු කළා පමණි. ඇතැම් ග්‍රන්ථයක

---

[5] **සංඝරාජ සාධු චරියාව** (සංස්.), ඇල්. ගුණරත්න (කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ, 1969), 57.

ඤාණවිමල සාමණේරයන් වහන්සේ උපසම්පදාව ගෙන ඒම පිණිස වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ ද හසුන් ගෙන ගිය බව දක්වා ඇතත්[6] මූලාශ්‍රය පරිශීලනයේ දී එය බරපතල සාවද්‍ය ප්‍රකාශයක් බව සනාථ වේ. එය එසේවන්නට නම් වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ 1778 වසරේ අපවත්වීමට පෙර තවත් අවුරුදු 20 කින් උදාවන 1798 වසරේ උපසම්පදාව අපේක්ෂාවෙන් විදේශගතවන දහතුන් හැවිරිදි ඤාණවිමල සාමණේරයන්ට දූත සන්දේශ පෙර තියාම ලබා දී අපවත් වී ඇත. එම නිසා එම සාවද්‍ය ප්‍රකාශය මෙහිදී බැහැර කළ යුතුය.

වසර තිස්තුනක් වන විටත් ඤාණවිමල හිමියන් සාමණේර බවින්ම සිටියේය. නිසි වයසේ දී උගත යුතු බණ දහම් මැනවින් හදාරා තිබුණත් උන්වහන්සේට උපසම්පදාව ලැබීමේ බාධක රැසක් තිබුණි. මේ කාලය වන විට මල්වතු මහා විහාරයේ සිට ආපසු අඹගහපිටි මහා විහාරයට වැඩමවා පළාත්වාසීන්ට සදහම් බෙදමින් බුද්ධ වචනයට අනුවම ධර්ම චාරිකාවේ යෙදුණාහ. බාධක පසෙකලා තමන්වහන්සේම සියම් රටට ගොස් උපසම්පදා වී පැමිණීමට අධිෂ්ඨාන කරගත්තේය. ඒ අනුව එවකට පහතරට ප්‍රභූ දායක පවුලක සාමාජිකයන් වූ හල්පෝති දිනෙස් ද සොයිසා විජය ශ්‍රීවර්ධන ජයතිලක රාජපක්ෂ සහබන්ධු මුදලි සහ හල්පෝති රපියෙල් ද සොයිසා විජය ශ්‍රීවර්ධන ජයතිලක රාජපක්ෂ සහබන්ධු මුදලි යන අය විදේශ ගමනට අවශ්‍ය සියලු පහසුකම් සපයා දෙන ලදී. ඒ අනුව මාදම්පේ උත්තමධීර, කොස්ගොඩ විපුලතිස්ස, බ්‍රාහ්මණවත්තේ

---

[6] විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද හිමි, "අමරපුර මහානිකායේ ආරම්භය හා විකාශය පිළිබඳ විමසුමක්", **අමරපුර ධර්මශාස්ත්‍රීය සංග්‍රහය,** ත්‍රිපිටකවේදී තපෝවනයේ දමිත හිමි ඇතුළු අය (කොළඹ: බුද්ධශාසන අමාත්‍යාංශය, 2017), 04.

ජිනපාල, බෝගහවත්තේ ජිනජයතු, වතුරේගම ධම්මාධාර යන පස්නමත් කැපකරු දායකයින් තුන් දෙනෙකුත් සමඟ ගාලු වරායෙන් රුවල් නැවක නැඟී මෙරටින් සියම බලා පිටත්වන ලදී. එහෙත් අතරමගදී මහා කුණාටුවක් ඇති වූයෙන් නැවේ ගිය අනෙක් පිරිස මේ භික්ෂු කණ්ඩායම සහිත දූත පිරිස සාගරයට තල්ලු කර දැමීමට සාකච්ඡා කළහ. මේ බව වැටහුනු අප කතානායකයාණෝ

**"මෙකුලෙන් උතුම් දෙවියනි කතරගම වැඩි**

**කකුලෙන් නොයන ගමනකි හිතට දුක් වැඩි**

**උතුරෙන් අපට දෙන දානයකි ඒ පඩි**

**දකුණෙන් එවන් සුළඟක් මාරියා පොඩි "**[7]

සෙත් කවියක් කියූහ. එසැණින් කුණාටුව පහව මෙම දූත පිරිස ඒ ආසන්නයේ ථේරවාදී බෞද්ධ රටක් වන අමරපුර දේශයට සම්ප්‍රාප්තව වදාළහ. ඒ ශ්‍රී බුද්ධ වර්ෂ 2344 වැනි වෙසක් පුන් පෝ දායි. එම අමරපුර රාජධානියෙහි මහරජ වූ ශ්වේතහස්ති ස්වාමි වූ පණ්ඩිත මහා ධම්ම රාජාධිරාජ මහාරජාණෝ මේ සිංහල දූත පිරිස ගෞරවයෙන් පිළිගත්හ. පැමිණි කාරණා විමසා රාජානුශාසනයේ නියුතු විනය විශාරද ඤාණාභිවංස ධම්ම සේනාපති සංඝරාජයන් වහන්සේ වෙත යොමු කරන ලදුව උන්වහන්සේගේ විහාරයේ කලක් ධර්ම විනය හදාරමින් කටයුතු සිදු කොට ඇත.

---

[7] අහුන්ගල්ලේ විමලනන්දි තිස්ස ස්ථවිර, **රාජගුරු ශ්‍රී ඤාණවිමල තිෂ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රාපදානය** (වැලිතර අම්බරුක්ඛාරාමයඃ සාම විනිසුරු ඇන්.ඇස්. ද ඇස්. වික්‍රමසිංහ මහතා, 1973), 05.

වස් කාලය එළඹුණු අතර එම ඇසල පොහෝදා ලක්දිව සාමණේරයන් නැවත පැවිදි කොට වස්තුන් මාසයක කාලය පුරාවට වතාවත් පුහුණු කරන ලදී. පසුව ලක්දිව භික්ෂූන් වහන්සේලාගේ උපසම්පදා මංගල්‍යය සිදු වූ ආකාරය මෙසේය.

"ඥාණවිමල ප්‍රමුඛ හෙරණුන්ට උපසම්පදාව දෙන්ට සුදුසු කාලයයි මහ රජතුමාට දැන්වූහ. නරපති තෙම අති ප්‍රසන්නව සිය ධනයෙන්ම අගනා පරිස්කාර පිළියෙළ කොට සාමණේරයන් රජ මැදුරට වැඩම කරවා ගිහිලිංග ගන්වා සරසවන්ට පටන් ගති. ස්වර්ණ විචිත්රිත රාජ වස්ත්‍රයක්ද නන් මිණියෙන් අලංකෘත සැට්ටියක්ද ආදී ඥාණවිමල හිමියන් පැළඳ විය. රජුන්ට සුදුසු ඇත් දතින් හෙම් රන් සිවිකාවෙක්හි වඩා හිඳුවා මිණි රන්මුවා ඡත්‍ර දෙකක් ද හිස මතුවෙහි ඇත්දත් මුක්තාමාණික්‍යයෙන් සරසන ලද හුණ ඡත්‍රයක් ද රාජ සම්මානය සඳහා යොදන බුරුම භාෂාවෙන් " ක්‍ර්‍යං " නම් රාජ භාණ්ඩය මොනවට දිගු කිරීමෙන් ඔසවා මෙසේ නන් අයුරින් ළහිරු මෙන් හොබවී. මහා භාග්‍ය සම්පන්න බුද්ධ පුත්‍ර තෙම ශක්‍රදේවෙන්ද්‍රශ්‍රීය ඉසිලීය. සෙස්සන් ද සුදුසු පරිදි සරසා එක් එක් සිවිකාවෙක්හි හිඳුවා, නොයෙක් දෙස්හි භාවිත ගීත නෘත්‍යයෙන් ද තූර්ය විශෙෂයෙන්ද මත ජනකායෙන්ද, සෙන්පතීන්ගෙන්ද රාජ පරිවාරයෙන්ද, යුත් ආශ්චර්යවත් පෙළහර හසරුවා පණස් රියන පමණ උස් ස්වර්ණාලික මංගල ජනාගාරනම් තෙමහල් රාජ ගෘහයට පමුණුවා, අග මෙහෙසිය ප්‍රධාන රාජ ස්ත්‍රීන් විසින් පිරිවරණ ලද රාජෝත්තම තෙම ඔවුනට සංග්‍රහ කොට සර්වඥ බොධිය පතමින් ඡද්දන්ත හස්තියෙකුගේ සොඬකට සමාන රන් කෙන්ඩියෙන්ද දක්ෂිණෝදකය වත් කෙළේය. පැළ උතුරු දෙක්හි පිහිටි ස්වර්ණ විචිත්‍රයෙන් විනිකෘත සුධර්මා නම් දිවස සභාව පරයන තරම් තෙමහල් මහා සාලාවට වැඩම කරවා නරපති තෙම '' ස්වාමීන් වහන්ස, මේ බුද්ධ පුත්‍රයන්ට

අනුකම්පා පිණිස උත්තම ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදාව දෙවා වදාරණ සේක්වා" යි සංඝරාජයන් වහන්සේට භාර කෙළේය." [8]

ඒ අනුව බුරුම රට අමරපුරයේ ස්වර්ණ ගුහා නම් බද්ධ සීමාවේ දී බුදු පිරිනිවනින් දෙදහස් තෙසිය පන්සාලිස් වන වස ඉල් මස ශක්ල පක්ෂයේ තුදුස්වක් දින දහවල ඥාණාභිවංස ධම්ම සේනාපති සංඝරාජයන් වහන්සේ උපාධ්‍යාය කොට උත්තරදෙවියාරාමාධිවාසී ස්ථවිර, ප්‍රසාදවිහාරවාසී ස්ථවිර, ස්වණණලේඛාගාරාධිවාසී ස්ථවිර යන තෙරුන් වහන්සේලා කර්මාචාර්යන් වහන්සේලා කොට ඥාණවිමල සාමණේරයන්ගේ උපසම්පදා මංගල්ලය වූහ.

**ශාසන ශාස්ත්‍රීය සේවය**

ක්‍රිස්තු පූර්ව සමයේ දේවානම්පියතිස්ස රජ දවස අශෝක අධිරාජ්‍ය පුත් මහා මිහිඳු තෙරුන් ලංකාවට බුදු සසුන ගෙනවුත් කුල භේදයකින් තොරව සියලු ජනතාවට ධාර්මිකව දිවි ගෙවිය හැකි සේ බුදු දහම ජනසතු කළේය. ඒ මිහින්තලාව කේන්ද්‍ර කර ගනිමිනි. අප කතානායකවර ඥාණවිමල තිස්ස මහෝත්තමයන් වහන්සේ ද අමරපුර දේශයෙන් තමා ලත් උපසම්පදාව කරණ කොටගෙන නැවත වරක් ලක්දිව බුද්ධ ශාසනය ජනසතු කළේය. එහෙයින් වැලිතර ඥාණවිමලතිස්ස මා හිමිපාණෝ දෙවැනි මිහිඳු යයි විරුදාවලී ලදහ. උන්වහන්සේ එකී උදාරතර කාර්යය වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කළ නිසා එම වෙහෙර දෙවැනි මිහින්තලාව යන අන්වර්ථ නාමය ලද්දේය. බුරුම

---

[8] අහුන්ගල්ලේ විමලනන්දි තිස්ස ස්ථවිර, **රාජගුරු ශ්‍රී ඥාණවිමල තිෂ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රාපදානය** (වැලිතර අම්බරුක්ඛාරාමයඃ සාම විනිසුරු ඇන්.ඇස්. ද ඇස්. වික්‍රමසිංහ මහතා, 1973), 05.

උපසම්පදාව ලබා වර්ෂ 1802 මාර්තු මස කොළඹ වරායෙන් ලක්දිවට වැඩම කොට අමරපුර උපසම්පදාව මෙරට සංඝයාට දායාද කොට අමරපුර භික්ෂු වංශය ස්ථාපනය කිරීම උන්වහන්සේගේ ප්‍රමුඛතම ශාසනික සේවාවයි. රාජ්‍ය අනුග්‍රහයක්වත් නොලබා තමන්ගේ දිවි පරදුවට තබා මරණය ද පෙනි පෙනී උපසම්පදාව පිහිටුවීම සඳහා උන්වහන්සේ කළ මෙහෙවර ශ්‍රී ලංකා සම්බුද්ධ ශාසන ඉතිහාස කතාවේ අනුස්මරණීය ලෙස සටහන්ව ඇත. ඤාණවිමල තිස්ස මාහිමියන් ලක්දිවට වැඩම වන විට උන්වහන්සේ සමඟ බුරුමවැසි අග්ගසාර නම් මහ තෙර නමක් ද වැඩම කොට ඇත. ලක්දිව පළමු අමරපුර උපසම්පදාව 1803 වසරේ මැයි මස 15 වනදා මාදුගඟ උදකුක්ඛේප සීමාවේ සිදු කරන්නේ එම අග්ගසාර තෙරුන්ගේ උපාධ්‍යායත්වයෙනි. සාමණේර අවධියේ දී මල්වතු මහා විහාරයෙන් ද බුරුමයට වැඩම කළ අවස්ථාවේ දී එම රටෙන් ද ලබාගත් ධර්ම විනය ශික්ෂාව අනාගතයේ බොහෝ පිරිසකට බෙදා දීමේ සත්ක්‍රියාව වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය කේන්ද්‍ර කරගනිමින් ඇරඹුමට ඤාණවිමල තිස්ස මාහිමියෝ කටයුතු කළහ. උපසම්පදාව ලබා ලංකාවට පැමිණීමේ දී එරට රජු විසින් රාජගුරු ධුරය පිරිනමා සන්නස් පත්‍ර පූජා කිරීමෙන් ඤාණවිමල තිස්ස මාහිමියන්ව ගෞරව සම්මානයට පාත්‍ර කර ඇත.

ශිෂ්‍ය පිරිස

- බේරතුඩුව ධම්මාධාර තිස්ස හිමි (පසුව මහානායක)
- කිරිමැටියානේ සුධම්මවංසාරාමාධිපති ගල්පොත්තේවෙල රේවත තිස්ස මාහිමි

- වස්කඩුවේ බෙත්තාරාමාධිපති වැල්ලබඩ ධීරක්ඛන්ධ තිස්ස මාහිමි
- කලුවාමෝදර පුඤ්ඤාසාර තිස්ස මාහිමි
- මාතර සරණපාල තිස්ස මාහිමි

***අමරපුර රාජ්‍යයෙන් උපසම්පදාව ලැබ නැවත ලංකාවට වඩින ප්‍රස්ථාවයේදී ශ්‍රී ඤාණවිමලතිස්ස මහානායක මාහිමියන් වහන්සේට හා කැටුව යන පිරිසට ඇතිවිය යුතු ගමන් පහසුව ආදිය සඳහා බුරුම රජ්ජුරුවන් වහන්සේගේ නියෝගය පරිදි දෙවා වදාරන සන්නස් පත්‍රයයි :***

***එම සන්නස් පත්‍රය රජ්ජුරුවන් වහන්සේගේ නියමය පරිදිය***

*පේගු රාජ්‍යයට අයත් හන්සවතිය සම්බන්ධ පළාත් 32 කරවන යුවරාජ යන් හා සෙසු නිලධාරි සහකාරයන් වන අප එනම් මියොන් මැන් මැන් ලා නෝර්තා සහ රේවුම් මැන් මැන් සුරා භක්ටියෝ සහ ආණ්ඩුව සෑදෙන අනික් සියලු දෙනාත් මහවාසල නියමය පරිදි වරාය සහිත රන්ගුන් නගර යෙහිදී මහා මන්ත්‍රී සභාවෙහි රැස්ව මෙහි වෙළඳාම සඳහා පැමිණෙන සකල විදේශීය ජාතීන්ට හා පුද්ගලයන්ට වෙන වෙනම ද කැටි කැටිවද අපට කළහැකි යහපත සලසාලීම සඳහාය. සියලු දෙනා මෙයින් දත යුතුය.*

*මහා නෞකා සමූහ වල පතීහු ද, කුඩා නැව් කණ්ඩායම් වල ප්‍රධානීහුද, ඔරු යාත්‍රා ආදියෙහි මුලාකාරයෝ ද, යනාදී මෙකී සියල්ලෝම කවර දේශ වලට අයත්හු වූවත් මෙය රැගෙන යන පිරිසට ගමන් පහසුව හා නිදහස දෙත්වා යනු යාච්ඤා කරණ බවය. '' කේද්‍රි '' නම් මේ යාත්‍රා නැවෙහි කුඹ දෙකකි. බර ටොන් 250 ක් පමණය. දිග අඩි 65 කි. උස අඩි 14 කි. පළල අඩි 24කි. බබා කුට්ටි නම් කෙනෙකුට අයිතිය. පෙරියකම්බි නම් අය*

නියම වූ පුරුෂයාය. රැන්ගුන් වරායේ සිට ඉන්දියාවේ වරාය වලට හා කොරමැන්ඩල් වෙරළෙහිද යාත්‍රා කෙරේ.

මෙහි පටවා තිබෙන්නේ හා පටවනු ලබන්නේ ලී කඳන්, ලෑලි, ඉටි වර්ග, ඇත් දත් බඩු, කර්දමුංගු, අශ්වයෝ .... අපේ රාජකීය කොඩිය සහිතව විවිධ ජාතීන්ට අයත් 50 දෙනෙකුන් පමණ ප්‍රාණීන් ඇතිව ස්වකීය ප්‍රවේසම සඳහා වුවමනා ගල්වෙඩි තුවක්කු උණ්ඩ ආදිය සහිතය. මෙය නැවතත් රැන්ගුමට පෙරලා එන ගමනේදී හෝ අසනීපයක්, අවාසනාවක්, හදිස්සි අනතුරක් නියම වූ පුරුෂයාට හෝ වී නම් ඒ වෙනුවට කෙනෙක් වැඩ බලන්ට පකොට තිබෙනවත් හැර මේ යාත්‍රා නෞකාවට නිදහස්ව යන්ට එන්ට වුවමනා බලය නොඌනව පැවතිය යුතු යයි අපේ කැමැත්තයි.

ඒ හැරත් මහාරාජ නියෝගය පරිදි මෙහි ගමන් කරන්ට සලස්වන ලද ලාංකික රාජගුරු නායක ස්වාමීන් වහන්සේද, ඊට තත්වයෙන් අඩු පස් නමක්ද, විද්‍යා සෙවියෙක්ද, සේවකයන් 12 ක්ද, යන මේ සෑම දෙන මදුරාසි යට එක්ව ගොස් ඉන්පසු ලංකාද්වීපයේ වරායට හා නගරයට වඩමවා එහිදී අපේ ශුද්ධ වූ ආගම හා රාජකීය ශුද්ධ පොත් පැතිරීමද බෝ කිරීමද සඳහාය.

තවද සමුද්‍රාසන්න ප්‍රදේශ ගත නගර හා වරාය වල අධිපතීන්ද, ආණ්ඩු කාරයන්ද, මොවුන්ට කිසි බාධාවක් ප්‍රමාදයක් නොකළ යුතු බවද වැඩි දුරටත් මහ රජ්ජුරුවන් වහන්සේ සලකා ආධාරොපකාර කළ යුතු සේද මෙබඳු වෙන අවස්ථාවලදී අපෙනුත් මෙසේම නො කෙරී නොහැරෙණ බව ද යනුය.

මෙසේ මහ රජ්ජුරුවන් වහන්සේ ගේ නියමය පරිදි ලියා මුද්‍රා තබා දෙන ලද්දේ වර්ෂ 1802 ක් වූ ජනවාරි මස 31 වන දින රැන්ගුමේ දීය.

මියොන් මැන් මැන් ලා නෝර්තා

**අපවත් වීම**


බුරුම රට මහරජුගෙන් සහ කාම්බෝජ, ඇසෑමය ආදී රටවල රජවරුන්ගෙන් රාජ ප්‍රසාදය ලැබ මෙරට ඉංග්‍රීසි ආණ්ඩුවෙන් ද අමරපුර සංඝරාජත්වය පිරිනමනු ලැබ මහත් ශාසනෝන්නතික ක්‍රියාදාමයක් ගෙන ගිය රාජගුරු වැලිතර ඤාණවිමල තිස්ස මහානාහිමි වැලිතර ශ්‍රී පුෂ්පාරාම නම් යුත් නායක විහාරයේ දී ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2378 ක් වූ ඇසල මස පෙර දියවක් ලත් කුජ දින (1846 ජූලි 02) මනා සිහි නුවණින් යුක්තව ස්වර්ගස්ථව වදාළ සේක. දින කිහිපයක් මුළුල්ලේ මහජනතාවගේ ද ඉංග්‍රීසි රාජාණ්ඩුවේ ද පූජෝපහාරයට ලක්ව ගරු ගාම්භීර පූර්වකව ආදාහන පුණ්‍ය මහෝත්සවය සිද්ධ කරන ලදී. අවසන ශාරීරික භෂ්මයන් කරඬුවක බහා සෑයක් බන්දවා ගෞරවෝපහාර දක්වන ලදී.

මාතර සරණපාල නම් ශිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ මහානායකයන් වහන්සේගේ අපවත් වීම පිළිබඳ මෙසේ දක්වා ඇත.

"ස ක වසින් එක් දහස් සත්සිය පණසක් අවුරුදු පිරුණ ක ල
ව ක ද පුර දියවකත් පුස කුජ උදය තුන් පෑ රාසියක් ක ළ
එ ක ල දිවයුරු මිතුන රැස වැස සවිසි දවසක් පමණ ගත ක ල
මෙ ක ල නායක ඤාණවිමල බිදාන රජගුරු මොක් දසන ක ළ "[9]

[9] අහුන්ගල්ලේ විමලනන්දි තිස්ස ස්ථවිර, **රාජගුරු ශ්‍රී ඤාණවිමල තිෂ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රාපදානය** (වැලිතර අම්බරුක්ඛාරාමය: සාම විනිසුරු ඇන්.ඇස්. ද ඇස්. වික්‍රමසිංහ මහතා, 1973), 11.

02 සිරිපවර අරියවංසාලංකාර විනයාචරිය පණ්ඩිත අතිගෞරවාර්හ බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2378-2410, ක්‍රි.ව.1846-1868)



**ආචාර්ය පරපුර**

වැලිතර අම්බරුක්ඛාරාමාසන්නයේ සුප්‍රකට පැරණි ග්‍රාමයක් වන බේරතුඩුව ජාතභූමිය කොට ගෙන සම්භාවනීය පවුලක ජන්ම ලාභය ලබා ශ්‍රී ලංකා ද්වීපයේ මුම්මවංශ අමරපුර නිකාය පිහිටුවා වදාළ වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරාධිපති රාජගුරු වැලිතර ඤාණවිමලතිස්ස මාහිමිපාණන් වහන්සේ වෙතින් ප්‍රව්‍රජෝපසම්පදාව ලත් බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මාහිමිපාණෝ තත් ඤාණවිමල තිස්ස අමරපුර සංඝරාජයන් වහන්සේගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතරින් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නයයි.[10] පැවිදි උපසම්පදාව ලබා වැලිතර අම්බරුක්ඛාරාමයේ දී ම ඤාණවිමල තිස්ස මහතෙරුන් සමීපයේ සිය ධර්ම ඥානයත් භාෂා ඥානයත් වර්ධනය කොටගත් උන්වහන්සේ ධර්මධර විනයධර තෙරනමක ලෙස තත්කාලීන ගිහි පැවිදි කා අතරත් සම්භාවනීයත්වයට පත්ව සිටින්නට ඇත. වර්ෂ 1846 ජූලි 02 වනදා වැලිතර ඤාණවිමලතිස්ස මා හිමියන් අපවත් වූයෙන් හිස් වූ අමරපුර ගණනායක පදවියට බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමියන් පත්කරගන්නේ ද ඒ අනුව බව පෙනේ. කෙසේ නමුත් ධම්මාධාර තිස්ස නාහිමියන් **සිරිපවර පණ්ඩිත මහා ධම්ම රාජාධි රාජගුරු ඤාණාභිවංස ධම්මසේනාපති සංඝරාජ ගණාචරිය** යන ගෞරව අභිධානයෙන් හඳුන්වා ඇත.[11] බොහෝ විට

---

[10] මොරගල්ලේ ඤාණෝභාස තිස්ස හිමි, **සිරි බුද්ධසිරි තිස්ස ථේර චරිතය** (මොරගල්ල: කේ.ඒ.ඩී. සිල්වා කුලතිලක ප්‍රකාශනයක්, 1923), XIV.

[11] 1978 දෙසැම්බර් 19 වනදා මාවිල සුමනකුසුමාරාමාධිපති බිංගිරියේ සාසනරත තිස්ස හිමියන්ට හලාවත පළාතේ සංඝනායක පදවිය පිරිනැමීම වෙනුවෙන් කිරිමැටියානේ සුධම්මවංසාරාමස්ථ සංඝසභාවෙන් නිකුත් කළ ශ්‍රී සන්නස් පත්‍රය

මෙම ගෞරවෝපාධිය අමරපුර සංඝයාගේ මහ පදවියට පත් කරගැනීමේ දී ලබා දුන් එකක් බව සිතිය හැකිය.

## ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා

- සද්ධම්මජෝතිපාල ගණාචරිය කහවේ ශ්‍රී ඤාණානන්ද තිස්ස
- උදම්මිට ශ්‍රී උත්තමාරාම පුරාණ විහාරාධිපති පූජ්‍ය මීගමුවේ සංඝතිස්ස හිමි (මහකරාවේ ශ්‍රී විමලසාර තිස්ස මහානායක මහානාහිමි, කහවේ ඤාණානන්ද තිස්ස හිමි යන අයගේ ද ශිෂ්‍යයෙකි. බොහෝ විට පැවිද්දේ දී බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහානාහිමියන්ගේ සිසුවෙක් වූවා විය හැකිය.)
- වැලිතර පුෂ්පාරාමාධිපති රන්දොඹේ පදුමාරාම තිස්ස හිමි (අමරපුර චූලගණ්ඨි නිකාය 1886 පෙබරවාරි මස 25 වනදා ආරම්භ කළේ මුන්වහන්සේගේ ද ශිෂ්‍ය වැලිතර ඤාණතිලක තිස්ස මාහිමියන් වේ)[12]

## අධිපතීත්වය දැරූ විහාරස්ථාන

- වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය (අම්බරුක්ඛාරාමය හා සම්බන්ධ තවත් ආරාමස්ථානවල අධිපතීත්වය දරා ඇතැයි සිතිය හැකි මුත් උන්වහන්සේ ගැන තොරතුරු සොයාගැනීමට ඇත්තේ අල්පයකි.)

---

12 කන්නදෙණියේ සුගතවංස අනුනාහිමි, "අමරපුර චූලගණ්ඨි නිකායයේ ආදිකර්තෘවරයාණෝ", **ශාසන ප්‍රභා (අමරපුර චූලගණ්ඨි නිකාය ශත වර්ෂ පූර්ණ ස්වර්ණ ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය),** (සංස්.) ගන්තුනේ අස්සජී හිමි සහ තවත් අය (අමරපුර චූලගණ්ඨි නිකායයීය කාරක සංඝ සභාවේ ප්‍රකාශනයකි, 1986), 02.

03 අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර අතිගෞරවාර්හ මහකරාවේ ශ්‍රී විමලසාර තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2410-2432,ක්‍රි.ව.1868-1888)



## ආචාර්ය පරපුර

වැලිතර අම්බරුක්ඛාරාමාසන්නයේම ප්‍රභූ පවුලක මහකරාවේ විමලසාර තිස්ස නාහිමිපාණන් උපත ලද්දේය. අමරපුර මහා නිකායයේ ආදිකර්තෘ මහාධම්ම රාජාධිරාජගුරු වැලිතර ඤාණවිමල තිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යවර අමරපුර මහා නිකායේ දෙවැනි මහානායක ධුරය හෙබවූ සිරි පවර විනයාචරිය බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහනාහිමියන්ගේ ප්‍රිය ශිෂ්‍ය සද්ධම්මජෝතිපාල ගණාචරිය කහවේ ශ්‍රී ඤාණානන්ද තිස්ස නා හිමියෝ මහකරාවේ විමලසාර තිස්ස හිමියන්ගේ ගුරුදේවයන් වහන්සේ වූහ.

වැලිතර අම්බරුක්ඛාරාමයේ බොහෝ උගතුන් මේ සමයේ බිහිවූ අතර තම ආචාර්ය ඤාණානන්ද තිස්ස හිමියන් ඇතුළු එම උගත් යතුවරුන්ගෙන් ශාසන ශික්ෂාව ලබා බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේ දී සුපාරිශුද්ධ උපසම්පදා ප්‍රතිලාභය ලද්දේය.

## ශාසන ශාස්ත්‍රීය සේවය

වැලිතර අම්බරුක්ඛාරාමාධිපතීන් වහන්සේ ලෙසත් අමරපුර මහානායක තෙරුන් වහන්සේ ලෙසත් නිරන්තරවම ආයතනයේ හා නිකායයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කර ඇති උන්වහන්සේ දිවයින පුරා වස් වසමින් ඒ ඒ ගම්වල කුලදරුවන් සසුන්ගත කරවා අමරපුර නිකාය දීප ව්‍යාප්ත කළහ. හලාවත, මිනුවන්ගොඩ, මීගමුව ආදී වැලිතරින් බොහෝ දුර ප්‍රදේශවල ද අමරපුර නිකාය ව්‍යාප්ත වන්නේ උන්වහන්සේගේ අප්‍රතිහත කැපවීම මතයි.

**ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා**

- වලාන සුමනාරාමාධිපති මහකරාවේ සුගතවංස තිස්ස හිමි
- ගල්වෙහෙර සුගතඤාණ තිස්ස හිමි
- උදම්මිට ශ්‍රී උත්තමාරාම පුරාණ විහාරාධිපති පූජ්‍ය මීගමුවේ සංඝතිස්ස හිමි (බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහානාහිමි, කහවේ ඤාණානන්ද තිස්ස හිමි යන අයගේ ද ශිෂ්‍යයෙකි.)
- රන්දොඹේ මහාචෛතිය විහාරාධිපති තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමි (පසුව මහානායක)
- කඩුපිටිමාදම්පා ශ්‍රී සුදර්ශනාරාම පුරාණ මූල මහා විහාරාධිපති අරියවංශාලංකාර විනයාචරිය නාරාවිල ගුණරතන තිස්ස හිමි
- පූජ්‍ය මීගමුවේ ආසභ තිස්ස හිමි
- උදම්මිට ධම්මරක්ඛිත තිස්ස හිමි(1943 වසරේ සිට මහානායක)

එමෙන්ම පැවිදි උපසපන් වන අමරපුර භික්ෂූන් වහන්සේලා සඳහා වැලිතර අම්බරුක්ඛාරාමය කේන්ද්‍ර කරගත් ශ්‍රී සුගත ශාසනෝදය නම් පරිවේණස්ථානය ආරම්භ කරන්නේ ද උන්වහන්සේයි. ඒ වර්ෂ 1856 අගෝස්තු 17 වනදායි.[13] වැලිතර ඤාණවිමලතිස්ස මහානාහිමියන් බුරුමයේ සිට මෙරටට වැඩම කොට මහණ උපසම්පදා වන අයට තමන්වහන්සේ බුරුමයෙන් සහ මල්වතු විහාරයෙන් ලත් දැනුම බෙදා දුන් අධ්‍යාපන ආයතනයක් මෙසේ

[13] අමරපුර මහා නිකායයේ 2023 වසරේ ආරාධනා ලේඛනය

සුගත ශාසනෝදය නමින් ආරම්භ කරන ලද බවද සිතිය හැකිය.[14] කෙසේ වෙතත් වැඩි කලක් නොගොස් මෙම පිරිවෙන් දිවයිනේ කීර්තිමත් මෙන්ම අමරපුර නිකායයේ ප්‍රධානතම අධ්‍යාපන ආයතනය ලෙස පැවතුණු බව සාධක ඇත. හලාවත මාදම්පේ වැනි බොහෝ දුර ප්‍රදේශයක සිටි නාරාවිල ගුණරතන මාහිමියන් ධර්මශික්ෂා ලැබීමට මෙම පිරිවනට පැමිණීමෙන්ම ඒ බව පෙනේ.[15]

කෙසේ නමුත් මහකරාවේ විමලසාර තිස්ස හිමියන් කුශාග්‍ර වියතෙකු බව ප්‍රකට වන්නේ උන්වහන්සේ ලියා ඇති සුප්‍රසිද්ධ මහාකාව්‍යාදී ග්‍රන්ථයන්ගෙනි.

**ශාස්ත්‍රීය සේවය**

- සාසනවංසදීප මහාකාව්‍යය
- සීමාලක්ඛණ දීපනී

මේ හැරුණු විට විමලසාර තිස්ස මාහිමියන් විසින් සංස්කරණය කළ නමුත් ප්‍රකාශයට පත් නොකළ සම්භාව්‍ය කෘති ගණනාවක අත් පිටපත් අම්බරුක්ඛාරාම මූල මහා විහාරයේ පුස්තකාලයේ තැම්පත්ව ඇත.[16] උන්වහන්සේ සතු වූ මෙම පාණ්ඩිත්‍යය නිසා ලක්දිව පමණකුදු නොව චීන, ජපන්, බුරුම,

---

[14] **අඹගහපිටි මූල මහා විහාර සමරු කලාපය,** අහුන්ගල්ලේ විමලජීව තිස්ස හිමි, අහුන්ගල්ලේ විමලධම්ම තිස්ස හිමි (අම්බරුක්ඛාරාම දායක සභාවේ ප්‍රකාශනයකි, 1990), 41.

[15] 1999 වසරේ මාර්තු 17 වනදා පුත්තලම මූදුකටුව ද සොයිසාරාමාධිපති යක්දෙස්සාවේ සිරිධම්ම තිස්ස හිමියන් වෙත අනුනායක පදවිය ප්‍රදානය කිරීමට වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරයෙන් නිකුත් කළ ශ්‍රී සන්නස් පත්‍රය

[16] මොරගල්ලේ ඤාණෝභාස තිස්ස හිමි, **සිරි බුද්ධසිරි තිස්ස ථේර චරිතය** (මොරගල්ලඃ කේ.ඡ්.ඩී. සිල්වා කුලතිලක ප්‍රකාශනයක්, 1923), XIV.

ඇමරිකා, ජර්මන්, එංගලන්ත වැනි රටවල ද කීර්ති රාවය ප්‍රකට විය. ඒ ඒ රටවල උගතුන් උන්වහන්සේ වෙතින් ශාස්ත්‍රීය ප්‍රශ්න විමසා එවන ලද ලිපින්ගෙන් ඒ බව අනාවරණය වෙයි.

මහෝදාර ශාසන සේවාවක් කළ උන්වහන්සේට බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහානාහිමියන්ගේ 1868 වසරේ දී පමණ සිදු වූ අපවත් වීමෙන් පසුව අමරපුර මහා සංඝයා ඒකරාශීව මහානායක පදවිය සමර්පණය කරන ලදී. ඒ අනුව **අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර** යන ගෞරවෝපාධිය උන්වහන්සේට ලැබුණි. වසර විස්සක කාලයක් මහානායක පදවියේ ක්‍රියා කළ උන්වහන්සේ වර්ෂ 1888 දී අගෝස්තු මස 06 වන බ්‍රහස්පතින්දා දින ජන්මාන්තරගතව වදාළහ. උන්වහන්සේගේ ප්‍රිය ශිෂ්‍ය උදම්මිට උත්තමාරාම පුරාණ විහාරාධිපති මීගමුවේ සංඝතිස්ස හිමියන් විසින් තම ගුරුදේවයන්ගේ අපවත්වීම සඳහන් කර ඇත්තේ

**නයනරාමසමුද්දපදෙ ජිනෙ - අතිම්රෙ තිරීයං සහි ඡට්ඨීයං**

**විබුධමන්තිදිනෙ පන සාවනෙ - උපගතො තිදිවං ගුණසාගරො**

**ගුණයන්ට සාගරය වැනි වූ ඒ නායක ස්ථවිරයන් වහන්සේ දෙදහස් සාරසිය දෙතිස්වන බුද්ධ පරිනිර්වාණය වර්ෂයෙහි නිකිනි මස පුර පක්ෂයෙහි සැටවක් ලද ගුරු දිනයෙහි දෙව්ලොව වැඩ වදාළ සේක.** [17]

---

[17] මීගමුවේ සිරි සංඝතිස්ස මහා ස්ථවිර, **විමලසාර නායකත්ථෙර චරිතං.** (පැලියගොඩ: සත්‍යසමුච්චය මුද්‍රණාලය, ශ්‍රී.බු.ව.2470) 42.

යනුවෙනි. උන්වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳ ආදාහන කටයුතු අම්බරුක්ඛාරාමයට නුදුරු සැරසුම්පොළ නම් ස්ථානයේ සිදුකොට ඇත. පසුව ශේෂ වූ ශාරීරික අවශේෂ කරඬුවක බහා මහත් පෙරහැරින් අම්බරුක්ඛාරාම මූල මහා විහාරයට වැඩමවා සෑයක් බැන්දවීය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය


සිරි සංඝතිස්ස මහා ස්ථවිර, මීගමුවේ. **විමලසාර නායකත්ථෙර චරිතං.** පෑලියගොඩ

04 සිරි සද්ධම්ම ජෝතිපාල අමරපුර නිඛිලගණාචරිය අතිගෞරවාර්හ රන්දොඹේ චන්දජෝති

තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2432-2451,ක්‍රි.ව.1888-1909)



ලක්දිව දකුණු පෙදෙසින් පහළව බුදු සසුන බැබල වූ තෙරුන් වහන්සේලා රැසකට ජන්මය සැලසූයේ රන්දොඹේ නම් ප්‍රකට ග්‍රාමයයි. අමරපුර මහා නිකායයේ සිව්වන මහානායක පදවිය ඉසිලූ චන්ද්‍රජෝති තිස්ස මාහිමියන්ට සෙවණ සැදූයේ ද එම රන්දොඹේ ග්‍රාමයම ය. එගම සත්පුරුෂ මව්පිය දෙපළකට දාව උපන් උන්වහන්සේ වැලිතර අම්බරුක්ඛාරාමය කේන්ද්‍ර කරගනිමින් ඇරඹුණු සඟ පරපුරේ පැවිදි බව ලබා බලපිටි මෝදර උදකුක්ඛේප සීමා මාලකයේ දී පාරිශුද්ධ වූ උපසම්පදා ප්‍රතිලාභයට පත්වෙයි. අම්බරුක්ඛාරාමාශ්‍රයෙන්ම සිය ධර්ම ඥානය වර්ධනය කරගත් උන්වහන්සේ වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරාසන්නයේ ම ඇති පාතේගම ශ්‍රී රාහුලාරාමයේ අධිපතීන් වහන්සේ ලෙස කටයුතු කර ඇත. 1888 වසරේ අගෝස්තු මස 06 වනදා අමරපුර මහා නිකායයේ තුන්වන මහානායක ස්වාමීන් වහන්සේ වූ මහකරාවේ විමලසාර තිස්ස හිමියන්ගේ අපවත් වීමෙන් පසු **සිරි සද්ධම්ම ජෝතිපාල** යන ගරුනම් ඇති අමරපුර මහා නිකායයේ ගරු කටයුතු සිව්වන මහානායක ධුරය දරමින් ලක්දිව සිව් කොණ සිටි අමරපුර සඟ රුවනේ ප්‍රධානත්වයට පත්වෙයි. 1909 වසරේ පමණ අපවත් වන තෙක්ම වසර විස්සකට අධික කාලයක් පුරා තම නායක පදවිය සම්බුද්ධ ශාසනයේ ද අමරපුර වංශයේ ද දියුණුවට යෙදවීමට උන්වහන්සේට හැකිවිය.

අධිපතීත්වය දැරූ විහාරස්ථාන

- පාතේගම ශ්‍රී රාහුලාරාමය

05 අමරපුර ගණාචරිය අතිගෞරවාර්හ මොරගල්ලේ බුද්ධසිරි තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2451-2462,ක්‍රි.ව.1909-1915)



## ජන්ම ලාභය සහ ප්‍රව්‍රජාව

තැනෙක කළුවාමෝදර බුද්ධසිරි තිස්ස නාමයෙන් ද තවත් තැනක මොරගල්ලේ බුද්ධසිරි තිස්ස යන නාමයෙන් ද හඳුන්වා ඇති අප බුද්ධසිරි තිස්ස මහානායක හිමිපාණන් වර්ෂ 1837 ඇසළ මස ශුක්ල පක්ෂයේ නවවකලත් සඳුදා දින දී සොයිසා මෛත්‍රී සෙබස්තියන් උපාසිකාවගේ කුසින් මොරගල්ලේ දී ජන්මය ලද්දේය. සත් වියට පැමිණි කළ අක්ෂරාභ්‍යාසය සඳහා පුරාකෘත පින් බෙලෙන් තම ගමේ විහාරයට යන කුල කුමරුවා අධිකතර ශ්‍රද්ධාවෙන් බුද්ධෝපස්ථාන සංඝෝපස්ථාන සිදුකරමින් කටයුතු කරයි. පසුව සංඝයාගේ ඇසුරේ සිට පැවිද්දට සිත් ඇතිව මේ කුල කුමරා ඒ බව සිය ඥාතීන්ට දැනුවත් කරයි. ඒ අනුව මව්පියන් විසින් එවකට ක්ෂේත්‍රාසන්න විහාරාධිපති වූ ධම්මානන්ද තිස්ස තෙරුන් බැහැදැක දරුවා පැවිදි කිරීමට භාර කරයි. ඒ අනුව පැවිද්ද සඳහා අවශ්‍ය කරන මූලික දැනුම උන්වහන්සේ ඇසුරෙන් ලැබුවේය. මේ වන විට දොළොස්වන වියට පැමිණ තිබූ කුලකුමරා පැවිදි කරන ලෙස මවුපියන් නැවත සමාරාධනා කළෙන් ධම්මානන්ද හිමියන් එවකට අමරපුර මහානායක පදවිය දැරූ බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමියන්ට මෙම කටයුත්ත සඳහා ඇරයුම් කරයි. ඒ අනුව බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමියන් විසින් පැවිදි කෘත්‍ය සඳහා එවන ලද්දේ තම ප්‍රියශිෂ්‍යවර කහවේ ඥාණානන්ද තිස්ස පණ්ඩිත හිමිපාණන් වහන්සේයි. උන්වහන්සේ විසින් මෙම දරුවා පැවිදි කොට බුද්ධසිරි යන නාමය තැබීය.

## ආචාර්ය පරපුර

ම්‍රම්මවංශික අමරපුර මහා නිකායයේ ආදිකර්තෘ රාජගුරු වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යවර බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහානාහිමියන් සහ ධම්මාධාර තිස්ස මහානාහිමියන්ගේ ශිෂ්‍ය කහවේ ඤාණානන්ද තිස්ස හිමියන් අප කතානායක මොරගල්ලේ බුද්ධසිරි තිස්ස හිමියන්ගේ ආචාර්යන් වහන්සේලායි. අමරපුර මහා නිකායයේ තෘතීය මහානායක පදවියට පත් මහකරාවේ විමලසාර තිස්ස මාහිමියන් අප බුද්ධසිරි තිස්ස හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ පැවිදි සොහොයුරායි.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය සහ උපසම්පදා ප්‍රතිලාභය

පැවිදි වීමෙන් අනතුරුව එවකට රටේම කීර්තිමත් පඬිවරයකු ලෙස නම් දරා සිටි තම ආචාර්ය කහවේ ඤාණානන්ද තිස්ස හිමිපාණන් සමීපයෙහිම ශාස්ත්‍රෝද්ග්‍රහණය කරයි. ත්‍රිපිටකය සහිත අටුවාව, භාෂා ඥානය, චාරිත්‍ර වාරිත්‍රයන් සහ නිකායික ඇවතුම් පැවතුම් පිළිබඳ දැනුම ලබමින් අම්බරුක්ඛාරාමයේ භික්ෂූන් වහන්සේලා අතර කැපීපෙනෙන අයෙකු විය. මේ වන විට විසි වයස් සපුරා සිටි හෙයින් බුද්ධසිරි හෙරණපාණන් උපසම්පදා කිරීමට නිසි සමය ඒ යැයි දැන ඤාණානන්ද තිස්ස හිමියන් ඒ බව ධම්මානන්ද හිමියන්ට දැන්වීය. ධම්මානන්ද හිමියෝ මව්පියන් ඇතුළු ඥාති හිතෛෂීන් දැනුවත් කොට මහත් උත්සවශ්‍රීයෙන් උපසම්පදා මංගල්‍යය සංවිධානය කරයි. ඒ අනුව කහවේ ඤාණානන්ද තිස්ස හිමිපාණන් ආචාර්යව බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේදී උපසම්පදාවෙහි පිහිටුවන ලදී. එතැන් පටන් බුද්ධ ශාසනයේ පරම

දායාදය ලත් උන්වහන්සේ බුද්ධ ශාසනය ආලෝකමත් කිරීමේ වැඩසටහන ආරම්භ කළේය.

## ශාසන ශාස්ත්‍රීය සේවය

සීමා සංකර වාදයේ දී විනයධර බහුශ්‍රැත මහා තෙර නමක ලෙස අති සම්භාවනාවට පත්ව සිටි මහාකරාවේ විමලසාර තිස්ස මහනාහිමියන්ගේ අනුශාසනා ලැබ උන්වහන්සේගේ මාර්ගයේ ගමන් කළ බුද්ධසිරි හිමිපාණන් වචනයෙන් පරිසමාප්ත අර්ථයෙන්ම සිල්වත් බෞද්ධ භික්ෂුවකි. වරෙක තම ජාත ග්‍රාමය වූ මොරගොල්ල ගමේ වස් සමාදන් වීමට ගිය උන්වහන්සේ ධර්මපරායණ නම් බෞද්ධ සමිතියක් ස්ථාපිත කොට ඒ හරහා බාලබෝධනී නම් පාසල ආරම්භ කරයි. වැලිතර ශ්‍රී අම්බරුක්ඛාරාම මූල මහා විහාරය මුල් කරගෙන ජිනවර ශාසනෝදය නම් භික්ෂු සභාවක් ද ජිනවර ශාසනෝදය නම් ගෘහස්ථ සභාවක් ද ආරම්භ කොට ඒ හරහා මහත් ලෝකාර්ථයක් සිදු කරයි. අමරපුර නිකායට වසර සියයක් පිරීමෙන්[18] මහා සංඝයා ද ගිහි ප්‍රභූන් ද ගෙන්වා අම්බරුක්ඛාරාමාධිපති වූ උන්වහන්සේ මහත් උත්සවයක් කොට ඇත. කෙසේමුත් උන්වහන්සේ මහනායක පදවියට පත්වන්නේ චන්ද්‍රජෝති තිස්ස මහානායක හිමියන්ගේ අපවත්වීමෙන් පසුව 1909 වසරේ පමණ වන නිසා චන්ද්‍රජෝති තිස්ස මාහිමියන් සමයේ අම්බරුක්ඛාරාමාධිපත්‍ය දරා ඇත්තේ ද බුද්ධසිරි තිස්ස හිමියන් බව පෙනේ. ඒ අනුව අමරපුර මහා නිකායයේ සිව්වන මහානායක හිමියන් වූ චන්ද්‍රජෝති තිස්ස හිමියන් අම්බරුක්ඛාරාමාධිපතීන් වහන්සේ ලෙස

---

[18] මෙය 1802 වසරේ ඤාණවිමලතිස්ස මහානාහිමියන් ලක්දිවට ගොඩ බට දින හෝ 1803 වසරේ පළමු උපසම්පදාව කළ දින අරමුණු කොට එම දෙවසරෙන් එකක පැවැත්වූ බව පෙනේ.

නොසිටි බව පැහැදිලි වේ. එම උත්සවය සඳහා බුරුම රටින් ද මහා තෙරුන් වහන්සේලා වැඩම කොට ඇත. අම්බරුක්ඛාරාමයේ දක්නට ඇති මහා විහාරය ඉදි කළේ එම උත්සවයට සමගාමීවම බුද්ධසිරි තිස්ස හිමියන්ගේ සංකල්පයකිනි. අමරපුර උපසම්පදාව ගෙන මෙරටට පළමුවරට වැඩම කළ ඤාණවිමල තිස්ස මහෝත්තමයාණන් වහන්සේට බුරුම රජු විසින් දුන් රාජකීය සන්දේශය බුරුම අකුරින් කිරිගරුඬ ඵලකයක කොටවා එය මහ ජනතාවට ප්‍රදර්ශනය පිණිස තබන්නේ ද උන්වහන්සේයි. ඒවන විට අමරපුර නිකායයේ නාමය විවිධ භික්ෂු කණ්ඩායම් විසින් ද දැරීමට උත්සහ කළ අතර අමරපුර නිකාය නම් අම්බරුක්ඛාරාම මූල මහා විහාරයේ සංඝ පර්ශදය බව ස්ඵුට කරලීමට උන්වහන්සේ එබඳු කටයුතු සිදුකර ඇත. වරෙක සුප්‍රසිද්ධ වජිරාරාමවාසී මහා තෙරුන් ශ්‍රී ලංකාවට වැඩම කළ විට බුරුම රාජ සන්දේශයේ පිටපතක් මුද්‍රණය කරවා උන්වහන්සේට දැක්වීය. මේ රාජ සංදේශය දැක උන් වහන්සේ මහත් ප්‍රසාදයටත් අම්බරුක්ඛාරාම නිවැසි සංඝයා පිළිබඳවත් ප්‍රසාදයට පත්ව බුහුමන් කළාහ. උගත් පඬිවරයෙකු වූ බුද්ධසිරි හිමිපාණන්

- සාමග්‍රී දර්ශන අධිමාස භේද (අධිමාස පිළිබඳ ඇති වූ සැකය දුරුකරවීමට ලියූවකි.)
- මහින්දෝදය වණ්ණනා (මහා මිහිඳු තෙරුන්ගේ ලංකාගමන කතාව)

යන කෘතිවල කර්තෘවරයා වන අතර ස්වකීය ආචාර්ය කහවේ ඤාණානන්ද තිස්ස හිමියන් ලියූ සීමාලංකාරසංග්‍රහය මුද්‍රණය කිරීමට කටයුතු කළේද නාහිමිපාණන් වහන්සේයි. කොළඹ වරායෙන් ලංකාවට පැමිණි ආර්.ඒ. මිරන්ද නම් මහතා පරමවිඥානාර්ථ

සමාගමේ සභාපතිවරයා ලෙස වසර විසිදෙකක් කටයුතු කළේය. අප බුද්ධසිරි හිමිපාණන් පිළිබඳව ප්‍රසාදයට පත් එතුමා උන්වහන්සේ සංස්කරණය කරන ලද සහ අර්ථ කතා ලියූ කෘති ගණනාවක් ධර්ම දානය පිණිස මුද්‍රණය කොට බෙදා හැරියේය. උන්වහන්සේ පිළිබඳ පැහැදීමට පැමිණි ගාල්ලේ අතපත්තු වලව්වේ එඩ්මන් රෝලන්ඩ් ගුණරතන මන්ත්‍රීවරයා උන්වහන්සේ සමග අනුරාධපුර ආදී ලක්දිව නොයෙක් පූජ්‍යස්ථාන වන්දනා කිරීමට ගියේය.

මේ වන විට සියම් රටේ රජ වූ වජිරඥාණ රජු සහ ඔහුගේ පුත්‍ර චූලාලංකාර රජු ලක්දිව සසුන පිළිබඳ පැහැදී විවිධ පූජා පරිශ්කාර මෙරටට එවීය. චූලාලංකාර රජු විසින් වරෙක එසේ පිටකත්‍රයේම පොත් එවන ලදී. ඒ සියල්ල බාරගත් බුද්ධසිරි තිස්ස මාහිමිපාණන් ඒවා අම්බරුක්ඛාරාම මූල මහා විහාරයේ තැම්පත් කරවූයේය. වරෙක සියම් චූලාලංකාර රජු ලක්දිවට පැමිණ කොළඹ නවාතැන් ගෙන ඇත. ඒ සමයේ ලක්දිව සියලු නිකායික ප්‍රධාන සංඝයා තම මැඳුරට වැඩම කරවා ගෙන ධර්ම සාකච්ඡා කොට මහා ධර්ම පරිෂ්කාර දෙවීය. සියම් නිකායේ වෙනුවෙන් විද්‍යෝදය පරිවේණාධිපතීන් වහන්සේ ද අමරපුර මහා නිකාය වෙනුවෙන් බුද්ධසිරි හිමිපාණන් ද තවත් බොහෝ සම්භාවනීය මහා තෙරවරුන් ද සහභාගී ව ඇති අතර චූලාලංකාර මහා රජුගෙන් රාජ සම්මාන ලැබූ මහතෙරුන් වහන්සේ නමක ලෙස අප බුද්ධසිරි තිස්ස මාහිමියන් හඳුනාගත හැකි වේ. උන්වහන්සේ පිළිබඳ මහා ප්‍රසාදයට පැමිණි එංගලන්තයේ විශ්වවිද්‍යාලයක උසස් අධ්‍යාපනය ලද ඇම්.ටී.ඩී.එස්. අමරසේකර නම් ප්‍රසිද්ධ මහත්මයා සම්බුද්ධ ශාසන උන්නතිය වෙනුවෙන් කළ කල

ක්‍රියාවන් දැක ප්‍රසාදයට පත්වූ බුද්ධසිරි තිස්ස හිමියන් **ශ්‍රී ධර්මභූෂණ** යන ගෞරව නාමයෙන් එතුමා පුදනු ලැබිණ.


- වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය
- කොළඹ බොරැල්ල ශ්‍රී තිලකරත්නාරාමය
- කළුවාමෝදර කළ්‍යාණාරාමය
- මොරගල්ලේ අභිනවාරාමය (මෙය උපන්ගමේම ඤාතීන් විසින් කරවා දුන් ආරාමයයි.)

ආදී විහාරයන්හි අධිපතීත්වයට පැමිණි උන්වහන්සේ අවසන් සමයේ ගිලන්ව සිට ඇත. අධාර්මිකව බල ලෝභීත්වය නිසා නොපනත්කම් කරන්නන් නොඉවසා එම අසත්පුරුෂයින් පිළිකුල් කළ අයුක්තිය නොඉවසූ මහා තෙරනමක ලෙස ප්‍රකට වැලිතර ශ්‍රී අම්බරුක්ඛාරාමාධිපතීත්වය දැරූ වැලිතර ශ්‍රී අමරසිරි තිස්ස හිමියන් උන්වහන්සේගේ ප්‍රිය ශිෂ්‍ය තෙරුන්වහන්සේයි. ඓතිහාසික කුරුවිට දිවාගුහා රාජමහා විහාරය සොයා ගත් වැලිකන්දේ සරණංකර හිමියන් ද බුද්ධසිරි තිස්ස මහානායක හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමකි. ගිලන් වූ අවස්ථාවේ ද අම්බරුක්ඛාරාමයට නිකායික සභාග සංඝයා කැඳවා තමන් වහන්සේට උපස්ථාන කිරීම පිළිබඳ ස්තුති කිරීමට ද උන්වහන්සේ අමතක නොකළේය. කළුවාමෝදර කළ්‍යාණාරාමයේ සීලානන්ද තිස්ස නම් හිමියන්ගෙ උපස්ථාන ලබමින් සිටියදී 1915 වසරේ වෙසක් පුර පසළොස්වක පොහොය ලැබූ බදාදා දින මනා සති සම්පජඤ්ඤයෙන් අපවත් වී වදාළහ. ත්‍රෛනිකායික මහා සඟරුවනේ ද දහදාහකට අධික ගිහිපිරිසකගේ ද සහභාගිත්වයෙන් ආදාහන පූජෝත්සවය උත්සවශ්‍රීයෙන් සිදු කොට ශාරීරික කොටස් තැම්පත් කොට සෑයක් ද බැඳවීය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය

ඥාණෝභාස තිස්ස හිමි, මොරගල්ලේ. **සිරි බුද්ධසිරි තිස්ස ථේර චරිතය.** මොරගල්ලඃ කේ.ඒ.ඩී. සිල්වා කුලතිලක ප්‍රකාශනයක්, 1923.

06 සිරිපවර අරියවංශාලංකාර අතිගෞරවාර්හ බලපිටියේ සීලරතන තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2462-2466,ක්‍රි.ව.1915-1924)



**ජන්ම ලාභය සහ ප්‍රව්‍රජාව**

ගාලු දිසාවේ බලපිටිය නම් චිරප්‍රසිද්ධ ගම් පියසේ විසූ ප්‍රභූ සත්ගුණයෙන් යුතු මාපිය යුවලකට දාව ජන්මය ලද බලපිටියේ සීලරතන තිස්ස මාහිමියන් වහන්සේ අමරපුර නිකායයේ තිඹිරි ගෙය වූ අම්බරුක්ඛාරාම මහා විහාරයේ උතුම් ශාසනික ප්‍රතිලාභය ලබයි. උගත යුතු බණ දහම් හදාරා බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේ දී උපසම්පදාවට පත් මේ සීලරතන සාමණේරයන් වහන්සේ බුද්ධසිරි තිස්ස මහානායක හිමියන්ගේ පැවිදි සහෝදරයෙකු හෝ ශිෂ්‍යයෙකු ලෙස සලකනු ලබයි.[19] මෙයින් වඩාත් සැලකිය හැක්කේ පැවිදි සහෝදරයෙකුට වඩා ශිෂ්‍යයෙකු වන බවයි. ඒ කහවේ ඤාණානන්ද තිස්ස (බුද්ධසිරි තිස්ස මහනාහිමියන්ගේ ආචාර්යන් වහන්සේ) හිමියන්ට ශිෂ්‍යවරයාණන් දෙදෙනෙකු පමණක් වූ බව ඓතිහාසික ලේඛන සාක්ෂි දරන නිසාවෙනි. ඇතම් විට අමරපුර තෙවැනි මහානායක මහකරාවේ විමලසාර තිස්ස හිමියන්ගේ ශිෂ්‍යවරයාණන් කෙනෙකු ද විය හැකිය.  අඹගහපිටි සඟ පරපුරේ එවකට වැඩසිටි ජ්‍යෙෂ්ඨතර තෙර නමක ලෙස උන්වහන්සේ හඳුනාගත හැකිය. බුද්ධසිරි නාහිමිපාණන් වහන්සේගේ අපවත් වීමෙන් සිස් වූ අමරපුර මහා නිකායයේ මහානායක පදවියට **සිරිපවර අරියවංසාලංකාර** යන ගෞරවෝපාධිය සහිතව සංඝානුමතයෙන් පත්ව වදාළේය. අම්බරුක්ඛාරාමයේ ස්ථිරවාසී වූ අප මහානායක හිමිපාණන්

- බේරතුඩුවේ ශ්‍රී සුදර්ශනාරාම මහා විහාරය

---

[19] පූජ්‍ය නුගගහලන්දේ සුමනජෝති තිස්ස හිමි, තල්ගහවෙල සුමේධ හිමි විසින් සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව, බේරතුඩුව, 2023 අගෝස්තු 26.

- කොළැහැකඩ පණසරුක්ඛාරාමය

ආදී වෙහෙර විහාර අරඹා ඒවාගේ ද දියුණුවට විහාරාධිපතීන් වහන්සේ ලෙස අනුශාසනා කරයි. එවකට අම්බරුක්ඛාරාමයේ වැඩ සිටි ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ බලලෝභී ක්‍රියාවන් නිසා අතිශය කළකිරීමට පත් මෙම වෘද්ධතර මහතෙරුන් අසේවනාච බාලනං යන බුද්ධ වචනයට අනුව බාලයන් ඇසුරු නොකිරීමේ අධිෂ්ඨානයෙන් අම්බරුක්ඛාරාමයෙන් බැහැරව තමන්වහන්සේට අයත් වෙනත් ආරාමයකට යයි.

- මාදූවේ ධම්මානන්ද තිස්ස අනුනායක තෙරුන්
- මාදූවේ අග්ගසිරි තිස්ස තෙරුන්

වැනි වූ ධර්මධර විනයධර මහතෙරවරුන්ට ශාසන දායාදය ලබා දුන් බලපිටියේ සීලරතන තිස්ස මහානායක මාහිමියන් 1924 වසරේ අප්‍රේල් මස දී ස්වර්ගස්ථව වදාළේය.

07 සිරි අරියවංශාලංකාර අතිගෞරවාර්හ අහුන්ගල්ලේ විමලධීර තිස්ස මහානායක මහා

ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2466-2468,ක්‍රි.ව.1924-1926)



වැලිතර අම්බරුක්ඛාරාමයට ආසන්න අහුන්ගල්ල නම් ප්‍රසිද්ධ ගම් පියසේ උපත ලද මුන්වහන්සේ ප්‍රව්‍රජෝපසම්පදාව ලබන්නේ ගල්කන්ද විහාරයේයි. බලපිටියේ සීලරතන තිස්ස මහානායක හිමියන් 1924 අප්‍රේල් මස අපවත්වීමෙන් පසු පුරප්පාඩු වූ මහානායක පදවියට සුදුසු මහ තෙරනමක පත් කරගැනීමේ අපේක්ෂාවෙන් වැලිතර අම්බරුක්ඛාරාමාධිපති වැලිතර අමරසිරි තිස්ස නාහිමියන්ගේ අනුග්‍රාහකත්වයෙන් 1924 වසරේ මැයි මස 01 වනදා ශතාධික මහා සංඝ සභාවක් අම්බරුක්ඛාරාමයට රැස් වෙයි. මහානායක හිමියන් පත්කරගන්නා සංඝ සභාවේ ලේඛකාධිකාරීන් වහන්සේ වූ වලගෙදර සෝමාලෝක තිස්ස හිමියන් වේ. උන්වහන්සේගේ වාර්තාවල දැක්වෙන්නේ වැඩමවා වදාළ සංඝයා වහන්සේ ඒ හිස්වූ මහානායක පදවියට තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් පත්කරගෙන සාධුකාර පවත්වා එය අනුමත කරගත් බවයි. ඒ අනුව අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් කවරදා කුමන පදනමකින් මහානායක පදවියකට පත්වූවාදැයි අපට කරුණු හමුනොවිණි. අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් සුගත ශාසනෝදය පිරිවෙන හා සම්බන්ධව සිටි නිසා උපකල්පනය කළහැක්කේ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන්ගේ පත්වීමෙන් පසු එයට අකමැතිව සම මහානායක හිමිනමක ලෙස තමාට පක්ෂ භික්ෂු පිරිසක් ද සමඟ ක්‍රියා කළ බවයි. තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන්ගේ මහානායක පදවි සන්නසේ ද මුන්වහන්සේගේ නම සඳහන් කොට ඇත්තේ තමාට විරුද්ධ වුවත් අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් අමරපුර නිකායික භික්ෂුවක් ලෙස තමන් ප්‍රතික්ෂේප නොකරන බව පෙන්වීමට යැයි සිතිය හැකිය. බලපිටියේ සීලරතන තිස්ස හිමියන්ගේ අපවත් වීමෙන් පසු තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් හා සමමහානායක


පදවියට පත්වූවත් 1926 වසරේ දී[20] අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් අමරපුර මහා නිකායයේ මහානායක ධුරයෙන් ඉවත් කරන්නේ මූලවංශික නම් නව නාමයක් ද තම කණ්ඩායමට සම්මත කොටගෙන වෙනම ක්‍රියා කළ නිසා බව පෙනේ. කෙසේ නමුත් 1931 වසරේ විහාර දේවාලගම් පනත යටතේ අහුන්ගල්ලේ විමලධීර තිස්ස හිමියන් මූලවංශික නම් නව නිකායක මහානායක තෙරුන් ලෙස ලියාපදිංචි වෙයි. තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් වැලිතර ඤාණවිමල තිස්ස හිමියන්ගෙන් අඛණ්ඩව පැවතගෙන ආ මුල් බුරුම සඟ පිරිසේ (අමරපුර මහා නිකායයේ) ශ්‍රීමත් මහානායක මහා තෙරණුවෝ ලෙස සම්මත වූහ.[21]


## *08 අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්තිසිරි අතිගෞරවාර්හ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ*

[20] ශ්‍රී ලංකා අමරපුර මහා නිකාය අඹගහපිටි පාර්ශ්වය 2010 වසරේ ප්‍රකාශිත ව්‍යවස්ථා ලේඛනය

[21] කොළඹ වජිරාරාමාධිපති අමරපුර ධර්මරක්ෂිත මහා නිකායයේ මහානායක පැලැනේ වජිරඤාණ හිමියන් විසින් අතිගෞරවාර්හ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත් වීම නිමිත්තෙන් එවන ලද ශෝක පණිවිඩය

(බු.ව.2468-2485,ක්‍රි.ව.1924-1943)





**ජන්මලාභය සහ ප්‍රව්‍රජාව**

වර්ෂ 1858 මාර්තු මස 03 වැනි අඟහරුවාදා දවල් 12 ට පමණ හත නැකතින් විතාරණ එන්ද්‍රිස් ද සිල්වා පියතුමන්ට සහ සේනාපති සෙලෝ හාමි ද සිල්වා මව්තුමියට දාව පුතුන් සත් දෙනෙකුගෙන් යුතු පවුලේ බාලයා ලෙස හින්නි මහත්මයා නමින් උපත ලැබුවේය. හින්නි මහත්මයාගේ පියතුමා තොටගමුවේ දොන් පිලිප්පු මුහන්දිරම්තුමාගේ පස්වැනි පරපුරේ සාමාජිකයායි. මව්තුමිය මහනුවර සෙනරත් රජුට 1630 සැප්තැම්බර් 19 වන දා රන්දෙණිවෙල සටනේ දී උදව් කොට රාජකරුණාව ලබා සතර කෝරළය නින්දගම් ලෙස ලැබූ ලස්කිරිඤ්ඤ හමුදාවේ සේනාපති වූ දොන් කොස්මෝ විජේසේකර මුදලිතුමාගේ පුත් තේන්කුට්ටි නිළමේගේ හයවෙනි පරපුර නියෝජනය කරන්නියයි. මෙම දරුවා අක්ෂරාභ්‍යාසය සඳහා නිසි වයසට ආ පසු තොටගමුවේ සුභද්‍රාරාමාධිපති තොටගමුවේ සිරිමානන්ද හිමියන් වෙතින් අකුරු කියවා එම විහාරයෙන්ම අධ්‍යාපනය ලදහ. ස්වකීය ජ්‍යෙෂ්ඨ සොයුරු තෙල්වත්තේ ගුරුන්වහන්සේ වෙතින් ගණිතයත් පුස්කොළ ලිවීමත් හදාරන ලදී. දහහත්වන වියට පැමිණීමේ දී වැලිතර අම්බරුක්ඛාරාමාධිපති මහකරාවේ විමලසාර තිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ තොටගමුව සුභද්‍රාරාමයට වැඩම කොට එහි වස් විසූහ. ඒ වර්ෂ 1875 දීයි. මිතුරන් සමඟ වස් කාලයේ දිනපතා බණ ඇසීමට යන අතර පැවිදි වීමට සිත් පහළ ව ඒ බව තොටගමුවේ පඤ්ඤාතිස්ස ස්වාමීන් වහන්සේට සැල කරන ලදී. එතැන් පටන් පඤ්ඤාතිස්ස ස්වාමීන් වහන්සේ වෙතින් පැවිදිවීම සඳහා අවශ්‍ය බණ දහම් උගෙන වැලිතර බු.ව. 2418 ඉල් මස පුර පොහෝ දා ශ්‍රී පුෂ්පාරාම නායක විහාරයේ දී මහකරාවේ විමලසාර තිස්ස

මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් තොටගමුවේ පඤ්ඤාමෝලි යන නමින් පැවිදි බිමට පමුණුවන ලදී.

## ආචාර්ය පරපුර

වැලිතර අම්බරුක්බාරාම මූල මහා විහාරය කේන්ද්‍ර කරගනිමින් අමරපුර මහා නිකාය පිහිටුවා වදාළ මහාධම්ම රාජාධිරාජගුරු ඤාණවිමලතිස්ස මාහිමියන්ගේ අග්‍ර ශිෂ්‍ය ත්‍රිපිටක පර්යාප්තිධර බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යවරයාණන් සද්ධම්මජෝතිපාල ගණාචරිය කහවේ ශ්‍රී ඤාණානන්ද තිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. උන්වහන්සේගේ ශිෂ්‍ය රත්නය වූ කවිචක්‍රවර්තී අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර මහකරාවේ විමලසාර තිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අප තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස ස්වාමීන් වහන්සේගේ ආචාර්යවරයාණන් වහන්සේ වූහ.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

පැවිදි වීමෙන් අනතුරුව සිය ආචාර්යවරයාණන් වහන්සේගේ විහාරය වූ අම්බරුක්බාරාම මූල මහා විහාරයේ ම වැඩසිටි අතර සිය මූලික අධ්‍යාපනය වැලිතර අම්බරුක්බාරාම මූල මහා විහාරයේ දී ගුරු ඇසුරේ ම ලබාගෙන ඇත. මහත් කාය සහ ඥාන ශක්තියකින් හෙබි උද්යෝගීමත් ශිෂ්‍යයකු ලෙස විහාරස්ථ භික්ෂූන් වහන්සේලා අතර කැපී පෙනෙන අයකු විය. විශේෂයෙන්ම අනෙකෙකු විසින් පාලි නිඝණ්ඩුව කියවනු ඇසීමෙන් ගාථා සිය ගණනක් ධාරණය කර ගැනීමේ හැකියාවක් තොටගමුවේ පඤ්ඤාමෝලි සාමණේරයන් වහන්සේ සතු විය. පාලි ව්‍යාකරණ, ප්‍රාතිමෝක්ෂය සහ ත්‍රිපිටකය

පිළිබඳ ප්‍රබුද්ධ දැනුමක් ඇති අයෙකු බවට පැවිදි දිවියට පත්ව දෙවසරක් ඉක්ම යන විට පත්විය. අධ්‍යාපනය ලබන අතරතුර ආචාර්යවරයාණන් වහන්සේ වූ විමලසාර මහානායක හිමියන් අපවත් වූයෙන් මීගමුවේ ධම්මරතන තිස්ස හිමියන්ගේ මඟ පෙන්වීම පරිදි පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත් වූයේය. එහි දී ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම නාහිමියන්, බැදිගම ශ්‍රී රතනපාල හිමියන් වැනි පඬිවරුන් ඇසුරෙන් සංස්කෘත, තර්ක ශාස්ත්‍රය, භාෂාන්තර ඥානය ලදහ. සය වසක් එහි උපරිම වර්ගය දක්වා පිරිවෙන් අධ්‍යාපනය ලබා ත්‍යාග, සහතික පත්‍ර ලැබූ පඤ්ඤාමෝලි හිමියන් එකල විද්‍යාලංකාරයේ දීප්තිමත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් විය. මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනෙහි හික්කඩුවේ ශ්‍රී පේමානන්ද සහ හික්කඩුවේ නලාගස්දෙණියේ විහාරාධිපති මාදුවනේ ශ්‍රී ආනන්ද යන හිමිවරුන් වෙතින් පිරිත් සහ අනුශාසනා කීමේ ක්‍රමයන් පිළිබඳ උගෙන ඇත.

**උපසම්පදා ප්‍රතිලාභය**

ශ්‍රී බුද්ධ වර්ෂ 2420 පොසොන් පුන් පොහෝ දා අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංශාලංකාර මහකරාවේ විමලසාර තිස්ස අමරපුර මහා නිකායයේ මහානායක හිමියන් උපාධ්‍යාය කොටගෙන ගණාචරිය කළුවාමෝදර බුද්ධසිරි තිස්ස ස්වාමිපාදයන් වහන්සේ, සද්ධම්මාචරිය තොටගමුවේ පඤ්ඤාතිස්ස ස්වාමිපාදයන් වහන්සේ, පණ්ඩිතාචාර්ය මීගමුවේ ආසභ තිස්ස ස්වාමිපාදයන් වහන්සේ යන තෙනම වහන්සේ කර්මාචාර්යව බලපිටිමෝදර උදකුක්ඛේප සීමා මාලකයේ දී තොටගමුවේ පඤ්ඤාමෝලි සාමණේරයන් වහන්සේ උපසම්පදාව ලැබූ සේක.

**ශාසන සහ ශාස්ත්‍රීය සේවය**

පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ අධ්‍යාපනය ලබන සමයේ සිටම ධර්ම දේශනා සිදු කරමින් ද අමරපුර නිකාය වෙනුවෙන් විවිධ රැස්වීම්වලට සහභාගී වෙමින් ද කටයුතු කොට ඇත. පිරිවෙන් අධ්‍යාපනය නිම වූ විගස මීගමුව සුගතාරාමාධිපති ම්‍රම්මවංසාවතංස ධම්මරතන තිස්ස ස්වාමීන් වහන්සේගේත් එම විහාරයේත් දායකයින්ගේ ආරාධනාව ලැබ සුගතාරාමයේ ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමට තොටගමුවේ පඤ්ඤාමෝලි හිමියන් සහභාගී විය. මීගමු සුගතාරාමයට උන්වහන්සේ පිළිගෙන පිරිවෙන් සහතික පත්‍රය ප්‍රදානය කිරීමේ අවස්ථාවේ දී ධම්මරතන තිස්ස නාහිමියන් පැවසූ කතාවේ ම පිරිවෙන් ශිෂ්‍ය අවධියේ දී ඉටු කළ ශාසනික සේවය මොනවට ගම්‍ය වේ.

> **"අපේ මේ පඤ්ඤාමොලි තිස්ස තැන ආදර්ශවත් ශිෂ්‍ය නමකි. මෙහි පැමිණි තැන් සිට සුවචව ඉගෙනීම පමණක් නොව, වත් පිළිවෙතින් සරුව ගුරු භක්තීන් යෙදී ක්‍රියා කිරීමෙන් අපේ පිරිසට අමුත්තෙක් නොවන සේ අවංකාදරයෙන් අප ඇසුරු කෙළේය. මේ වන තුරු අප වෙනුවෙන් ධර්ම දේශනා සභා රැස්වීම් ආදියට ගොස් අපේ ගෞරවය තහවුරු කළ අමරපුර නිකායේ එකම ශිෂ්‍යයා මේ නම වේ. ධර්ම විනයධර පණ්ඩිතයෙක්ව සිටින මේ නම අදත් සාමණේර නමක් සේ මන් නැතිව ගුරු භක්තීන් යෙදී සිටීම ඒ නමගේ මතු දියුණුවට ප්‍රධාන කාරණයක් වනු නියතය. එසේ හෙයින් මතු මහත් වූ ලෝකශාසන සංග්‍රහයක් මේ**

**නමගෙන් සිදුවේ යයි විශ්වාස කරම්හයි වදාරමින් මේ සාක්ෂ්‍ය පත්‍රය පිරිනැමූහ.”** [22]

මීගමුව සුගතාරාමයේ වසර තුනක් පමණ කාලයක් වැඩ හිඳිමින් ආචාර්ය උදම්මිට ධම්මරක්ඛිත තිස්ස, ආචාර්ය බුද්ධපිය තිස්ස, ටී. විමලබුද්ධි තිස්ස, යූ. පඤ්ඤාවාස තිස්ස, ටී.එච්. ද සිල්වා නොතාරිස්, බ්‍රහ්මචාරී වලිසිංහ හරිශ්චන්ද්‍ර, නීතිඥ ෂර්මන් ද සිල්වා වැනි අයට ධර්මශාස්ත්‍ර ඉගැන්වූයේ ය. මේ කාලයේ දී උදම්මිට උත්තමාරාමාධිපති සිරිපවර පණ්ඩිතාචාර්ය සිරි සංඝ තිස්ස හිමියන් ඇතුළු දායකයින්ගේ ආරාධනාවෙන් එම විහාරයට ගොස් වෛද්‍යාචාර්ය ආර්.සී. පීරිස් විදානේ, ආර්.පී.පී. වීරසූරිය නොතාරිස් වැනි බොහෝ අයට ඉගැන්වීම කළහ. මීගමුව අවට මුකලන්ගමුව, අම්බලන්මුල්ල, වලාන, මඩවල, හීනටියන වැනි පළාත්වල බොහෝ ධර්ම ප්‍රචාරක කටයුතු සිදු කරන ලද්දේ මුන්වහන්සේය.

මේ අතරතුර රන්දොඹේ මහාචේතියාරාමයේ වැඩසිටි බ්‍රාහ්මණවත්තේ ධම්මපරායන තිස්ස හිමියන්ගේ සහ දායකයින්ගේ ආරාධනාව පරිදි 1899 අප්‍රේල් මස 21 වනදා මහාචේතියාරාමයේ අධිකාරීන් වහන්සේ ලෙස වැඩ කටයුතු අරඹන ලදී. දොඹවල සද්ධම්මගුප්ත පිරිවෙන්පති උඩුගම්පොළ ස්වර්ණජෝත්‍යාසභ හිමියන් ‘බෞද්ධ ලබ්ධි විසෝධනී’ නම් ධර්ම විරෝධ ග්‍රන්ථයක් පළ කළෙන් එහි දොස් දක්වමින් ත්‍රිපිටක අටුවාවන්ගෙන් කරුණු දක්වා සාරගර්භ ‘සදාචාර විභාවිනී’ නම් කෘතිය රචනා කළේ ද තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් වේ. එතැනින් නොනැවතී බෞද්ධ ලබ්ධි

---

[22] වලගෙදර සෝමාලෝක තිස්ස හිමි, **පඤ්ඤාමෝලි තිස්ස මහාස්වාමි චරිතය** (අම්බලන්ගොඩ: මහාචේතිය පිරිවෙන, 1941), 13.

විසෝදනිය ලියූ ස්වණ්ණජෝතාාසභ හිමියන් හා එච්. මයුරපාද හිමියන් ඇතුළු රාමඤ්ඤ නිකායික භික්ෂූන් වහන්සේලා ගෙන්වා 1904 වසරේ දී මීගමුව මහහුණුපිටිය සුගතාරාමයේ දී විවාදයක් සිදුකර ජයලබන ලදී. බුද්ධ ශාසනය නගා සිටුවනු වස් බටපොත වාදය, කොස්ගම වාදය වැනි වාදවලට සම්බන්ධව සිය පාණ්ඩිත්‍ය විදහාපෑමට පඤ්ඤාමෝලි තිස්ස හිමියන්ට හැකිවිය.

තිස්සමහාරාමයේ දාගැබ් වහන්සේගේ කොත් පැළඳවීමේ දී මළුවේ සිව් කොනේ තැන වූ පරිත්‍රාණ මණ්ඩපවල සියම් - අමරපුර දෙනිකායෙන් සති පිරිත් සිදු කළ අතර එහිදී සාරගර්භ ම පිරිත් අනුශාසනාව සිදුකළ ස්වාමීන් වහන්සේ ලෙස තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් දෙනිකායේ මහා සංඝයාගේ ප්‍රසාදයට පත්විය. වරෙක කර්නල් ඕල්කට්තුමන් විසින් දළදා වහන්සේ කිඹුල් දතක් යැයි දුර්මතයක් කළ අවස්ථාවේ එය නිරාකරණයට හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ පැවති සභාවට ආරාධනා ලැබ වැඩම කළ උන්වහන්සේ එහිදී කළ සාරවත් ව්‍යක්ත කතාව දූර්මත නිරාකරණයට හේතු විය. නැවත මහනුවර දී පැවැතුණු මෙම දූර්මතය නිරාකරණය කිරීමේ සභාවට අනගාරික ධර්මපාලතුමාගේ ආරාධනයෙන් අමරපුර මහා නිකාය නියෝජනය කරමින් වැඩම කළ අප නාහිමිපාණන් එහි දී කළ කථාව දළදා වහන්සේ පිළිබඳ ගිහි පැවිදි කාගේත් සිත් තුළ ශ්‍රද්ධාව ජනනය කරන්නක් විය. තම ශිෂ්‍යයකු වූ වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා විසින් අනුරාධපුර සාසනික ප්‍රවර්ධන කටයුතු ආරම්භ කළ අවස්ථාවේ 1902 වසරේ සිට අනුරාධපුරයට වැඩම කොට වලිසිංහ හරිස්චන්ද්‍රයන්ට අනුශාසනා කරමින් ද බෞද්ධ පුනරුදයක් ඇති කිරීම

සඳහා මහජනයාට ධර්ම දේශනා ආදිය පවත්වමින් ද නොයෙක් කටයුතුවල නිරත විය. මහාබෝධි සමාගමේ සභාපතිවරයෙකු ලෙස මෙන් ම අනුශාසකවරයෙකු ලෙසත් අනගාරික ධර්මපාලතුමාගේ ශාසනික කටයුතුවලට අනුග්‍රහය දැක්වූ අතර ධර්මපාලතුමා සහ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් අතර හුවමාරුව ඇති ලිපිවලින් ඒ බව පෙනෙයි.

*17 ජුනි 2473 / 1929*

*Rev Totagamuwe Pannamolithissa Maha nayaka Thero*

*Maha Chethiya Pirivena, Randombe, Ambalangoda*

*ගරු ස්වාමිපාදයාණන් වහන්ස,*

*ධර්ම විනයධර පණ්ඩිත ස්ථවිරයන් වහන්සේලා කීපනමක් එක තැනකට රැස් වී ධර්ම සාකච්ඡා පැවැත්වීමේ සිරිතක් නොපැවතීම ලංකා බුද්ධ ශාසනයට සිදු වී තිබෙන බලවත් පාඩුවකි. බොහෝ වෙහෙස මහන්සි දරා තමන් විසින් ප්‍රගුණ කර ගත් ආගම පිළිබඳ වූ වටිනා ධර්ම ශාස්ත්‍රයන් ලෝකයාට අවබෝධ කරවීම ඉතා වටිනා කුශල ක්‍රියාවක් බව ඔබවහන්සේට ද කල්පනා වනවා ඇත.*

*ධර්මධර අපේ පණ්ඩිත ස්ථවිරයන් වහන්සේලා තම තමන් වැඩ සිටින විහාරයට ම වී ඒ අවට වාසීන් පමණක් උතුම් ධර්මය බෙදා දී සිට පලාත්වාසීන් ගැණ කල්පනා නොකිරීම පාඩුවකි.*

*ධර්ම විනය සම්බන්ධ ගැටළු ප්‍රශ්නයක් විසඳීම සඳහා පණ්ඩිත සභාවක් අද ලක්දිව තිබේනම් එහි වටිනාකම කෙතරම්දැයි සිතා බලනු මැණවි. එබඳු පිළිවෙළක් ක්‍රමයෙන් ඇතිකර ගැනීම සඳහා ලබන ඇසළ මස පසළොස්වක දින පටන් වස්තුන් මස තුළ පණ්ඩිත ස්ථවිරයන් වහන්සේලා සත් නමක් පමුණුවා ගෙණ උපස්ථාන කිරීමට අදහස් කළෙමි. මේ ආරාධනාව පිළිගෙණ*

*වැඩමවීම සම්බන්ධව ඔබවහන්සේගේ අදහස දැනගැණීමට බලාපොරොත්තු වන්නෙමි.*

*මීට*

*අනගාරික ධර්මපාල*

ධර්මපාලතුමා සිරිදේවමිත්ත නමින් ඉන්දියාවේ දී පැවිදි වන විට ලංකාවේ සිටින සිල්වත් ම භික්ෂුවක් වූ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස නාහිමියන් පෙරවූ චීවරයක් ගෙන්වා ගෙන ඇත.

උන්වහන්සේගේ අධිෂ්ඨාන බලය පුදුම සහගත එකක්ය. වරෙක 1909 වසරේ පොසොන් මස අමාවක පෝදා බලපිටියේ මිගෙට්ටුවත්ත අභිනවාරාමයේ ධර්ම දේශනාවකට ආරාධනා ලබා වැඩම කරන අතර විහාරස්ථානය පෙනි පෙනී පොළඟෙකු දෂ්ට කර ඇත. ධර්මය ශ්‍රවණය කිරීමට ආ දායකයින් කලබල වේ යැයි සිතා පැය දෙකක් පමණ ධර්මය දේශනා කොට විහාරස්ථානයට වැඩම කළේය. පසුදින දහවල් 10 පමණ වන තෙක් විවිධ ප්‍රතිකාර ක්‍රම සිදු කොට විෂ බස්වන්නට වෛද්‍ය ඩී. කරෝලිස් ද සිල්වා මහතා කටයුතු කළේය. එහෙත් වසර පහක් පමණ ගත වන විට මෙම සර්ප විෂ නිසාම නාහිමියන්ගේ සිරුර වෙනස් වීමට පටන්ගෙන ඇත. තමන් වහන්සේට වසර හැත්තෑ හතක් වන විටත් පිණ්ඩපාතයෙන් යැපුණ, දහවල් ඉර අවරට ගිය පසු රෝගාතුරව සිටිය ද කිරි හෝ නොවළඳන, මරණාසන්න දින තෙක්ම දෛනික බුද්ධ වන්දනාවේ යෙදුණ සීලවෘධ මහාතෙර නමක් ලෙස නායක හිමියන් හඳුනාගත හැකිය.

- රන්දොඹේ මහාචේතිය පිරිවෙන් විහාරය
- මීගමු සුගතාරාමය

- ඉහළ විශුද්ධාරාමය (මෙම විහාරස්ථානය සකසන ඉඩම තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන්ට පිදූ අතර විහාරය පසුව ගොඩනඟා ඇත.)

යන විහාරයන්හි අධිපතීන් වහන්සේ ලෙස කටයුතු කළේය. බුද්ධ ශාසනයේ චිරස්ථායී බව පිණිස ස්වකීය ධර්මාචාර්ය පැලියගොඩ විද්‍යාලංකාර පරිවේනාධිපති ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම නාහිමියන් වැඩමවා අකුරු කියවා 1907 මැයි 17වනදා මහාචේතිය පරිවේණස්ථානය අරඹන ලදී. අපවත් වන තෙක්ම පිරිවෙනෙහි වැඩ කටයුතු අධීක්ෂණය කරමින් බොහෝ ශිෂ්‍ය පිරිසක් සමාජගත කරන්නට උන්වහන්සේ සමත් විය. සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති උගතෙකු ලෙස සමකාලීන සමාජයේ උන්වහන්සේ සම්භාවනාවට ලක්ව සිටියේ ය. උන්වහන්සේ විසින් විරචිත කෘතීන්ගෙන් උන්වහන්සේගේ පාණ්ඩිත්‍ය ප්‍රකට වෙයි.

- සදාචාර විභාවිනී
- පාලි නිඝණ්ඩු සන්නය (සංස්කරණ)
- විස්තර සන්න සහිත අභිධර්මාර්ථ සංග්‍රහය (සංස්කරණ)
- විමලසාර ථෙර චරිතය (පාලි පද්‍ය කෘතියකි.)
- සුවි සුදුරම් වැණුම - වැඳුන් මං විතර (සිංහල පද්‍ය කෘතියකි.)
- සාමණේර සික්ඛා නම් වූ සාමණේර බණ දහම් පොත

**විදේශ ගමන්**

ලංකාව පුරා අනුරාධපුර, පොළොන්නරුව, සේරුවාවිල, දඹුල්ල, අලුවිහාරේ, රිදී විහාරය, මහියංගනය, තිස්සමහාරාමය ආදී ලංකාවේ බොහෝ සුප්‍රසිද්ධාරාමයන් වන්දනා කර ඇති නාහිමියන් කුරුවිට පිහිටා ඇති දිවාගුහාව යැයි හඳුනාගන්නා සුදස්සන පබ්බතාරාම විහාරය සොයා එය එළිපෙහෙළි කර ජනයාට වන්දනා කිරීමට ද මුල්වී කටයුතු කර ඇත. බුදුන් වහන්සේ විසින් ශ්‍රද්ධාවන්ත කුල පුත්‍රයකු දැක සංවේගය උපදවා ගත යුතු යැයි පරිනිබ්බාන සූත්‍රයේ පෙන්වා දෙන ශුද්ධ භූමි ඇතුළුව දඹදිව පූජා ස්ථාන වන්දනා කිරීම සඳහා අප නාහිමිපාණන් වැඩම කොට ඇත. ඒ අවස්ථාවේ දී ම බුරුමයට ද වැඩම කොට ඇති අතර බුරුම රට දී සංඝරාජයන් වහන්සේ සතියක් පමණ කාලයක් නාහිමිපාණන් තම ආරාමයේ වඩා හිඳුවා ගෙන පුද පරිෂ්කාර සහ ත්‍රිපිටක අටුවා පොත් ද ලබා දී ඇත. බුරුමයෙන් පසුව තායිලන්තය වෙත වැඩම කොට එරටේ පූජනීය ස්ථාන දැක බලා වන්දනා කර ගැනීමට ද නා හිමියන්ට අවස්ථාව උදාවිය.

මහානායක පදවිය ලැබීම පිළිබඳ මහානායක පදවිය තෝරන අවස්ථාවේ එම සංඝසභාවේ ලේඛකාධිකාරී හිමියන් විසින්ම තබන ලද සටහන කියවීම වටී.

> *"මහානායක පදවිය ලැබීම.*
> *1924 අප්‍රියෙල් මාසයේ දී අමරපුර නිකායේ මහානායක පදවිය හිස් විය. ඉන්පසු ඊට සුදුස්සකු තෝරා ගැනීම පිණිස 1924 මැයි මස 1 දින පස්වරු 2 ට වැලිතොට අම්බරුක්ඛාරාම මහා විහාරයේ දී ශතාධික මහාසංඝයා වහන්සේගෙන් ද වැදගත් උගත් ගිහි පිරිසකින් ද යුක්ත වූ මහා සභාවක් පවත්වන ලදී. සිරි සුගත අරියවංස ධජ*

කලුවාමෝදර සීලසුමනතිස්ස මහා ස්ථවිර සරි සුගත සාසනවංස ධජ කළුතර ඥාණ විලාස තිස්ස මහා ස්ථවිරයන් වහන්සේ ආදී සියයකට අධික මහා ස්ථවිරයන් වහන්සේලාගෙන්ද, ගරු : සී ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ම (ඇමතිතුමා) රාජනීතිඥ, ප්‍රැන්සිස් ද සොයිසා මය (මන්ත්‍රීතුමා) ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා මය (සොලිසිටර් ජනරාල්) තුමා ආදි මහත්වරු සිය ගණනක් ද එහි වූහ. එම සභාවේ සභාපති ධුරයට වස්කඩුවේ සම්බුද්ධ සාසනොදය පරිවෙණාධි පති සිරිසුගත සාසනවංසපාල ගණාචරිය අරියවංසතිලක මෙධාවිතිස්ස නායක මහ ස්ථවිරයන් වහන් සේද. ලේකම් ධුරයට මහාචෛතිය පරිවෙණාචාර්ය පණ්ඩිත වලගෙදර සොමාලොකතිස්ස නම් වූ අපද සමාන ඡන්දයෙන් පත් කරගත්හ. එම වර්ෂයේ අප්‍රියෙල් මස 28 වෙනි දින සිට බල වත් ලෙස රොගාතුර වීම නිසා මේ සභාවට කථා නායක මාහිමි යන් වහසේ නොවැඩිය හ. එසේ වුවද මේ නායක ධුරයට එකම සුදුස්සා මුන්වහන්සේ බව මහා සභාවේ ප්‍රකාශ විය. ඉන් පසු කළුවාමෝදර ක්ෂෙත්‍රාසන්න විහාරාධිපති සිරිසුගත අරිය වංසධජ සීලසුමන තිස්ස මහ ස්ථවිරයන් වහන්සේ විසින් මුන් වහන්සේට ඒ පදවිය පැවරිය යුතුයයි කරන ලද යෝජනාව වැලිතොට අම්බරුක්ඛාරාමාධිපති සිරි පවර අරියවංසා ලංකාර අමර සිරිතිස්ස මහ ස්ථවිරයන් වහන්සේ විසින් කරන ලදී. මීගමු උදම්මිට උත්තමාරාමාධිපති සිරි සුගත අරිය වංස කවිධජ සංඝතිස්ස මහා ස්ථවිරයන් වහන්සේ ඒ අනුමත කළහ. සියලු සභාව පිළිගත් පසු ගිහි පිරිස සාධුකාර දීමෙන් ස්වකීය සන්තුෂ්ටිය ප්‍රකාශ කළාය. එයින් පසු සභා සම්මතයෙන් නියෝජිත පිරිසක් මුන් වහන් සේ වෙත අවුත් ඒ පදවිය සම්මත කළ බව හා ඒ පිළිගෙන ක්‍රියා කළ යුතු බවත් සැළ කළ කල්හි "මම කිසි කලෙක මෙබඳු ධුර යක් පිණිස ඉල්ලුම් නොකළෙමි. එසේ සිටියදිත් මා අසම් මුඛයේ මා

*කෙරෙහි මහා සංඝයා වහන්සේ තැබූ විශ්වාසය තහවුරු කරමින් ක්‍රියා කරන්නට උත්සාහ කරමි. බුද්ධ ශාසනය කැප කළ මේ ජීවිතය අප නිකායේ ද දියුණුවට යොදන් න්නට උත්සාහ කරන්නෙමි. ඊට අප සංඝ සභාවේ ආධාරය අතිශය අවශ්‍ය වෙයි. කවුරුත් සහයොගයෙන් ක්‍රියා කරත් නම් මම මගේ යුතුකම ඉෂ්ට කරන්නෙමැයි වදාළහ." [23]*

*මහානායක පදවියට අදාල ශ්‍රී සන්නස් පත්‍රය*

**ශ්‍රී සන්නස් පත්‍රය. සොත්ථි**

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

ශ්‍රීමත් ශ්‍රීඝන සුගත තථාගත සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ පිරිනිවී දෙසිය සතිස්වන හවුරුදුයෙහි දඹදිව එක් සේසත් නංවා රජ පැමිණි ආඥා චක්‍රවර්ති ධර්මාශෝක මහා මහීන්ද්‍රයාණන් දෙටුපුත් රුවන වූ ද්වීප ප්‍රසාදක මහා මහෙන්ද්‍ර මහා ක්ෂිණාශ්‍රවයාණන් වහන්සේ මේ ශ්‍රී ලංකාද්වීපයට වැඩ වදාරා ලක්දිව රජ සිරිලත් දෙවන පැතිස් මහ රජතුමන්ගේ සහායත්වයෙන් සුවිසුද්ධ සම්බුද්ධ ශාසනය මේ දිවයිනෙහි ප්‍රතිෂ්ඨාකර වදාළ තැන් පටන් සම්‍යක් සම්බුද්ධ ශාසනය අතිශය නිමලට සමස්ත සත්ත්ව හිතාභිවෘද්ධි සාධනය කරමින් පවත්නා අතර ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් එකසිය සූවිසි වැන්නෙහි පමණ අභිෂෙක ප්‍රාප්ත ශාසන විනාශක සීතාවක රාජසිංහ රජුගෙන් හා පෘතුගීසි රජුගෙන්ද ඇති වූ ශාසන විපත්තීන් හේතු කොට ගෙන බුද්ධ ශාසනය පිරිහී ගොස් ලක්දිව එක භික්ෂු නමකුත් නැතිව පවත්නා සමයෙහි සුපරිසුද්ධ බුද්ධි ප්‍රභා මහිමයෙන් මුළු ලක්දිව එකලු කළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන්

---

[23] වලගෙදර සෝමාලෝක තිස්ස හිමි, **පඤ්ඤාමෝලි තිස්ස මහාස්වාමි චරිතය** (අම්බලන්ගොඩ: මහාචේතිය පිරිවෙන, 1941), 23-24.

වහන්සේගේ සදාශ්‍රය හේතුකොටගෙන සර්වඥ ශාසනයෙහි අතිශය ප්‍රසන්න වූ කීර්ති ශ්‍රී රාජසිංහ නර දෙවයන් විසින් බුද්ධ ශාසනය යළිදු මෙහි පිහිටුවනු පිණිස නන් පඬුරෙන් යුත් දූත පිරිසක් සියම් රජයට යවා උපාලී මහා ස්ථවිරාදි අතිරේක දශවර්ගික භික්ෂූන් වහන්සේ මෙහි පමුණුවාගෙන පිණ්ඩපාතික සරණංකර සාමණේරයන් ප්‍රමුඛ නානා කුල පුත්‍රයන් පැවිදි උපසපන් කරවා සර්වඥ ශාසන ප්‍රතිෂ්ඨා කරවන ලද්දේ විය. එවක් පටන් නොයෙක් කුල පුත්‍රයෝ සසුන්ගත වූහ. ඔවුනතුරෙහි පූජ්‍ය පණ්ඩිතාචාර්යය භදන්ත ශ්‍රී බෝවල ධම්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ කරුණා මහිමතාවයෙන් යථෝක්ත සංඝරාජ මාහිමියාණන් වෙතින් ලබන ලද ප්‍රව්‍රජ්‍යා ඇති අත්‍යන්ත පරිශුද්ධෝපසම්පත්ති ප්‍රතිලාභයෙහි සාපෙක්ෂකවූ වැලිතොට අරුක්බාරාම විහාරයෙහි නිවැසි බොධිසත්වගුණාභරණ විභූසිත බළපිටි මහකරාව ගම්හි සිරි ඤාණවිමල තිස්ස සාමණේරයන් වහන්සේ විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධ සහබන්ධු මුදලින්ද්‍රාදීන්ගෙන් ලබන ලද මහත් ආධාර ඇතිව ශ්‍රී බුද්ධ වර්ෂ 2342 වැන්නෙහි දී මේ දිවයිනෙන් පිටත්ව බුරුම රට අමරපුර නම් රාජධානියට වැඩ එහිදී ධවලගජපති සිරි පවර විජයානන්තයස ත්‍රිභවනාධි ත්‍යාධිපති පණ්ඩිත මහා ධම්මරාජාධි රාජොත්තමයාණන් කරවූ නොයෙක් පුද සිරිත් ගරුබුහුමන් ඇතිවැ ඤාණාභිවංස ධර්ම සෙනාපති සංඝරාජ මාහිමියන් වහන්සේ වෙතින් සාර්ථ කථා පිටකත්‍රය ධර්මය හා ශබ්ද ශාස්ත්‍ර විෂයයෙහිද විශාරදත්වය ලැබ ශ්‍රී බුද්ධ වර්ෂ 2345 ස් වනුයෙහි ඉල්මස පුර තුදුස්වක් දින බුරුම රට සුධර්මශාලාසන්නයෙහි වූ සුවණ්ණගුහා නම් බද්ධ සීමාවට රැස්වූ සංඝරාජයාණන් ප්‍රධාන එක් පනසක් පමණ මහ සඟුන් මැද යථෝක්ත සංඝරාජ ස්වාමින්ද්‍රයන් උපාධ්‍යාය භාවයෙන් හා උත්තර දෙවියාරාමවාසී ස්ථවිරය, පාසාද විහාර වාසී ස්ථවිරය, සොණ්ණ ලෙබාගාර විහාරවාසී ස්ථවිරය, යන මහතෙරවරුන්ගේ කර්මාචාර්යත්වයෙන් ලබන ලද උපසපන් ඇති සේක් එසේම උපසම්පදා වූ සෙසු පිරිස සහ නිස්සයාචරිය අග්ගසාරාභිධාන බුරුම මහ තෙරුන් ප්‍රධානව ලක්දිව පැමිණ ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් තුන්සීය සසාලිස් වැන්නෙහි දී වැලිතොට මහාද්වීප

නදියෙහි උදකුක්ඛේප සීමාවෙහි දී නිස්සයාචරිය අගගසාර මාහිමියන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් කුල පුත්‍රයන්ට ප්‍රව්‍රජ්‍යා උපසම්පදා දෙවා වදාළ තැන් පටන් ඇතිවූ අමරපුර නිකායෙහි මහානායක ධුරය බුරුම රට සංඝරාජ මාහිමියන් වහන්සේ ප්‍රධාන සංඝයා වහන්සේ ගේ ද සර්ව සාධාරණ ඉංග්‍රීසි නරෙන්ද්‍රයන් ගේද බලය සහ ආඥාවෙන් ශ්‍රී රාජගුරු ඤාණවිමල තිස්සාභිධාන යතීන්ද්‍රයන් වහන්සේට පත් කරන ලද හෙයින් එහි පිළිවෙළ නො සිඳ මේතාක් ශ්‍රී ඥානවිමල තිෂ්‍ය මාහිමියන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය ශාසන පරම්පරාවට අයත් **සිරි පවර පණ්ඩිත බේරතුඩුවේ ධම්මාධාර තිස්ස, අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර මහකරාවේ විමලසාර තිස්ස, සිරි සද්ධම්ම ජොතිපාල රන්දොඹේ චන්දජොති තිස්ස, සිරි පවර අරිවංසාලංකාර බලපිටියේ සීලරතන තිස්ස, සහ සිරි අරියවංසාලාංකාර අහුන්ගල්ලේ විමලධීර තිස්ස,** යන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා විසින් යථෝක්ත පදවිය හා නිකායත් මැනවින් පාලනය කරගෙන එන්ට යෙදුනා ඇත. ඒ මේ මහා නිකායෙහි දැනට හිස්ව තිබෙන මහා නායක ධුරය රන්දොඹේ මහා චෛතිය පරිවෙණාධිපති ගණාචරිය තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහා ස්ථවිරයනට පත් කිරීමට අප නිකායේ බොහෝ සංඝයා වහන්සේ රැස්වැ සමානච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද හෙයින් යථොක්ත තොටගමුවේ පඤ්ඤමෝලි තිස්ස මහා ස්ථවිරයෝ ප්‍රව්‍රජිතයන් විසින් පිළිපැදිය යුතු ධර්ම විනය දැන ගැනීමෙන්ද, සුපේශල ශික්ෂාකාමී සත්පුරුෂ භාවයෙන්ද, අප නිකායේ ප්‍රධාන අධිකරණ නායක ධුරය දැරීමෙන්ද නියම පරම්පරානුගතත්වයෙන් හා බහුශ්‍රැත අල්පේච්ඡත්වාදින් ද මහානායක ධුරය ලැබීමට ඉතා යෝග්‍යව සිටිනා බැවින් අප කාරක සංඝ සභා සම්මතයෙන් යථෝක්ත තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහා ස්ථවිරයන්ට අපේ කැමැත්ත ඇතිතාක් යථෝක්ත ධුරයේ කටයුතු කරන ලෙස එම මහා නායක පදවිය හා අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි යන නාමය ද මෙයින් පවරන්ට යෙදුනා ඇත. එම නිසා මේ මහා නායක ස්ථවිරයන් විසින් බුද්ධ ශාසනය හා රාජාණ්ඩුවටත් සුපක්ෂව අමරපුර

නිකායේ සියලු සංඝයාට ධර්ම විනයානුකූලව අවවාදානුශාසනා කරමින් අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තින් යුක්ත වූ යම් භික්ෂු කෙනෙක් වෙත් නම් එවැන්නන් අප්‍රතිපත්‍යාදීන් දුරු කොට සුපිළිවෙත්හි හසුරුවමින් අප නිකායේ සියලු සංඝයාට නොවෙනස්ව සමගියෙන් යුතුව පැවතිය යුතු වත් හැර අප නිකායේ සියලු සංඝයා වහන්සේ යථෝක්ත අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි පඤ්ඤාමෝලි තිස්සාභිධාන මහා නායක ස්ථවිරයන් වහසේගේ ධර්ම විනයානුගත සියලු අවවාද අනුශාසනා නිසිසේ පිළිගනිමින් මේ මහා නායක ස්ථවිරයාණන්ට ද පුරාණ චාරිත්‍රානුගත වූ සියලු ගරු බුහුමන් සත්කාරාදිය නොවරදවා පැවැත්විය යුතු බවත් මෙයින් අඟවා කරම්හ.

කාරක සංඝ සභාවේ නියමයෙන් මේ බවත් මෙසේ ලියා අත්සන් පිහිටුවා දෙන්ට යෙදුනේ ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2267 තෙන් මතු අවුරුද්දෙහි ඇසළ මස පුර දොළොස්වක ලත් ශනි දින නොහොත් ක්‍රිස්තු වර්ෂ 1924 ක් වූ ජූලි මස 12 වෙනි ශනි දින බලපිටි මෝදර උදකුක්ඛෙප සීමා මාලකයේ දීය.

කාරක සංඝ සභානුමතයෙන් ඒවගත් මෙසේම ලියා

- අත්සන් පිහිට වූවෝ. මීගමු උදම්මිට උත්තමාරාමාධිපති සිරිපවර පණ්ඩිත සංඝතිස්ස මහා ස්ථවිර, සිරි සුගත අරියවංස ධජ ගණාචරිය සිරි මේධාවී තිස්ස බෙන්තර කොළඹ දෙදිසාවේ ප්‍රධාන නායක මහා ස්ථවිර, කළුවාමෝදර බෙත්තාසන විහාරාධිපති සිරි සුගත අරියවංස සීලසුමන තිස්ස මහා ස්ථවිර, කළුතර සුමිත්‍රාරාමාධිපති සිරි සුගත සාසන ධජ ඤාණවිමල තිස්ස මහා ස්ථවිර, කොස්ගොඩ අමර මුනි විහාරාධිපති සිරි සුගත සාසන වංසාලංකාර සුමනසාර තිස්ස මහා ස්ථවිර, පින්වත්තේ කල්‍යාණදස්සනාරාමාධිපති සිරි සෝමානන්ද තිස්ස මහා ස්ථවිර, රන්දොඹේ ශ්‍රී පුෂ්පාරාමාධිපති අමරපුර වංසාවතංස ගණාචරිය සිරි ධම්මරක්ඛිත තිස්ස මහා ස්ථවිර, මිගමු මහහුණුපිටියේ සුගතාරාමාධිපති බුද්ධප්පිය තිස්ස මහා ස්ථවිර, වැලිතර මාදූවේ වික්‍රමසිංහාරාමාධිපති සිරි ධම්මානද තිස්ස මහා ස්ථවිර, පල්ලේගොඩ ශ්‍රී පුෂ්පාරාමාධිපති ශ්‍රී සුගුණසාර තිස්ස මහා ස්ථවිර යන අපි වම්හ.

තමන් වහන්සේගේ ශාසනික සේවාව ඉදිරියට පවත්වාගෙන යනු වස්

- බේරතුඩුවේ ධම්මාධාර තිස්ස
- වලගෙදර සෝමාලෝක තිස්ස (පසුව මහානායක)
- මාදම්පේ සෝමාරාම තිස්ස
- මාදම්පේ පඤ්ඤාරාම තිස්ස
- රන්දොඹේ සාරගවේෂී තිස්ස
- රන්දොඹේ සෝමසිරි තිස්ස (නාගදීප රාජමහා විහාරාධිපති)
- බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස (පසුව මහානායක)

ආදී කොට ඇති මහත් භික්ෂු පිරිසක් තනන ලදී.

**අපවත් වීම**

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය ම ප්‍රාර්ථනා කළ අප මහා නායක හිමිපාණෝ අතිශය ශීලධර මහ තෙර නමක ලෙස බෞද්ධ කා අතරත් ජනප්‍රියත්වයට පැමිණි අයෙකි. ස්වනිකායයේත් බුදු සසුනේ අනාගත අභිවෘද්ධිය සඳහා කටයුතු කොට වර්ෂ 1941 ජූලි මස 01 වනදා අපවත් වී වදාළහ. ශ්‍රී දේහය පිළිබඳ ආදාහන පූජෝත්සවය එම මස 13 වනදා බලපිටි වලගෙදර සුසාන භූමියේ සිදුකරන ලද්දේ ත්‍රෛනිකායික සංඝයා සහ මන්ත්‍රීන් ආදී විශාල පිරිසකගේ සහභාගිත්වයෙනි.

**ශෝක පණිවුඩ කොළඹ වජිරාරාමාධිපති අතිගරු පැලැණේ වජිරඤාණ මාහිමියන් වහන්සේ ගේ ලියමනේ මෙසේ සඳහන් වේ.**

- "අපවත්වූ මාහිමියන් වහන්සේ කෙරෙහි **ලංකාවේ බුරුම නිකායන්ගෙන් මුල් නිකායේ මාහිමියන්** හැටියටත්, සිල්වත්ව වැඩි සිටි මහ තෙර කෙනෙකුන් හැටියටත්, ධර්ම විනයධර උගත් පැවිදි පඬිවරයෙකු හැටියටත්, දීර්ඝ කාලයෙක සිට අපට හිතවත්ව සිටි උතුමකු හැටියටත්, අපගේ ගෞරවය හා සැලකිල්ල ඉතා මහත්ය. එබැවින් උන්වහන්සේගේ අභාවය අතිශය සංවේග ජනකය. වර්තමාන භික්ෂු සංහතියට ආදර්ශායමාන වූ මෙබඳු උතුමන්ගේ අභාවය ලංකා ශාසනයට මහත් හානියකි. අල්පෙච්ඡතාදි ශ්‍රමණ ගුණයන්ගෙන් සැදුම් ලත් ආකල්ප සම් පන්න වූ මෙවැනි තැන්පත් උතුමෝ මෙකල ඉතා දුලබ වෙති.

**සිද්ධාන්ත විසාරද ධර්ම කීර්ති ශ්‍රී ධර්මානන්ද නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ ශිෂ්‍ය භික්ෂූන්ට එවූ ලියමනේ කොටසක්.**

- '' ඉතා උසස් ලොක ශාසන සංග්‍රහයක් සැලසූ ශික්ෂාකාමී නියම සංඝ පිතෘවරයෙක් වූ ඔබ ගුරුදේව මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අභාවය ඔබ වහන්සේලාට පමණක් නොව අපටත් පැමිණි බලවත් පාඩුවෙකි.

**එඩ්මන් පීරිස් ( ඕ. ඇම්. අයි. ) හලාවත රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ලියුමෙන් කොටසක්.**

- "ශාස්ත්‍රා ලොකයෙන් ලංකාව ආලොක කළ උත්තමයකු වන අමරපුර නිකායේ මහානායක ධුරන්ධර පඤ්ඤමොලි තිස්ස මාහිමියන් වහන්සේගේ මරණය ගැන අපි ශොක වීමු.

**ශ්‍රීමත් ගරු ඩී. බී ජයතිලක මහ ඇමතිතුමාගේ ලියුමේ කොටසක්.**

- ......මහානායක ස්වාමීන් වහන්සේ මා දැන ඇඳින ගත්තේ මීට අවුරුදු හැටකට පමණ ප්‍රථම උන් වහන්සේ පැලියගොඩ විද්‍යා ලංකාර පිරිවෙනේ ශාස්ත්‍රොද්ග්‍රහණය කළ කාලයේදීය. එවක අප අතර ඇති වූ මිත්‍ර සම්බන්ධයත්, උන්වහන්සේ කෙරෙහි මා තුළ පැවැති ප්‍රසාදය හා

ගෞරවයත්, අවසානය දක්වාම අනූනව පැවතුණ බව කියන්ට පුළුවන් වීම භාග්‍යයක් ලෙස සලකමි.

පඤ්ඤාමොලි මහානායක ස්වාමින්ද්‍රයන් වැනි පරිශුද්ධ ශීලාදි ගුණ ධර්මයෙන් හා පාණ්ඩිත්‍යයෙන් හෙබියා වූ සංඝපීතාවර යන්ගේ අභාවය ශාසනයටද, බෞද්ධ මහජනයාටද, බලවත් පාඩුවක් මැයි! එසේ ද වුවත් උන්වහන්සේගේ ශිෂ්‍ය පිරිස ඒ උසස් චරිතය ආදර්ශයට ගෙන සමගියෙන් හා ශාසනාලයෙන් ක්‍රියා කළහොත් ඒ පාඩුව බොහෝ දුරට පිරිමසා ගන්නට බැරි නොවේය යි හඟිමි. තවද මහා නායක ස්වාමිපාදයන් විසින් පිහිටුවා වර්ධනය කරන ලද මහා චෛතිය පිරිවෙන ආරක්ෂා කර ගැනීමත් එහි මතු දියුණුව සැලැස්වීමත් සඳහා උන්වහන්සේගේ නාමයට ගෞරව කරනු කැමති ශිෂ්‍ය සමූහයාගේත් දායක සභාවේත් විශේෂ උත්සාහයක් හැමවිටම ඇතිවේයයි අපේක්ෂා කරමි.

මේ බවට - හිතවත්, ඩී. බී. ජයතිලක. 06.07.1941 චිත්‍රලතා

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය

සෝමාලෝක තිස්ස හිමි, වලගෙදර. **පඤ්ඤාමෝලි තිස්ස මහාස්වාමි චරිතය.** අම්බලන්ගොඩ: මහාචෛතිය පිරිවෙන, 1941.

09 අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංශාලංකාර අතිගෞරවාර්හ උදම්මිට සිරි
ධම්මරක්ඛිත තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2485-2513,ක්‍රි.ව.1943-1971)



**ජන්මලාභය සහ ප්‍රව්‍රජ්‍යාව**

වර්ෂ 1871 අගෝස්තු මස 06 වනදා අරුමාදුර ජුවානිස් ද සිල්වා කුලසිංහ පියතුමන්ට සහ වෙද බබානෝනා ද සිල්වා මව්තුමියට දාව පුතුන් සය දෙනෙකු සහ දූවරු සිව්දෙනෙකු යුතු පවුලේ නව වැනියා ලෙස අරුමාදුර හැන්රි කුලසිංහ නමින් අප නාහිමිපාණෝ උපත ලැබූහ. වර්තමානයේ බස්නාහිර පළාතේ මීගමුව දිස්ත්‍රික්කයට අයත් (එකල බස්නාහිර පළාතේ හලාවත දිස්ත්‍රික්කයට අයත් නගරයක් ලෙස මීගමුව පැවතුණි.) උදම්මිට නම් සුප්‍රසිද්ධ ග්‍රාමයක් ඇති අතර පැරණි රජ දවස උදම් අනමින් පිනැති ජනතාවක් ජීවත් වූ බැවින් එගම උදම්මිට නම් ලබා ඇත. හැන්රි කුලසිංහ දරුවාගේ උපත සිදුවන්නේ මේ ග්‍රාමවරයේ දී ය. කුරුඳු පිළිබඳ රාජකාරි නිලධාරියා යන අර්ථය ඇති අන්මන්දාර් යන ගරු නාමයක් (අරුමාදුර යනු එයින් සැකසුණු වචනයයි.) වැලිතර මහා කප්පින වලව්වේ මුදලි පරම්පරාව ඥාතීත්වය ඇති කොස්ගොඩ ප්‍රභූවරයෙකු ලැබුණු අතර ඔහුගේ පුත්‍රයා අරුමාදුර මාරුක්කු ද සිල්වා කුලසිංහ නම් විය. සිය පුත්‍රයාගේ විවාහයත් සමඟ එතුමා උදම්මිටට ගොස් එහි ගම්පතියා බවට පත්විය. කුලසිංහ යනු ඉංග්‍රීසි ආණ්ඩුව ගම්පති නිලය සමඟ දුන් ගෞරව නාමයකි. අරුමාදුර ජුවානිස් ද සිල්වා කුලසිංහ යනු ඔහුගේ පුත්‍රයා යි.

උපතින් වසර තුන සම්පූර්ණ වන විට තම වැඩිමල් සොහොයුරු වූ දෛවඥ වෛද්‍යාචාර්ය අරුමාදුර නෝබියස් ද සිල්වා කුලසිංහ වෙතින් අකුරු කියවා ඔහු යටතේ ම මූලික අධ්‍යාපනය ලබා ඇත. වර්ෂ 1882 දී වැලිතර අම්බරුක්ඛාරාමාධිපති මහාකරාවේ විමලසාර තිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් උදම්මිට උත්තමාරාමයේ වස් සමාදන්ව ඇත. මේ කාලයේ හැන්රි කුලසිංහ දරුවා පැවිදි කිරීමට

යෝග්‍ය අයෙකු බව දැන මව්පියන් සමඟත් සුළු පියා වූ ඒ. සාමෙල් ද සිල්වා කුලසිංහ ඔපිසර් සමඟත් සාකච්ඡා කොට පැවිදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව වලාන සුමනාරාමාධිපති මහා කරාවේ සුගතවංස තිස්ස හිමියන් සහ ගල්වෙහෙර සුගත ඥාන තිස්ස හිමියන්ද යටතේ පැවිදිවීම සඳහා අවශ්‍ය කරන මූලික බණ දහම් උගෙන උදම්මිට උත්තමාරාම පුරාණ මහා විහාරයේදී එකොළොස් වන වියේදී මහාකරාවේ විමලසාර තිස්ස අමරපුර මහා නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේද උදම්මිට උත්තමාරාමාධිපති මීගමුවේ සංඝතිස්ස හිමියන් ද මීගමුවේ ධම්මරතන තිස්ස හිමියන්ද ආචාර්ය ග්‍රහණය කොට උදම්මිට ධම්මරක්ඛිත යන නාමයෙන් උතුම් පැවිද්දට පත් කරන ලදී.

## ආචාර්ය පරපුර

උදම්මිට ධම්මරක්ඛිත හිමියන් පැවිදි කිරීමේ දී ආචාර්යවරයාණන් වහන්සේලා ලෙස එවකට අමරපුර මහා නිකායේ මහානායක මහකරාවේ විමලසාර තිස්ස මහනාහිමියන් ද මීගමුවේ සංඝතිස්ස ද මීගමුවේ ධම්මරතන තිස්ස හිමියන් ද කටයුතු කර ඇත. එහෙත් උපසම්පදාවටවත් වෙන අවස්ථාවේ මහකරාවේ විමලසාර තිස්ස මහා නායක හිමියන් අපවත් ව සිටි බැවින් ඉතිරි ආචාර්යන් වහන්සේලා යටතේ උපසම්පදාවට පත්ව ඇත. බේරතුඩුවේ ධම්මාධාර තිස්ස මාහිමියන්ගේ[24] ද කහවේ ඤාණානන්ද තිස්ස හිමියන්ගේ ද අමරපුර මහා නිකායේ මහානායක මහකරාවේ විමලසාර තිස්ස

[24] මේ බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමි යනු අමරපුර මහා නිකායේ දෙවැනි මහානාහිමි නොව තොටගමුවේ පඤ්ඤාමොලි තිස්ස මාහිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය හිමියන් ය.

හිමියන්ගේ ද ශිෂ්‍ය වූ මීගමුවේ සංඝතිස්ස හිමියන් උදම්මිට ධම්මරක්ඛිත හිමියන්ගේ ආචාර්යන් වහන්සේයි.

**ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය**

වසර දෙකක් මීගමුවේ සංඝතිස්ස හිමියන් හමුවේ පිරිත් වරනැගිල්ල, ධාතු මංජුසාව, නිඝණ්ඩු ආදිය ඉගෙන ගත් ධම්මරක්ඛිත හිමියන් 1884 මාර්තු මස මහාකරාවේ විමලසාර තිස්ස මහනායක හිමියන් විසින් වැලිතර අම්බරුක්ඛාරාමයට ගෙන්වා ගන්නා ලදී. 1856 වසරේ ආරම්භ වූ සුගත ශාසනෝදය පිරිවෙනට ඇතුළත්ව දීප්තිමත් ශිෂ්‍ය භික්ෂුවක ලෙස ගුරුවරුන් ගේ සිත් දිනාගෙන කටයුතු කර ඇත. මහාකරාවේ විමලසාර තිස්ස මහානායක හිමියන්ගේ සාසනවංසදීප මහා කාව්‍යය කටපාඩම් කොට තිබූ ධම්මරක්ඛිත හිමියන් ලවා හික්කඩුවේ සුමංගල, වැලිගම සුමංගල, ශ්‍රී සුභූති වැනි හිමිවරුන් අම්බරුක්ඛාරාමය ට පැමිණි විට ගායනා ද කරවා ඇත.

1899 වසරේ විද්‍යාලංකාර පරිවේණාධිපති රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන් වහන්සේ හමුවට වැඩම කොට දෙවසරකට ආසන්න කාලයක් අධ්‍යාපනය ලබමින් සිටියදී රෝගාතුර වූයෙන් ආපසු අඹගහපිටිය මහා විහාරයට වැඩම කරවන ලදී. පසුව මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවේණාධිපති පණ්ඩිතාචාර්ය රයිගම ඉන්දජෝති නායක හිමියන් සමීපයෙහි පස් වසරක් උසස් අධ්‍යාපනය ලැබීය. මෙම කාලයේදී එම පරිවේණස්ථ සුභාශෝදය ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කළේ ධම්මරක්ඛිත හිමිපාණන්ය.

## උපසම්පදා ප්‍රතිලාභය

මේ වන විට විසිදෙවන වියට පා තබා සිටි ධම්මරක්ඛිත සාමණේරයන් වහන්සේ 1893 වර්ෂයේ බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේ දී අමරපුර නිඛිලගණාචරිය සිරිසද්ධම්ම ජෝතිපාල රන්දොඹේ චන්දජෝති තිස්ස අමරපුර මහා නිකායේ සිව්වන මහානායක හිමියන් උපාධ්‍යාය කොට උදම්මිට උත්තමාරාම පුරාණ විහාරාධිපති සුගතසාසන කව්ධජ මීගමුවේ සංඝතිස්ස හිමියන්ගේ ද මීගමුවේ හුණුපිටියේ සුගතාරාමාධිපති මුම්මවංසාවතංස මීගමුවේ ධම්මරතන තිස්ස හිමියන්ගේ ද ශිෂ්‍යවරයාණන් කෙනෙකු ලෙස උපසම්පදාවට පමුණුවන ලදී. කිරිමැටියානේ සුධම්මවංසාරාමාධිපති ධර්මාරාම හිමියන් වැලිතර අම්බරුක්ඛාරාමාධිපති අමරපුර ගණාචරිය කළුවාමෝදර බුද්ධසිරි තිස්ස හිමියන් වලානේ සුමනාරාමාධිපති අරියවංසාලංකාර මහකරාවේ සුගතවංස තිස්ස හිමියන් යන තෙරුන් වහන්සේලා කර්මාචාර්යන් වහන්සේලා වූහ.

## ශාසන ශාස්ත්‍රීය සේවය

සිය අධ්‍යාපනය නිමා කිරීමෙන් පශ්චිමව ලෝක ශාසනික සේවාව ආරම්භ කළ අප නාහිමිපාණන් වහන්සේ 1907 මැයි 17 තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස (පසුව මහානායක) හිමියන් රන්දොඹේ මහා චෛතියාරාමයේදී ආරම්භ කළ මහාචෛතිය පිරිවනෙහි උප ආචාර්ය ධුරයට පත්විය. එමෙන්ම පිරිවනෙහි සුභාෂාලංකාර ශිෂ්‍ය සමිතිය භාර ගුරුවරයා ලෙසද සිසුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට අප නාහිමිපාණන්ට හැකිවිය. 1927 වසරේදී තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ රෝගාතුර

වූ බැවින් ධම්මරක්ඛිත හිමි හිමිපාණන් පරිවේණාධිපති ලෙස පත්කර ගනු ලැබිණි. තමන් වහන්සේ රෝගාතුර වන තෙක්ම මහාචෛතිය පිරිවෙනෙහි පරිවේණාධිපතීන් වහන්සේ ලෙස මහත් මෙහෙවරක් ඉටු කරනු ලැබූ ධම්මරක්ඛිත නාහිමිපාණන් වහන්සේ පිරිවෙණෙන් ඉවත් වූ පසු පරිවේණාධ්‍යක්ෂ ලෙස අපවත් වන තෙක්ම තම කාලය දැනුම ශ්‍රමය ශාසන උන්නතිය සඳහා කැප කරුණු ලැබීය. 1913 වසරේදී නාග පුෂ්පාරාම අධිපති පදවියට පත්ව එතෙක් කුඩා ආරාමයක් ව පැවති එම විහාරස්ථානය තුන්බෝධිය සහිත අංගසම්පූර්ණ ස්ථානයක් බවට පත් කිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ඇත. අභිනව සංඝාවාසය ඉදි කිරීම, සණ්ඨාර කුළුණ සැකසීම, ධර්මශාලාව දානශාලාව සහ ගේට්ටුව සැකසීම, සීමාව බැඳ ශ්‍රී ජිනරතන පුස්තකාලය එහි උඩුමහලෙහි උඩුමහලේ ස්ථාපිත කරවා පුස්කොළ ත්‍රිපිටකය, මුද්‍රිත බුරුම අටුවා ටීකා ප්‍රකරණ පොත් තැන්පත් කරවීම, දඹදිවින් වැඩම කළ බෝධි අංකුරය රෝපණය කරවීම, ඇම්. සාර්ලිස් මහතාගේ කලා දායකත්වයෙන් රත්නසර ප්‍රතිමා මාලකය ඉදි කිරීම ආදිය කන්දේගොඩ නාග පුෂ්පාරාමයේ අභිවෘද්ධිය සඳහා නාහිමිපාණන් ඉටු කළ සේවය අතර කැපී පෙනේ. දැන උගත් යතිවරයෙකු වූ නාහිමිපාණන් වහන්සේ ශාස්ත්‍රීය වශයෙන් ඉටු කරන ලද සේවය ඉමහත්ය. පණ්ඩිතාචාර්ය මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවේණාධිපති රයිගම ඉන්ද්‍රජෝති නාහිමියන් විසින් පසස්නා ලද එවකට ආණ්ඩුකාර හෙන් රි ඊ. මැකලම් විසින් ප්‍රතිගෘහීත අප නාහිමිපාණන් විසින් සංශෝධනය කළ පාලි අලංකාර ශාස්ත්‍ර ග්‍රන්ථය වූ සුබෝධාලංකාරය, ලීනාර්ථ වර්ණනා සහිතව ප්‍රථම වරට සංශෝධනය කොට මුද්‍රණය කළේ ද නාහිමිපාණන් වහන්සේ යි. නාහිමිපාණන්ගේ ශාස්ත්‍රීය සේවා අතර

- ලීනාර්ථ වර්ණනා සහිත සුබෝධාලංකාරය (සංස්කරණ)
- වුත්තෝදය (සංස්කරණ)
- ශ්‍රී මහා බෝධි ප්‍රණාමය

වැනි කෘති රචනා කිරීම ප්‍රධානය. මේ හැරුණු විට තවත් කුඩා කෘති ගණනාවක්ම රචනා කර ඇතිමුත් ඒවායේ නම් සොයාගැනීම අපහසුව ඇත. කෙසේමුත් 1913 වසරේ ආරම්භ කළ කොළඹ තරුණ බෞද්ධ සංගමයට ධර්මපත්‍රිකා සම්පාදනය කළ ප්‍රධාන තෙරුන් වහන්සේ ද නාහිමිපාණන් වේ. 1913 එම වසරේම කොළඹ ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සාමාජිකත්වයට මාහිමිපාණන් පත් කරගත් අතර ඒ පිළිබඳ පිළිගැනීමේ උත්සවය 1913 දෙසැම්බර් 21 වනදා උත්සවශ්‍රීයෙන් පවත්වා ඇත. 1966 වර්ෂයේ දී ප්‍රාචීන භාෂෝපකාර සංගමය මගින් උන්වහන්සේගේ පාණ්ඩිත්වය අගයමින් සම්මාන පණ්ඩිත ගෞරව උපාධිය ප්‍රදානය කොට ඇත. වර්ෂ 1915 දී රාජකීය ආසියාතික සංගමයේ සාමාජිකත්වයට ද බඳවා ගනු ලැබූ උන්වහන්සේ තම දැනුමෙන් විවිධ සමිති සමාගම් හරහා සිදුකර ඇත්තේ ඉමහත් සේවයක් බව පෙනේ. බුද්ධ ජයන්තිය අවස්ථාවේ පාලි ත්‍රිපිටකයේ සංස්කරණය කිරීමේ අදහසක් මහා සංඝයා වහන්සේ තුළ ඇතිවුණි. ඒ අනුව පෑලියගොඩ විද්‍යාලංකාර පරිවේණස්ථානයට රැස්වූ ත්‍රෛනිකායික මාහිමිවරුන් අතර අමරපුර මහා නිකාය වෙනුවෙන් ප්‍රමුඛස්ථානය ගත්තේ ධම්මරක්ඛිත මහා නාහිමිපාණන් වේ. බුරුමයේ පැවැත්වූ ත්‍රිපිටක ධර්ම සංගායනාවට ප්‍රථම ඒ ඒ බෞද්ධ රටවල්වල උගතුන් ලවා ඒ ඒ රටවල්වල තිබූ ත්‍රිපිටකය ශුද්ධ කරවා ගෙන ඇත. බුරුම රජයේ සංකල්පයක් මත ඉටු කළ මෙම කටයුත්තේ දී ත්‍රිපිටක සංශෝධනය සඳහා පත් කළ

ප්‍රාදේශීය මණ්ඩල අතර අප නාහිමිපාණන් වහන්සේ ද ධර්ම සංගීතිය සඳහා එම දායකත්වය ලබා දී ඇත.

**ගරු තනතුරු**

- 1913 වසරේ ප්‍රාචීන භාෂෝපකාර සංගමයේ සාමාජිකත්වයට පත්වීම.
- 1915 වසරේ රාජකීය ආසියාතික සංගමයේ සාමාජිකයෙකු ලෙස පත්වීම.
- ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ ප්‍රධාන සභාපති ධුරයට පත්ව වසර තුනක් කටයුතු කිරීම.
- ගාලු වැලිබඩ පත්තුව ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුශාසක සහ ප්‍රධාන සභාපති ධුරවලට පත් වීම.
- අධ්‍යාපනය ලැබූ අවධියේ සිටම කාරක මහා සංඝ සභාවට ඇතුළත්ව කටයුතු කළ උදම්මිට ධම්මරක්ඛිත හිමිපාණෝ 1922 වර්ෂයේ දී මහා ලේඛකාධිකාරී ධුරයට පත් වූහ.
- 1925 වසරේ දී **අමරපුර වංසාවතංස තිපෙටකාචරිය අරියවංසාලංකාර සිරි** යන ගෞරව උපාධිය සහිතව අමරපුර මහා නිකායේ ශ්‍රීමත් අනුනායක පදවියට කාරක මහා සභාවේ අනුමැතියෙන් පත්විය.
- තොටගමුවේ පඤ්ඤාමෝලි මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීමෙන් හිස් වූ අමරපුර මහා නිකායේ මහා මහා නායක පදවියට **අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර** යන ගෞරව උපාධිය සහිතව කාරක මහා

සභාවේ ඒකඡන්දයෙන් උදම්මිට ධම්මරක්ඛිත තිස්ස අනුනායක ස්වාමීන් වහන්සේ පත් පත්කර ගන්නා ලදහ.

බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා කිහිප නමක් සසුන වෙත දායාද කිරීමට මහානායක හිමිපාණන් වහන්සේට හැකියාව ලැබුණි. උන්වහන්සේලා අතර

- රන්දොඹේ වජිරඤාණ තිස්ස හිමි
- රන්දොඹේ ධම්මිස්සර තිස්ස හිමි
- කැස්බෑවේ සංඝානන්ද තිස්ස හිමි
- හාල්දඬුවන ධම්මාලෝක තිස්ස හිමි
- පදවිගම්පල ධම්මදින්න තිස්ස හිමි

ආදීහු වෙති.

**විදේශ ගමන්**

ශ්‍රී ලංකාවේ නොයෙක් ආගමික ස්ථාන වන්දනා කළ නාහිමිපාණන් ඉන්දියාවේ බෞද්ධ පූජ්‍යස්ථාන වන්දනා කිරීමේ අදහසින් 1924 පෙබරවාරි මස 14 වනදා බොරැල්ලේ තිලකරත්නාරාමාධිපති රත්නපුරේ පඤ්ඤාලෝක හිමියන් ඇතුළු දායකකාරකාදීන් සමඟ ඉන්දියාව බලා වැඩම කළේය. කල්කටා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය රඹුක්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ මහ තෙරුන් වහන්සේ ද හමු වූ අතර කල්කටා විශ්ව විද්‍යාලයේ කුලපතිතුමන් ද හමුවිය. මෙම අවස්ථාවේ තමන් වහන්සේ ලියූ කෘති ගණනාවක් කල්කටා විශ්ව විද්‍යාලයට පරිත්‍යාගයක් ලෙස ද නාහිමිපාණන් ලබා දී ඇත.

## අපවත් වීම

සිය ජීවිතයේ අවසාන සමයේ ගිලන්ව වැඩ සිටි මහනාහිමිපාණන් එම සමයේ ද භාවනානුයෝගීව තම ආධ්‍යාත්මික දියුණුව සකස් කර ගැනීමට උත්සුකව ඇත. 1971 ජූනි මස 06 වනදා රාත්‍රී 07 ට පමණ ලොව ඇති වන සියලු දේ නැසෙන බව පෙන්වා දෙමින් අප මහානායක හිමිපාණෝ අපවත් වී වදාළහ.

අධිපතීත්වය දැරූ විහාරස්ථාන

- රන්දොඹේ කන්දේගොඩ නාගපුෂ්පාරාමය
- මීගමුව දෙමංහංදිය ධම්මරක්ෂිතාරාමය



**මහානායක හිමියන්ගේ අපවත්වීම**

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය

වනරත්න, රන්ජිත්. **අතිගරු ශ්‍රී ධර්මරක්ෂිත තිෂ්‍ය මහානායක ස්වාමීන්ද්‍ර චරිතය.** කොළඹ: සමයවර්ධන පොත් හල, 1971.

10 ත්‍රිපිටක පරියත්ති විශාරද, අග්ගමහා පණ්ඩිත අතිගෞරවාර්හ වලගෙදර සෝමාලෝක තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2513-2516,ක්‍රි.ව.1971-1974)





**ජන්ම ලාභය සහ ප්‍රව්‍රජාව**

කලින් කලට සම්බුද්ධ ශාසනය හෝ රැක ගැනීමට වියත් පඬිවරු මෙලක්දිව පහළ වන්නාහ. දකුණු ලක ගාලු දිසාවේ බලපිටි වලගෙදර නම් ග්‍රාමය මෙරට තුඩ තුඩ ප්‍රකට වූයේ එබඳු මහෝත්තමයෙකු නිසාවෙනි. වර්ෂ 1893 මාර්තු මස 15 වන බදාදා ලියනගේ අල්ලිස් ද සිල්වා පියතුමන්ට සහ පොඩිහාමි මව්තුමියට උපත ලැබූ ලිනයගේ රොබට් මාටින් ද සිල්වා එම පින්වත් කුල කුමරායි. නිසි වයස එළැඹි පසු අධ්‍යාපනය සඳහා අකුරු කියවීම බලපිටියේ අමරසේකර වලව්වේ ඇල්ෆ්‍රඩ් මැන්දිස් අබේසේකර මහතා විසින් සිදුකරන ලද අතර බලපිටියේ ස්වභාෂා බෞද්ධ මිශ්‍ර පාඨශාලාවෙන් මූලික අධ්‍යාපනය ලද්දේය. කුඩා කල සිටම පැවිදි වීමේ පරමාභිලාශයෙන් සිටි මෙම කුල කුමරා මැණියන් විසින් රන්දොඹේ මහා චෛතිය පරිවේණාධිපති තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් වෙත භාර කරන ලදී. එහෙත් දෙවරක් ම දරුවා කුඩා බැවින් පැවිදි කළ නොහැකි බව දන්වා පාසැල් ලබන ලෙස උපදෙස් දී මව සමග ම පිටත් පිටත් කර හැරීමට තොටගමුවේ නාහිමියන් කටයුතු කර ඇත. එක් දිනක් රිදී පැහැති නයි පැටියෙකු තමන් වහන්සේ වෙත පැමිණෙනු දුටු උන්වහන්සේ දොර වසා දැමුවද ඒ අස්සෙන් පැමිණ තම දකුණු අතට දෂ්ඨ කරන ස්වප්නයක් දුටුවේය. එදින මීගමුව උදම්මිට උත්තමාරාමයට වැඩම කිරීම සඳහා දුම්රිය පොළ වෙත ගියත් උන්වහන්සේට දුම්රිය ද මඟ හැරුණි. ආපසු විහාරස්ථානයට පැමිණි උන්වහන්සේ දුටුවේ පැවිදි කිරීමේ පෙරැත්තය මත තෙවැනි වර ද පැමිණ සිටින මව සහ කුල කුමරායි. රාත්‍රියේ දුටු සිහිනයත් මෙම කුඩා දරුවා ගේ පැවිද්ද පිළිබඳ සුබ

සිහිනයක් ලෙස සැලකූ තොටගමුවේ හිමියන් දරුවා පැවිද්ද සඳහා භාරගෙන ඇත. මෙලෙස පැවිද්ද සඳහා මූලික බණ දහම් ඉගෙන ගන්නා අතර තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් සමඟ කොළඹ මෝදර අලුත් මාවතේ පදිංචි වෛද්‍යාචාර්ය ඩබ්.ඒ.ද. සිල්වා මහතාගේ නිවසේ දානයකට යාමට සිදුවිය. එහිදී මේ පින්වත් දරුවා දුටු ඒ මහතා තමන් විදේශගතව නැවත පැමිණෙන තුරු දරුවා මහන නොකරන ලෙස තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන්ගෙන් ඉල්ලා සිටියි. ඒ අනුව වසරකට අධික කාලයක් ප්‍රමාද වන පැවිද්ද 1905 මාර්තු 06 වැනි බ්‍රහස්පතින්දා මීගමුවේ සුගතාරාමාධිපති ශ්‍රමම්මවංසාවතංස මීගමුවේ ධම්මරතන තිස්ස හිමියන්ගේ උපාධ්‍යායත්වයෙන් තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන්ගේ ආචාර්යත්වයෙන් වලගෙදර සෝමාලෝක නමින් පැවිදි කරවන ලද්දේය.

## ආචාර්ය පරපුර

වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය චිර ප්‍රසිද්ධියට පත්වූයේ ඉන් පහළ වූ ප්‍රබුද්ධ යතිවරයාණන් වහන්සේලා නිසාමය. ඒ අනුව අමරපුර මහා නිකායේ තෙවැනි මහනායක පදවිප්‍රාප්ත මහකරාවේ විමලසාර තිස්ස හිමියන්ගේ කීර්තිමත් ශිෂ්‍ය පුත්‍ර වැලිතර අම්බරුක්ඛාරාම නිවැසි රන්දොඹේ මහාචේතිය පරිවේණාධිපති සහ තත් විහාරාධිපති තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස නාහිමියෝ වලගෙදර සෝමාලෝක තිස්ස හිමියන්ගේ ආචාර්යන් වහන්සේ වූහ.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

උගත් පඬිවරයෙකු වූ තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් වෙතින්ම භාෂා ශාස්ත්‍රය ද තර්ක ශාස්ත්‍රය ද මැනවින් උගත් අප හිමිපාණන් රන්දොඹේ මහාචෛතිය පිරිවෙනටම ඇතුළුව මූලික පිරිවෙන් අධ්‍යාපනය හදාරණ ලදී. පරිවේණස්ථ සුභාෂාලංකාර ශිෂ්‍ය සංගමයේ ලේකම් හිමි ලෙස සය වසක් ද පිරිවෙනෙන් ප්‍රාචීන භාෂෝපකාර සංගමයේ විභාගයන් ලියා පළමුවන්නා ද විය. 1915 වසරේ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයෙන් ධම්මකුසල ත්‍යාගය සහිතවද 1918 වසරේ මධ්‍යම විභාගයෙන් සෙනෙවිරත්න ත්‍යාගය සහිතව 1926 වසරේ අවසාන විභාගය වෛද්‍යශේඛර යාගය සහිතවද ප්‍රථම පන්තියේ ප්‍රමුඛයා වශයෙන් සමත් විය. මැනවින් ධර්ම ශාස්ත්‍ර ඉගෙන ගත් පසු පැවිදි කිරීම වසරකින් කල් දැමීමට සිදු වූ ඩබ්.ඒ.ද සිල්වා මහතාගේ ආරාධනාව පරිදි රන්දොඹේ මහා චෛතිය පිරිවෙනදීම 1910 වසරේ ජුනි 28 වැනිදා රාත්‍රී 09 සිට පැය දෙකකට ආසන්න කාලයක් මගුල් බණ දෙසීය. මෙම පිංකම සඳහාම සෝමාලෝක හිමියන් නමස්ක්‍රියාශීර්වාද නම් පාලි සිංහල පද්‍ය දහයකින් යුතු නිර්මාණය ලියා ඇත.

## උපසම්පදා ප්‍රතිලාභය

බණ දහම් හදාරා දහම් දැනුමින් පරිපූර්ණ තත්ත්වයට පත්ව සිටි සෝමාලෝක සාමණේරයන් වහන්සේ වර්ෂ 1913 පොසොන් පුර පොහෝදා උපසම්පදා ශීලයට පත් කරන ලදී. බල පිටි මෝදර උදකුක්ඛේප සීමාවේදී සිදුකළ මෙම උපසම්පදා පින් කමේදී සෝමාලෝක සාමණේරයන් වහන්සේට උපාධ්‍යාය වූයේ මීගමුවේ

ධම්මරතන තිස්ස මාහියෝය. තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස, උදම්මිට ධම්මරක්ඛිත තිස්ස, මාදූවේ ධම්මානන්ද යන තිස්ස හිමිවරුන් කර්මාචාර්යන් වහන්සේලා විය.

**ශාසන ශාස්ත්‍රීය සේවය**

ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත්වීමෙන් පසුව උන් වහන්සේ සතු වූ මහත් ඥාන ඤාණ සම්භාරය නිසා රන්දොඹේ මහාචේතිය පිරිවෙන් ශිෂ්‍යාචාර්යවරයෙකු ලෙස පත්කර ගැනුණි. මධ්‍යම විභාගයෙන් සමත් වූ පසු උප ආචාර්ය ධුරයකට ද අවසාන උපාධියෙන් පසු උප ප්‍රධානාචාර්ය ධුරයටත් පත්කරගෙන ඇත. මේ කාලය තුළ බොහෝ පඬිවරුන් රැසක් රන්දොඹේ මහාචේතිය පිරිවනෙන් දායාද කිරීමට උන් වහන්සේට හැකි විය. 1929 වසරේ පරිවේණාධිපතීන් වහන්සේ ලෙස මහත් සේවයක් පිරිවනේ උන්නතියට සිදුකරන ලදී. කුඩා කල සිටම ලේඛකයකු ලෙස ලක්මිණ, සරසවි සඳරැස, ස්වදේශ මිත්‍රයා, දිනමිණ, සිළුමිණ, ලංකාදීප, දවස, රිවිරැස, සිංහල ජාතිය, සිංහල බලය, පෙරමුණ වැනි බොහෝ පුවත්පත් සඳහා ලිපි රැසක් සපයා ඇත. කෘතහස්ත ලේඛකයකු එලෙස තමන්වහන්සේගේ පාණ්ඩිත්‍ය ප්‍රකට කරමින් ලියූ කෘතීන් අතර

1. දීඝ නිකාය (1954)
2. අපදාන පාළි 1 භාගය (1957 - හේවාවිතාරණ ත්‍රිපිටක ශුද්ධිය වෙනුවෙන්)
3. සිංහල මැදුම් සඟිය (අම්බලම්ගොඩ සද්ධර්ම ප්‍රචාරක සමිතියේ ඇරැයුමින්)
4. උදාන පාළිය සහ උදානපාළි සාරය (1966)
5. විනය විනිච්ඡය
6. පරමාර්ථ චින්තාමණී (අභිධර්ම කෘතියකි.)
7. කුස ජාතක කාව්‍ය සංග්‍රහය

8. අමාවතුර
9. පූජාවලිය
10. උද්ධෘත අමාවතුර
11. මුවදෙව්දාවත (1966)
12. සද්ධර්මාවවාද සංග්‍රහය
13. අභිධර්මාර්ථ සංග්‍රහය (ආචාර්ය තොටගමුවේ මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් තෙවරක් වරක් පළ කරවූ ටීකාචරිය සිරි සාරිපුත්ත සංඝරාජ මහා ස්වාමීන්ද්‍ර ප්‍රණීත විස්තරාර්ථ වර්ණනාව සහිත භදන්ත ශ්‍රී අනුරුද්ධ මහා ස්වාමීන්ද්‍ර ප්‍රණීත අභිධර්මාර්ථ සංග්‍රහය සංස්කරණය කළ අප කථානායකයන් වහන්සේ 1950. 11. 12 දින සිවුවැනි වරටද එම ග්‍රන්ථය මුද්‍රණද්වාරයෙන් එළි දැක්වූහ.)
14. අපදානට්ඨ කථා (1929 හේවාවිතාරණ අට්ඨකථා ශුද්ධිය වෙනුවෙන් පින්වත්තේ සීලානන්ද, වැලිවිටියේ සෝරත නායක මා හිමිවරුන් සමග)
15. සසදාවත [25]

මෙවැනි කෘතීන් ප්‍රධාන වේ.

1954 වසරේ ත්‍රිපිටක පරිවර්තන කාරක සභාවටත් සිංහල විශ්වකෝෂ කාරක සභාවටත් තෝරා පත්කරගත් උන්වහන්සේට පටිසම්භිදා මග්ග පාළියේ මහාවග්ගය සීහළ බසට පරිවර්තනය කිරීමට ආරාධනා කර ඇත.

සම්බුද්ධ ශාසන ඉතිහාසයේ ථේරවාදී ධර්ම සංගායනා හයක් සිදුව ඇති අතර බුරුමයේ සිදුවූ හය වැනි ධර්ම සංගායනාව එම සංගායනාවලියේ අවසන් එකයි. ඒ අනුව 1952 වසරේ දෙසැම්බර් 16

[25] රවීන් කෝදාගොඩ. **චරිත බිංදු** (දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2023) 67.

දා සිට ලංකාවේ බුරුම සංගායනා උත්තරීතර විධායක සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ උන් වහන්සේ 1953 නොවැම්බර් 16 වනදා හය වැනි ධර්ම සංගායනාවේ ත්‍රිපිටක සංශෝධනය සඳහා බුරුමයට වැඩම කළේය. දීඝ නිකාය, මජ්ඣිම නිකාය සහ සංයුත්ත නිකාය යන කොටස් සංශෝධනය සඳහා පුරා තුන් මසක් තම කාලය දැනුම ලබාදුන් උන්වහන්සේට බුරුම සංඝයා විසින් ත්‍රිපිටක පර්යාපත්ති විශාරද යන ගෞරවෝපාධිය ප්‍රදානය කිරීමට සම්මත කරගන්නා ලදී. එම සන්නස්පත්‍ර ශ්‍රී ලංකාවට එවන ලදුව අග්‍රාමාත්‍ය ජෝන් කොතලාවල මැතිතුමා විසින් මහා චෛතිය පිරිවෙනේදී නාහිමියන් වෙත එම සන්නස්පත්‍ර ප්‍රදානය කරන ලදී.

- සංගායනාවේ ප්‍රධාන නායක භදන්ත රේවතාභිධජ මහාරට්ඨගුරු ඤෞාං සයාඩෝ මහානාහිමියන් නිකුත් කළ ගාරවොපාධි සඤ්ඤත්ති නම් සන්නස් පත්‍රය
- ත්‍රිපිටක කෝවිද විචිත්තසාරාභිවංස හිමියන් නිකුත් කළ අභිත්ථව පුබ්බිකා ගාරවොපාධි සඤ්ඤත්ති නම් සන්නස් පත්‍රය
- සගාථකවග්ග පටිවිසෝධක සහ පාටිකවග්ග පටිවිසෝධක හිමිවරුන් එවූ සන්දේශ ඇත.

ජාත ග්‍රාමය වන වලගෙදර 1943 දී පාසලක් ආරම්භ කිරීම තලාවේ සහ පනාපිටිය කොළනි පාසල් අරඹා රජයට බාරදීම මොරගලු විද්‍යාලය, මාදම්පාගම කණිෂ්ඨ විද්‍යාලය ඇරඹීමට මුල්වීම මුන්වහන්සේගේ අධ්‍යාපනික සේවයේ තවත් ඵලයකි. 1936 වසරේ ඉන්දියාවේ පූජ්‍යස්ථාන දැකබලා වන්දනා කරගත් නාහිමිපාණන් එම රටෙහි විශ්වවිශ්වවිද්‍යාලයන්ගේ අධ්‍යාපන කර්මය පිළිබඳ

අධ්‍යයනයක නියැළුණේ ය. අවස්ථා කිහිපයකදීම බුරුමයට සහ ඉන්දියාවට වැඩම කළ උන්වහන්සේ 1952 වසරේ දී දෙවන ලෝක බෞද්ධ මහා සම්මේලනයට අමරපුර මහා නිකායේ නියෝජිතයා ලෙස වැඩම කළේය. 1958 වසරේ බැංකොක් හි පැවති පස්වැනි ලෝක බෞද්ධ සම්මේලනය ලංකාවේ නියෝජිතයකු ලෙස තායිලන්තයට ද වැඩම කොට ඇත. මේ වන විට කොටස් ගණනාවකට කැඩී තිබූ අමරපුර මහා මහ නිකාය ඒකරාශී කිරීමේ මහා උත්සාහයෙන් කටයුතු කළ උන්වහන්සේට 1953 වසරේ දී අමරපුර මහා නිකායයේ කොටස් පහක භික්ෂූන් වහන්සේලා ඒකරාශි කොටගෙන ඒකාබද්ධ උපසම්පදාවක් බල පිටි මෝදර උදකුක්ඛේප සීමාවේදී සිදුකිරීමට හැකිවිය. 1922 වසරේ දී අමරපුර මහා නිකායේ සම ලේඛකාධිකාරී ධුරය ද 1947 වසරේ දී ප්‍රධාන අනු විජ්ජක ධුරයද 1948 ජනවාරි 31 වනදා මහා ලේඛකාධිකාරී පදවියද ලැබුණි. 1949 අගෝස්තු 10 වනදා නිකාය වෙනුවෙන් ව්‍යවස්ථාවක් සකස් කොට සංඝ සභාවට ඉදිරිපත් කර සම්මත කරගත් උන්වහන්සේ උදම්මිට ධම්මරක්ඛිත තිස්ස මහා නායක හිමියන්ගේ අපවත් වීමෙන් පසු හිස් වූ මහානායක මහා නායක පදවියටද නිකායික සංඝයා විසින් පත් කර ගන්නා ලදී. 1928 වසරේ ප්‍රාචීන භාෂෝපකාර සංගමයේ සාමාජික පසුව කාරක සභික ධුරයකට 1958 වසරේ රාජකීය ආසියාතික සංගමයේ සාමාජික 1959 වසරේ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන සභා පාලක මණ්ඩල සාමාජික 1960 වසරේ උපදේශක සභා සාමාජික 1959 වසරේ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ සනාතන සභා සාමාජික පිරිවෙන් උපදේශක සභාවේ සාමාජික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පොදු ආගමික මණ්ඩල සාමාජික සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාවේ සම ලේඛකාධිකාරී ධුරය ආදියද හොබවා

ඇත. මහා විනයධර හිමි නමක ලෙස ප්‍රසිද්ධව සිටි නාහිමියන් 1949 වසරේ ජූලි 01 වනදා දඬුගම් ඔයේ අමරපුර නිකායේ කොටස් කිහිපයක සංඝයා එකතුව පැවැත්වූ උපසම්පදාවට සහභාගීව ඇත. දෙනමක උපසම්පදා කර අවසන් වූයෙන් තෙවන උප සම්පදාව ආරම්භයේ දී නාහිමියන් සීමාවට වැඩම කළේය. එහෙත් එම උපසම්පදාව විනයානුකූල නොවන බව දුටු උන්වහන්සේ නිහඬව නොසිට එම උපසම්පදාව විනය විරෝධී බව ප්‍රකාශ කළේය. මූලාසනාරූඪ වැඩ සිටි මහ තෙරුන් වහන්සේ උපසම්පදාව විනයානුකූල බවම කියා ඇත. කෙසේමුත් උපසම්පදාව විනයානුකූල නොවන බව නොපිළිගත් සංඝ සභාව වෙත උන්වහන්සේ තම මතය සනාථ කිරීමට අනුගමනය කළේ අපූරු ක්‍රියාවකි. තුන්වන විනය කර්මය අවසන් වූ ගමන් පාරුවකින් ගොඩට පැමිණ ආසන්න විහාරයකට ගොස් විනයකර්ම පොතක් ගෙන නැවත සීමාවට වැඩම කොට විනය කර්ම පොත පෙන්වා උපසම්පදාව විනයානුකූල නොවන බව සනාථ කළේය. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ පෙර උපසම්පදා කළ තුන් නම ද නැවත උපසම්පදා කිරීමයි.[26]


**අපවත් වීම**

අමරපුර මහා නිකාය ජාත්‍යන්තර වශයෙන් කීර්තියට ලක් කළ වලගෙදර සෝමාලෝක තිස්ස මාහිමියන් මනා ශාසනික ක්‍රියාවන්හි නියැලුණු සුපේෂල ශික්ෂාකාමී මහ තෙර නමකි. 1970 වසරේ සිට වරින් වර රෝගාතුර ව සිටි උන්වහන්සේ 1974 දෙසැම්බර් මස 21 වන සෙනසුරාදා දින ස්වර්ගස්ථ වදාළහ. නා හිමියන්ගේ ශ්‍රී දේහය

---

[26] තොටගමුවේ පඤ්ඤාසාර ස්ථවිර, **සම්භාවනා** (කොළඹ: ඉන්දික මුද්‍රණාලය, 1975), 38-39.

පිළිබඳ ආදාහන පුණ්‍යෝත්සවය එම මස 28 වැනි සෙනසුරාදා වතුගෙදර නගරසභා පිටියේ ගෞරවයෙන් සිදු කරන ලදී.



අනිත්‍යානු ස්මෘති පූර්වකව කරනු

ලබන දැනුම් දීමයි.

රත්දෙණියේ, මහාචේතිය පරිවෙණාධිපති
ත්‍රිපිටක පර්යාප්ති විශාරද, රාජකීය පූජ්‍ය පණ්ඩිත ධර්මකීර්ති ශ්‍රී

වලගෙදර සෝමාලෝක තිස්සාභිධාන

අමරපුර මහා නිකායේ අතිගරු මහා නායක ස්වාමීපාදයන්
වහන්සේ මේ මස 21 වෙනි දින අපවත්වී වදාළ සේක.
එම ශ්‍රී දේහය පිළිබඳ ආදාහන පූජෝත්සවය

මේ මස 28 වෙනි දිනට පත්
පුරපසළොස්වක් පොහෝදා

වතුගෙදර නගර සභා භූමියේදී සිදුකරනු ලැබේ.
පස්වරු 1 00 ට ආදාහන පෙරහැර මහචෙතිය පිරිවෙනින් පිටත්වේ.

මීට,
මාදම්පේ සෝමාරාම තිස්සාභිධාන
අමරපුර මහා නිකායේ ප්‍රධාන
අධිකරණ නායක ස්වාමීන් හා
දායක සභාව.

1974 දෙසැම්බර් 23 දින
රත්දෙණියේ මහාචේතිය පිරිවෙන,
අම්බලන්ගොඩ.

සෑ. පිරිස — පරණගම.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය


කෝදාගොඩ, රවීන්. **චරිත බිංදු.** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2023.


- මෙම මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීමෙන් පසු නිකාය කොටස් දෙකකට බෙදී මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දෙනමක් යටතේ පාලනය වෙයි.

11 (11.1)අමරපුර ගණපාමොක්ඛාචරිය සිරිසුගත සාසන කවිධජ විනයාචරිය අතිගෞරවාර්හ උදම්මිට ධම්මාලංකාර තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2516-2521,ක්‍රි.ව.1974-1979)





**ජන්ම ලාභය සහ ප්‍රව්‍රජාව**

උදම්මිට ධම්මරක්ඛිත තිස්ස අමරපුර මහා නිකායේ ශ්‍රීමත් මහානායක පදවිය දැරූ මහනායක ස්වාමීන් වහන්සේට ද ජාතභූමිය වූ උදම්මිට පෙර රජ දවස මහරහතන් මහා රහතන් වහන්සේලාගේ පා පහස ලැබූ ශුද්ධ භූමියකි. ඒ ගම විදානආරච්චි ගෙදර විසූ අරුමාදුර තෝබියස් ද සිල්වා විදාන ආරච්චි මහෝපාසකතුමන්ට සහ කළුදුර සොපියා නෝනා උපාසිකාවට දාව 1896 වර්ෂයේ දෙසැම්බර් මස 01 වැනි ඉරිදා දින උදම්මිට ධම්මාලංකාර හිමියෝ ජන්මය ලදහ. උපතින් වසර පහක් පිරුණු දා පටන් රද්දොළුව සිංහල පාසලට ඇතුළත්ව 1906 වසර දක්වා එම පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබුවේ ය. පසුව අලවතුපිටියේ පාසලට ඇතුළත්ව තවදුරටත් අධ්‍යාපනය හදාළ මේ කුල කුමරුවා ළමා අවධියේ පටන් ශ්‍රද්ධාවන්තව තුනුරුවන් කෙරෙහි අතිශය ප්‍රසන්නව කටයුතු කළේය. උදම්මිට ග්‍රාමයෙහි පිහිටා තිබූ ශ්‍රී උත්තමාරාමය නම් ලද පෞරාණික මහා විහාරය ගම්පොල යුගයටත් එහා ගිය දීර්ඝ ඉතිහාසයකින් යුක්තය. එකල විහාරස්ථානයේ පැවති නොයෙක් පින්කම් සඳහා සහභාගීවන මෙම කුල කුමරු දුටු විහාරාධිපති මීගමුවේ සංඝතිස්ස මහා තෙරණුවන් වහන්සේ සිල්වා කුල කුමරුගේ මවුපියන් සමඟ ද සාකච්ඡා කොට අත පැන් වඩා ශාසනයට පූජා කරවූහ. පැවිද්ද පිළිබඳව ලද යුතු මූලික අවබෝධය සංඝතිස්ස හිමියන් වෙතින් ලද ඔහු 1910 වසරේ මාර්තු මස 24 වනදා උදා වූ ශුභ මොහොතින් උදම්මිට උත්තමාරාමයේ දී මීගමුවේ සංඝතිස්ස හිමියන් සහ උදම්මිට ධම්මරක්ඛිත තිස්ස හිමියන්ගේ ආචාර්යත්වයෙන් උදම්මිට ධම්මාලංකාර යන නාමයෙන් සාසන දායාදය ලද්දේ ය.

## ආචාර්ය පරපුර

පැවිද්දට පත් වන විට උදම්මිට ශ්‍රී උත්තමාරාම පුරාණ විහාරාධිපත්‍ය දැරූ ශාසනවංශාලංකාර කවිධජ මීගමුවේ සංඝතිස්ස මාහිමියන් සහ පසුකලෙක මහානායක පදප්‍රාප්ත උදම්මිට ධම්මරක්ඛිත තිස්ස හිමියන් ද ආචාර්යව ප්‍රව්‍රජාවට පත් විය. උපසම්පදා මංගල්ලයේ දී ශ්‍රී සංඝතිස්ස හිමියන් ආචාර්යන් වහන්සේ විය.[27]

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

පැවිද්දෙන් අනතුරුව උදම්මිට පඤ්ඤාවාස තිස්ස, උදම්මිට බුද්ධප්පිය තිස්ස, අහුන්ගල්ලේ සීලාලංකාර තිස්ස වැනි උගත් මාහිමිවරුන් වෙතින් තවදුරටත් පැවිද්දට අදාළ මූලික දහම් දැනුම ලත් ධම්මාලංකාර සාමණේරයන් වහන්සේ රන්දොඹේ මහාචෛතිය පිරිවනට ඇතුළත්ව තවදුරටත් තම ඥානය වර්ධනය කර ගත්තේ ය. උසස් පාරිවේණික අධ්‍යාපනය සඳහා හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් විසින් සමාරබ්ධ මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙනට ඇතුළත් ව සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂාවන් පිළිබඳ මෙන්ම ධර්ම විනය පිළිබඳ ද මනා පරිචයක් ලබා ගෙන ඇත.

## උපසම්පදා ප්‍රතිලාභය

පැවිද්දෙන් පසු පිරිවෙන් අධ්‍යාපනය ලබමින් සිටියදී විසි වයස් සපිරුණු ධම්මාලංකාර සාමණේරයන් වහන්සේ ශුද්ධ වූ

---


[27] මුන්වහන්සේගේ ආචාර්ය පරපුර උදම්මිට ධම්මරක්ඛිත තිස්ස මහානායක ස්වාමීන්ද්‍ර චරිතාපදානයෙන් දත යුතුයි.

උපසම්පදාවේ හි පිහිටුවීමේ අපේක්ෂාව ආචාර්යයන් වහන්සේලා ට ඇති විය. ඒ අනුව වර්ෂ 1916 ජූලි මස 10 වනදා අමරපුර මහා නිකායික උපසම්පදා සීමා මාලකය වූ බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවට රැස් වූ අතිරේක විංශත් වර්ගික මහාසංඝයා වහන්සේ ධම්මාලංකාර සාමණේරයන් වහන්සේ සාමණේර බවින් මුදවා උපසම්පදාවට පත් කළහ. එම උපසම්පදාවේදී මීගමුවේ සංඝතිස්ස හිමියන් ආචාර්ය වූ අතර රන්දොඹේ මහාචෛතිය පරිවේණාධිපති අතිගරු තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක හිමියන් උපාධ්‍යාය විය. කර්ම වාක්‍ය දේශනා කළේ උදම්මිට ධම්මරක්ඛිත තිස්ස, උදම්මිට බුද්ධප්පිය තිස්ස, උදම්මිට පඤ්ඤාවාස තිස්ස යන නායක ස්ථවිරයන් වහන්සේලායි.

**ශාසන ශාස්ත්‍රීය සේවය**

බුදුන්වහන්සේ ගේ මග පෙන්වීම අනුව යමින් නොපැහැදුණු දනන් පැහැදවීමට ද පැහැදුණු දනන් වඩාත් පැහැදවීමට ද නාහිමියන් කටයුතු කළ අතර බොහෝ දිනවල උන්වහන්සේ මහමඟ පිඬුසිඟා වැඩීම මෙයට එක් නිදසුනකි. සිය දහම් අධ්‍යාපනය නිමාවීමෙන් පසුව දහම් චාරිකාව ඇරඹූ උන්වහන්සේ ධර්ම දේශකයාණන් වහන්සේ නමක ලෙස බොහෝ කීර්තියට පාත්‍රව සිටියේය. ස්වකීය ආචාර්ය පාදයන් වහන්සේ වූ මීගමුවේ සංඝතිස්ස හිමියන්ගේ අපවත් වීමෙන් පසුව 1937 වසරේ උත්තමමාරාමාධිපත්‍යට පත් වූ නාහිමියන් ජරාවාසව තිබූ පැරණි විහාරය එහි පෞරාණික අගයට හානියක් නොවන සේ ප්‍රතිසංස්කරණ කළේය. ගමේ දූ දරුවන් සඳහා ශ්‍රී සංඝතිස්ස ධර්ම විද්‍යාලය ද සිරි ධම්මාලංකාර දහම් පාසල ද ආරම්භ කළ අතර ඉන් සමාජයට දායාද වූ ගුණ නැණ බෙලෙන් යුතු දරුවන්

රැසකි. සුරාපාන දෝෂ සංදර්ශනය වැනි නාහිමිපාණන් අතින් ලියැවුණු කුඩා ධර්ම ග්‍රන්ථ රැසකි.


සබ්බදානං ධම්මදානං ජිනාති

සුරාපාන දෝෂ

සංදර්ශනය

උදම්මිට උතනාමාරාමාධිපති
සුගත සාසන ශිරි කවිධජ සඞ්ඝතිස්ස මහාස්ථවිර
පාදයන්වහන්සේගේ ශිෂ්‍ය

උදම්මිට ධම්මාලඞ්කාර තිස්ස

ස්වාමීන්වහන්සේ විසින්
ජේ. ඩී. කෝබියෙස් ද සිල්වා උපාසක මහතාගේ
ආරාධනයෙන් ලියන ලදී.


පරලෝ සැපත්
මාදම්පේ තුඩිඝාහන්දි ජුවානිස් ද සිල්වා ජයතිලක
වෙදමහතාට පිං පැමිණවීමපිණිස භාත්දුහිතෘවූ
පී. එච්. ගසවති ජයතිලක හෝනා මහත්මියවිසින්

නොමිලේ දිමපිනිස

විද්‍යාදර්පණ යන්ත්‍රාලයේ මුද්‍රණයකරවනලදී

2471
1927

මෙසේ ලෝකශාසනික සේවාවේ යෙදී සිටියදී 1965 වසරේ **සිරි සුගත සාසන සිරි කවිධජ, විනයාචාර්ය** යන ගෞරවාභිධානය සහිතව අමරපුර මහා නිකායයේ සම්මාන නායක පදවියක් ලැබූ නාහිමියන් 1972 වසරේ දී සංඝානුමතයෙන් අනුනායක පදවියට පත් ව වදාළහ. වලගෙදර සෝමාලෝක තිස්ස අමරපුර මහා නිකායයේ මහා නායක ස්වාමීන් වහන්සේ 1974 වසරේ දෙසැම්බර් 21 වැනිදා අපවත් වීමෙන් පුරප්පාඩු වූ මහානායක පදවිය කාරක මහා සංඝසභාවේ අනුමැතියෙන් **අමරපුර ගණපාමොක්ඛාචරිය** යන ගෞරවෝපාධිය සහිතව අප උදම්මිට ධම්මාලංකාර තිස්ස අනුනාහිමියන් වෙත ප්‍රදානය කරන ලදී. මෙලෙස ස්වනිකායාභිවෘද්ධිය සඳහා මහත් සේවයක් කළ නාහිමිපාණන් කලක් ජා ඇල ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන සභාපති ධුරයට පත්ව ප්‍රදේශයේ බුද්ධ ශාසනය බැබළවීමට නොයෙක් පිංකම් ආදිය කරමින් කටයුතු සම්පාදනය කළේය. 2023 වසරේ ජනවාරි 27 වනදා අපවත් වී වදාළ අමරපුර මහා නිකායයේ වැඩබලන මහානායක පදවිය දැරූ උදම්මිට අස්සජී තිස්ස නාහිමිපාණන් අප උදම්මිට ධම්මාලංකාර තිස්ස මහානාහිමියන්ගේ ශාසනික වැඩපිළිවෙළ ඉදිරියට ගෙන ගිය ප්‍රධානම ශිෂ්‍යවරයාණන් වහන්සේයි.



සුගත සාසන සිරි කාවිධජ සඩ්ඝතිස්ස විනයාචරිය නාම සම්මුතිය
සම්මාන නායක
ශාසනවංසධජ අරියවංසාලඞ්කාර කම්මාචරිය
අමරපුර මහා නිකායේ අනුනායක
මීගමු - හලාවත දෙපලාතේ ශ්‍රී සද්ධර්මෝදය
මහා සංඝ සභාවේ සභාපති
ජා ඇල ප්‍රාදේශීය සංස්කෘතික මණ්ඩලයේ සභාපති
ද. අ. කු. කෝරලේ (ඒ) ප්‍රාදේශීය
ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති

ශ්‍රී උදම්මිට ධම්මාලංකාර තිස්සාභිධාන
නායක ස්ථවිර

25..... ....... මස
1976 ....... 18 වෙනි දින

උත්තමාරාම පුරාණ විහාරය,
උදම්මිට - ජාඇල.

ගරු ස්ථවිරයන්වහන්ස,

[illegible]

අසූවන ජන්ම දින පින්කමට වැඩමවන ලෙස නාහිමිගේ අත්අකුරුන් ලියූ ආරාධනාවක්

## අපවත් වීම

වසර අසූතුනක දීර්ඝායුෂක් විඳි අප මහානායක මා හිමියෝ 1979 වසරේ ඔක්තෝබර් මස 14 වන ඉරිදා මනා සති සම්පජඤ්ඤයෙන් අපවත් වී වදාළහ.




මහාචේතිය පිරිවෙනේ දී ශාසනවංශධජ අරියවංශාලංකාර කර්මාචාර්ය ගරුනම් සහිතව අනුනායක පදවිය වලගෙදර සෝමාලෝක තිස්ස මහානාහිමි විසින් පිරිනැමීම

**ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය**

**අතිගරු උදම්මිට ධම්මාලංකාර තිෂ්‍ය මහානායක ස්වාමීන්ද්‍ර චරිතය**, ආදාහන කමිටුව මඟින් ප්‍රකාශිතයි, 1979.

12 (11.2) අමරපුර ගණපාමොක්ඛාචරිය ඥානවිමලවංශාලංකාර ධීරවීර ප්‍රවචන කීර්ති ශ්‍රී සාසනජෝති රාජකීය පණ්ඩිත අතිගෞරවාර්හ බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2521-2545, ක්‍රි.ව.1974-2003)





**ජන්ම ලාභය හා ප්‍රව්‍රජාව**

ශ්‍රී ලංකාවේ දකුණුදිග ගාල්ල දිස්ත්‍රික්කයට අයත් බලපිටිය බොහෝ යතිවරුන්ට ජන්ම භූමිය වූ පින් බිමකි. මහනුවර රාජසභාවේ මහාදිකාරම් ධුරය දැරූ ඇහැලේපොළ මහ අධිකාරම්තුමාගේ පරම්පරාව ආරම්භ වන්නේ මෙම බලපිටිය ග්‍රාමයේ බ්‍රාහ්මණ වත්ත ගම් පියසෙනි. එම පරපුරටම ඥාතීත්වය ඇති මිගලහන්දි පේද්‍රික් ද සිල්වා පියතුමන්ට සහ තෙල්වත්තේ ලද්දූලයත් හාමිනේ මව්තුමියට දාව දරුවන් පස්දෙනෙකුගෙන් යුත් පවුලේ සිව් වැන්නා ලෙස 1915 අප්‍රේල් 15 වැනිදා අප නාහිමිපාණෝ උපත ලදහ. මිගලහන්දි ඇල්බට් ද සිල්වා යන මවුපියන් විසින් තබන ලද නාමය ඇති මෙම කුල කුමරු ප්‍රාථමික ඉගෙනුම බලපිටිය කනිෂ්ඨ විද්‍යාලයෙන් ද පසුව බලපිටිය සිද්ධාර්ථ මහා විද්‍යාලයෙන් ද ලබා ගත්තේය. කුඩා කල සිටම ඉගෙනුමට දස්කම් පෑ ඔහු සෑම වසරකම පන්තියේ පළමුවැන්නා ලෙස පාසලේ දීප්තිමත් ශිෂ්‍යයකු බවට පත් විය. මෙම දස්කම් ඇති කුල කුමරුවා දොළොස් වන වියේදී පැවිදි කිරීම සඳහා සිත් ඇතිව මවුපියන් විසින් දකුණු ලක සුප්‍රසිද්ධ බෞද්ධ අධ්‍යාපන ආයතනයක් ලෙස සම්භාවනාවට පත් රන්දොඹේ මහා චෛතිය පිරිවෙනෙහි පරිවේණාධිපති තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහා නායක ස්වාමීන් වහන්සේ වෙත භාර කරන ලදී. උන්වහන්සේ වෙතින් පැවිදි වීමට අදාල මූලික බණ දහම් හදාරා මහානායක හිමියන් සහ බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමියන් ආචාර්යව 1927 වසරේ ජූලි11 වැනිදා රන්දොඹේ මහා චෛතිය පිරිවෙන් විහාරයේ දී බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති නමින් පැවිද්ද ලබා ගත්තේය.

## ආචාර්ය පරපුර

අප අමරපුර මහා නිකායයේ අටවැනි මහනායක ධුරය ඉසිලූ අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහා නායක ස්වාමීන් වහන්සේ[28] සහ උන්වහන්සේගේ ශිෂ්‍ය බේරතුඩුවේ ධම්මාධාර තිස්ස හිමියන් බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති හිමියන්ගේ ආචාර්යන් වහන්සේලා වූහ.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

පැවිද්දෙන් පසු රන්දොඹේ මහාචෛතිය පිරිවෙණෙන්ම සිය මූලික අධ්‍යාපනය ලබන ධම්මකිත්ති හිමියන් සිය පැවිදි සහෝදර වලගෙදර සෝමාලෝක තිස්ස වැනි ආචාර්යවරුන් යටතේ සිංහල පාලි සංස්කෘත පාලි සංස්කෘත ආදී භාෂා ඥානය ද ධර්මය සහ විනය පිළිබඳ දැනුම ද ලබාගෙන සෑම වසරේම පන්තියේ පළමු වැනියාව සිය දක්ෂතාවය පෙන්වා ඇත. 1939 වසරේදී සිය පාරිවේණික අධ්‍යාපනය නිමකොට රාජකීය පණ්ඩිත උපාධිය ලබාගැනීමට ධම්මකිත්ති හිමියන්ට හැකි විය. තවත් එක් පැවිදි සහෝදරයෙකු වූ රන්දොඹේ සෝමසිරි තිස්ස හිමියන් නාගදීප රාජමහා විහාරයෙහි අධිපතිත්වය දැරූ අතර උන්වහන්සේගේ මඟපෙන්වීම මත යාපනයේ වික්ටෝරියා විදුහලට ඇතුළත් ව වසර හතරක කාලයක් ඉංග්‍රීසි සහ ද්‍රවිඩ භාෂා පිළිබඳ හසල දැනුමක් ලබා ගත්තේය.

---

[28] උන්වහන්සේගේ ආචාර්ය පරපුර තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානායක හිමි පරිච්ඡේදයෙන් බලන්න.

**උපසම්පදා ප්‍රතිලාභය**

පිරුණු විසි වයසින් උගත යුතු බණදහම් හමාර කොට සිටි ධම්මකිත්ති සාමණේරයන් වහන්සේ 1935 වසරේ ජූලි 11 වනදා බලපිටි මෝදර උදකුක්ඛේප සීමා මාලකයේදී ස්වකීය ආචාර්යයන් වහන්සේ වූ අතිපූජ්‍ය තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහනාහිමියන් උපාධ්‍යාය කොට ගෙන ශුද්ධෝපසම්පදාවට පාත්‍ර විය. කන්දේගොඩ ශ්‍රී නාගපුෂ්පාරාම අධිපති උදම්මිට ධම්මරක්ඛිත තිස්ස, හැගල්ලේ අමර මුනි විහාරාධිපති කොස්ගොඩ සාරාලංකාර තිස්ස, රන්දොඹේ මහාචේතිය පරිවේණාධිපති වලගෙදර සෝමාලෝක තිස්ස යන හිමිවරුන් කර්ම වාක්‍ය කියූ කර්මාචාර්යයන් වහන්සේලා වූහ.

**ශාසන ශාස්ත්‍රීය සේවය**

රන්දොඹේ මහාචේතිය පිරිවෙනින් ධර්ම ශාස්ත්‍ර හදාරා රාජකීය පණ්ඩිත උපාධිය ලැබීමෙන් ප්‍රසාදයට පත් තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස හිමියන් ඇතුළු ආචාර්යයන් වහන්සේලා උන්වහන්සේව පිරිවෙණෙහි ආචාර්යවරයෙකු ලෙස පත් කර ගත්තේය. ඒ අතර පිරිවෙනේ උප ප්‍රධානාචාර්යවරයා ලෙසත් පරිවේණාධිපතීන් වහන්සේ ලෙසත් කටයුතු කිරීමට හැකියාව ලැබේ. එවකට යාපනය නාගදීපය රාජමහා විහාරාධිපති රන්දොඹේ සෝමසිරි තිස්ස තම සහෝදරයා හිමිපාණන්ගේ ආරාධනාව පරිදි යාපනයට වැඩම කළ උන්වහන්සේ එකල වික්ටෝරියා විදුහලේ ද්‍රවිඩ භාෂාව පිළිබඳ ආචාර්යවරයෙකු ලෙස ද කටයුතු කර ඇත. යාපනයේ සිංහල දෙමළ සාමග්‍රිය ඇතිකොට බුදු දහමේ නිර්මල පනිවුඩය එම

ප්‍රදේශයන්ට බෙදා හැරීම සඳහා නාහිමියන්ගෙන් ඉටුවූයේ මහත් සේවයකි. තම පැවිදි සොයුරු රන්දොඹේ සෝමසිරි තිස්ස හිමිපාණන් ඇතිකළ කිලිනොච්චි ලුම්බිණි විහාරය, පුත්තලම බෞද්ධ මධ්‍යස්ථානය, ත්‍රිකුණාමලය විල්ගම්වෙහෙර රජමහා විහාරය, මොරවැව තිස්ස විහාරය වැනි විහාරයන් දියුණු කිරීමට මහත් පරිශ්‍රමයක් යෙදවූ උන් වහන්සේ අභිනවයෙන්

- යාපනයේ නාග විහාරය,
- අනුරාධපුර නාගදීප ශාඛා විහාරය,
- නල්ලතන්නිය නාගදීප ශාඛා විහාරය,
- කොළඹ දෙමටගොඩ නාගදීප ශාඛා විහාරය,
- බලපිටියේ සීමාමාලක බෞද්ධ මධ්‍යස්ථානය

වැනි නව ආරාමයන් ඉදිකොට

- බ්‍රාහ්මණවත්තේ සීවලී තිස්ස
- බලබෝවේ විමලකිත්ති තිස්ස
- කඩවත විජිතධම්ම තිස්ස
- නවදගල පදුමකිත්ති තිස්ස

ආදි උගත් සිසු පිරිසක් ද තැනුවේය. නාගදීප රාජමහා විහාරය සංවර්ධනය කොට සීමා සම්මත කිරීමත්, බුරුමය ආදී රටවල් සමඟ සමග සම්බන්ධතා ඇති කොටගෙන විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමත් උන්වහන්සේගේ සේවා අතර වෙයි. ශාස්ත්‍රීය සේවාවන් අතර උන්වහන්සේ තුල පැවති ධර්ම ඥාණය හා භාෂා ඥාණය තුලින් විවිධ පොත් පත් සඟරා සිංහල, ද්‍රවිඩ, පාලි, සංස්කෘත භාෂාවලින් ලියා පල කළහ. ඒවා අතර ප්‍රකෘත

ප්‍රකාශය, ප්‍රකෘත මඤ්ජරි, දශකුමාර චරිතය පද භේද විවෘතිය, සාසනවංසදීප ව්‍යාඛ්‍යාව, සිංහල ථූපවංශය, නාගදීපය, නාගදීප කාව්‍ය. ධර්මකීර්ති ප්‍රබෝධ ලිපි, බෞද්ධ වන්දනා ගාථා, සොළොස්මස්ථාන, සිංහල, ද්‍රවිඩ පුහුණුව, පුත්තර්වනක්කම් ඉන් කීපයකි. තම ධර්මාචාර්යන් වහන්සේ වන වලගෙදර සෝමාලෝක තිස්ස මාහිමියන්ගේ ආභඅතරින් ලැබීම තුලින් සිංහල කවි රචනා කිරීම, පාලි ගාථා රචනා කිරීම, සංස්කෘත ශ්ලෝක රචනා කිරීම, පිළිබඳ සහජ දක්ෂතාවයක් තිබුනි.[29]

1971 වසරේ දී වලගෙදර සෝමාලෝක තිස්ස මහානාහිමියන් ප්‍රධාන කාරක මහා සභාව විසින් උත්තර ලංකාවේ ප්‍රධාන සංඝනායක පදවියෙන් පුදනු ලැබිණ. වලගෙදර සෝමාලෝක තිස්ස හිමිපාණන්ගේ අපවත්වීමෙන් පුරප්පාඩු මහනායක ධුරය සඳහා සුදුසු භික්ෂූන් වහන්සේ නමක් පත් කර ගැනීමට 1974 වසරේ දෙසැම්බර් මස 27 වනදා කාරක මහා සංඝ සභාව රැස්වූ අතර එහිදී බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස හිමිපාණන් ද **අමරපුර ගණපාමොක්ඛාචරිය ඤාණවිමලවංශාලංකාර** යන ගෞරවාභිධානය සහිතව මහනායක පදවියට පත් වෙයි. අමරපුර මහා සංඝ සභාවේ ප්‍රධාන නායක පදවියට මඩිහේ පඤ්ඤාසීහ නායක ස්වාමීන් වහන්සේ යෝජනා කළේ ද ධම්මකිත්ති නාහිමියන් ය. 1999 නොවැම්බර් 27 වනදා අමරපුර මහ සංඝසභාව මඟින් **ධීර වීර ප්‍රවචන කීර්ති ශ්‍රී සාසන ජෝති** යන ගෞරව නාමය ප්‍රදානය කරන ලදී.

---

[29] බම්බලපිටියේ ආනන්ද තිස්ස නාහිමි, **අතිපූජ්‍ය බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස මහානායක ස්වාමීන්ද්‍ර චරිතාපදානය** (කොළඹ: බෞද්ධ කටයුතු කොමසාරිස් කාර්යාලය, 2003), 05.

අත්‍යුදාර ශාසන සේවාවක නියුතුව සිටි ධම්මකිත්ති තිස්ස මහානාහිමියන් වසර තුනක පමණ කාලයක් ගිලන් තත්ත්වයේ පසුවිය. උපතින් 88 විය එළඹි තමන්වහන්සේගේ ජන්ම දිනයේ දී ම එනම් 2003 වසරේ අප්‍රේල් මස 15 වනදා රාත්‍රියේ අපවත්ව වදාළහ. එම මස 21 වනදා නාගදීප රාජමහා විහාරාසන්නයේ කළ ආදාහන මළුවේ දී පූර්ණ රාජානුග්‍රහයෙන් ආදාහන පුණ්‍යෝත්සවය සිදුකරන ලදී.

13 සද්ධර්මවාගීශ්වරාචරිය ධර්ම කීර්ති ශ්‍රී අතිගෞරවාර්හ හීනටියන ශ්‍රී ධම්මාලෝක තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2521-2523, ක්‍රි.ව.1979-1981)



**ජන්මලාභය සහ ප්‍රව්‍රජාව**

බස්නාහිර පළාතට අයත් ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරලයේ ඒ කොට්ඨාසයේ සුප්‍රසිද්ධ උන්නාරුව ග්‍රාමයේ කේ. කරෝලිස් ද සිල්වා පියතුමාට සහ හීනටියන ග්‍රාමයේ එම්. මරිය සිල්වා මවට දෙවැනි පුතු ලෙස කාලිංග පියසේන ද සිල්වා නමින් 1900 වසරේ සැප්තැම්බර් මස 23 ඉරිදා දින මහනායක ස්වාමීන් වහන්සේගේ උපත සිදුවිය. පීල්ලවත්ත සුරම්මාරාම පුරාණ විහාරාධිපති පූජ්‍ය පී. ආරියවංශ ස්වාමීන් වහන්සේගෙන් සුබ මොහොතින් අකුරු කියවූ පියසේන ද සිල්වා දරුවා පීල්ල වත්තේ බාලිකා විද්‍යාලය සහ ආඬි අම්බලම රජයේ විද්‍යාලයෙන් තම මුල් අධ්‍යාපනය ලබා ඇත. 5 ශ්‍රේණියේ අවසාන විභාගයෙන් පසු යටියන රෝමානු කතෝලික පාසැලට මවුපියන් විසින් ඇතුල් කළ අතර සුරම්මාරාමස්ථ දහම් පාසලින් සිය මූලික දහම් අධ්‍යාපනය ලබා ඇත. කාලිංග සිසුවාගේ පැවිද්ද සිදුවන්නේ ද දේශමාමකයෙකු නිසාවෙනි. ආඬි අම්බලම රජයේ විද්‍යාලයේ දී වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමන් කළ කතාවකට සවන් දී ගිහි ජීවිතයෙන් වෙන්ව ශාසනයට ඇතුළු වීමට තීරණය කළේය. ඒ අනුව 1911 වසරේ දී හීනටියන පොත්ගුල් විහාරයේ දී පූජ්‍ය හීනටියන ශ්‍රී ධම්මක්ඛන්ධ තිස්ස ස්වාමීන්වහන්සේගේ ආචාර්යභාවයෙන් හීනටියන පඤ්ඤාලෝක නමින් පැවිදි විය. අවස්ථා තුනක දී උපැවිදි වූ උන් වහන්සේ තුන්වන වතාවේ උපැවිදිව නිවසේ සිටින විට කුරණ කටුනායක ඉංග්‍රීසි පාසලට ඇතුළත්ව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හසල දැනුමක් ලබා ගත්තේය. මේ අතර ඉරිදා දිනවල පාසල අසල තිබූ පල්ලියට යන පියසේන ද සිල්වා බයිබල් පාඩම් හා ඒ හා සම්බන්ධ තරඟවලින් ජය

ගෙන ඇත. ඔහු දක්ෂතම කපිකයා, ක්‍රිකට් පාපන්දු කණ්ඩායම්වලට බැඳී දක්ෂම ක්‍රීඩකයා ලෙසත් ප්‍රසිද්ධියට පත්විය. පල්ලිය සමග තිබූ මෙම දැඩි සම්බන්ධය නිසා පියසේන ද සිල්වා දරුවා කිතුණු පූජකයෙකු වීමට ඉඩ ඇති බවට බිය වූ හීනටියන ධම්මක්ඛන්ධ ස්වාමීන් වහන්සේ පියසේනගේ මාමා කැටුව ගොස් පියසේනව නිවසින් විහාරස්ථානයට ගෙන ගොස් දින කිහිපයකින් හීනටියන ධම්මාලෝක යන නමින් නැවත ප්‍රව්‍රජාවට පත් කරන ලදී.

## ආචාර්ය පරම්පරාව

අමරපුර මහා නිකායයේ තෙවැනි මහානායක ධුරය දැරූ මහකරාවේ විමලසාර තිස්ස හිමියන්ට මීගමුවේ ආසභ තිස්ස නමින් ශිෂ්‍යවරයෙකු සිටියේය. උන්වහන්සේගේ චරිතය මහකරාවේ විමලසාර තිස්ස මහානායක හිමියන් පිළිබඳ පරිච්ඡේදයෙන් දත යුතුයි. මීගමුවේ ආසභතිස්ස හිමියන්ට මාදම්පාගම සංඝරක්ඛිත තිස්ස නම් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක විය. ඒ හිමියන්ගේ ද ශිෂ්‍ය වූ හීනටියන ධම්මක්ඛන්ධ තිස්ස නාහිමිපාණන් අප ධම්මාලෝක තිස්ස හිමියන්ගේ ආචාර්යවරයාණන් වහන්සේ විය.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

සිය ආචාර්යන් වහන්සේ වෙතින් ද පීල්ලවත්ත අරියවංශ ස්වාමීන් වහන්සේ සහ කටාන ශ්‍රී වර්ධනාරාමාධිපති විමලධම්ම ස්වාමීන් වහන්සේලා වෙතින් සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂාවන් පිළිබඳ මෙන්ම ධර්ම දේශනා පිරිත් දේශනා ආදී ආගමික වත්පිළිවෙත් පිළිබඳ ද අධ්‍යාපන ලත් උන්වහන්සේට සිය ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය සඳහා උදව් කළේ එම්. පී. ද සොයිසා නම්

ආචාර්යවරයාය. පසුව උසස් අධ්‍යාපනය සඳහා 1919 වර්ෂයේ දී විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් කරන ලද අතර එහි දී ප්‍රාචීන ප්‍රතිචීන භාෂා, ඉතිහාසය, ඡන්දස් අලංකාර, තර්ක න්‍යාය ආදී විෂයයන් පිළිබඳ දැනුම ලබාගත්තේය.

**උපසම්පදා ප්‍රතිලාභය**

සම්බුද්ධ ශාසනය පිළිබඳ බණ දහම් ප්‍රගුණ කොට උපසම්පදාව සඳහා නිසි වයස් සපුරා සිටි හීනටියන ධම්මාලෝක සාමණේරයන් වහන්සේ හීනටියන  ධම්මක්ඛන්ධ හිමියන් ආචාර්යව බලපිටි මෝදර උදකුක්ඛේප සීමා මාලකයේ දී අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංශාලංකාර අතිපූජ්‍ය අහුන්ගල්ලේ විමලධීර තිස්ස මහා නායක ස්වාමීන් වහන්සේ උපාධ්‍යාය කොට ගෙන වැලිතර අම්බරුක්ඛාරාම සිරි සුගත ශාසනෝදය පරිවේණාධිපති රාජකීය පණ්ඩිත අහුන්ගල්ලේ විමලකිත්ති තිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන මාහිමිවරු තුන් නමක් කර්මාචාර්යව ශුද්ධෝපසම්පදාව ලද්දේය.

**ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය**

පසුව වැඩිදුර අපනට විද්‍යෝදය මහා පිරිවෙනට ඇතුළු වූ ධම්මාලෝක හිමියන් වයස අවුරුදු 23  වන විට ඉතා දක්ෂ ධර්ම දේශකයෙකු ලෙස පසිද්ධ වුයේය. ඩී. බී. ජයතිලක සිරිමතාණන් ඇතිකළ කොළඹ තරුණ බෞද්ධ සංගමය සෑම ඉරිදාවකම කොටුවේ එම මධ්‍යස්ථානයේදී ධර්ම දේශනාවක් සහ ධර්ම සාකච්ඡාවක් සඳහා ධම්මාලෝක හිමියන් වැඩමවා ගත්හ  මේ කීර්තිරාවය නිසාම උන් වහන්සේට  65ක් පමණවූ ධර්ම ස්ථානවල ධර්ම දේශනා සඳහා නිතොර යන්නට සිදුවුයෙන් මහා බෞද්ධ දානපතිනියක් වූ

ජෙරමියෙස් ඩයස් ආර්යාව ඒ වෙනුවෙන් ම මෝටර රථයක් වෙන්කර උන් වහන්සේට සැපයුවාය. මෙම දේශනාවල ඵලයක් ලෙස බොහෝ දෙනා බෞද්ධාගම ගැන වඩා උනන්දුවකින් එකතු වූහ.

ධම්මාලෝක හිමියන්ගේ මඟ පෙන්වීම යටතේ, ගුණපාල මලලසේකර, ඩී.සී සේනානායක ඇතුළු ප්‍රභූන් කිහිප දෙනෙක් විසින් 1924 වසරේදී ශ්‍රී ලංකා ධර්මදූත භික්ෂු සභාවක් ඇති කරන ලදී. බොහෝ කලක්ම එහි ගරු ලේකම් ලෙස උන් වහන්සේ සේවය කලේ බොහෝ තරුණ භික්ෂුන් වහන්සේලා පුහුණු කරන්නට කටයුතු කළේය. පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමියන් විසින් කලින් ඉසිලූ කොළඹ නාලන්දා විද්‍යාලයේ බෞද්ධ ධර්ම ආචාර්ය තනතුර ආනන්ද මෛත්‍රිය හිමියන්ගෙන් පසුව භාරගන්නා ලෙස නාලන්දා විද්‍යාලයාධිකාරි ගරු ගුණපාල මලලසේකර මැතිතුමා කළ ආරාධනාවට අනුව කිසිදු වැටුපකින් තොරව නාලන්දාවේ ධර්මාචාර්ය තනතුරෙහි වසර ගණනක් කටයුතු කල උන්වහන්සේ දහස් ගණනක් වූ දරුවන්ගේ ජීවිත ආලෝකමත් කළෝය.

මෙම කාලය තුළ දී බෞද්ධ ධර්මදූත භික්ෂූ සංගමයේ කටයුතු සඳහා උද්යෝගිවත් වූ අය අතර ගුණපාල මලලසේකර, සෙනරත් ගුණවර්ධන, ආතර් වී ඩයස්, ආචාර්ය හේවාවිතාරණ, රාජා හේවාවිතාරණ ආදීන් වූහ. භික්ෂූ සංගමයේ මධ්‍යස්ථානය සඳහා වෙන්වූ ගොඩනැගිල්ලක අවශතාවය නිසා සේනානායක පවුලේ අය රාජගිරිය ප්‍රදේශයෙන් ඒ සඳහා ඉඩමක් පරිත්‍යාග කරන ලදී. මෙසේ ඉදිකරන ලද නව භික්ෂු මධ්‍යස්ථානයෙන් විදේශ ධර්ම ප්‍රචාරය සඳහා භික්ෂූන් වහන්සේලා තේරීමට ධම්මාලෝක හිමියන් ඉතා දක්ෂ විය. පූජ්‍යය වල්පොල රාහුල හිමියන්, කෙහෙල් ඇල්ලේ ආනන්ද සාගර

හිමියන්, තල්පාවිල සීලවංශ හිමියන් ආදී ඉතා දක්ෂ වහන්සේලා තෝරා විදේශ ධර්ම ප්‍රචාරය සඳහා යවන්නට හැකි විය.

(මේ කාලය තුළ දී අනගාරික ධර්මපාල තුමන් විසින් මහනුවර වැව පාරේ තවත් භික්ෂු පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.) 1929 දී පූජ්‍ය ධම්මාලෝක හිමියන්ගේ ප්‍රධානත්වයෙන් අට දෙනෙකුගෙන් යුත් භික්ෂු පිරිසක් දහම් ප්‍රචාරය සඳහා ඉන්දියාවේ මහාබෝධි සමාගමට පිටත්ව ගියහ. හේවාවිතාරණ හා එම පියදාස මහත්වරුද දවමොට්ටාවේ සාසනසිරි හිමියන්ද මෙම පිරිසට එක්වුහ. වසර හයක කාලයක් ඉන්දියාවේ ගතකළ මෙම පිරිස ඉන්දියාවේ නැවත බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකරන්නට මුල් වූහ. මෙම වෑයමට පැසසීමට ඉන්දියාවේ විශ්වවිද්‍යාලයක් මඟින් පූජ්‍ය ධම්මාලෝක හිමියනට ගෞරව උපාධියක් පිරිනැමීය.

ධර්ම ප්‍රචාරක සේවාවලට අමතරව උන් වහන්සේ කළ සමාජ සේවා සහ ප්‍රජා සේවා ද බොහෝය. මැලේරියා උවදුරෙන් රටේ බොහෝ ප්‍රදේශවල ජනතාව අනතුරට ලකව සිටි දිනවල සෞඛ්‍ය සේවා දෙපාර්තමේතුවේය. මේ සමඟ උන් වහන්සේ එම ප්‍රදේශයකට ගොස් නොයෙක් ලෙස උපකාරී විය. 1956 දී ඇතිවූ නියගය නිසාත් 1957 මහා ගැන වතුර නිසාත් පීඩාවට පත්වූ රට වැසියන්ගේ ආධාරයට දැවැන්ත ආධාර වැඩසටහන් කිහිපයක්ම ඇතිකිරීමට උන්වහන්සේ පුරෝගාමී විය.

1958 දී කොළඹ දිස්ත්‍රික්කයේ අමරපුර නිකායේ සංඝ නායක තනතුර සඳහා පත්කරනු ලැබීය.

1960 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භික්ෂු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පත්වීම් ලද්දේය.

1980 දී ජර්මානු බෞද්ධ ධර්මදූත සභාවේ ආරාධනයෙන් පූජ්‍ය ධම්මාලෝක හිමියන් ජර්මනියේද තවත් කිහිපයක් යුරෝපී රටවලද ධර්ම මධ්‍යස්ථාන ඇතිකරන්නට සමත් විය. එම සේවය අගය කරමින් අමරපුර නිකායේ මහා නායක ධුරය උන් වහන්සේට පිදුණේ 1980 වසරේදී ම ය.


ධම්මාලෝක හිමියන්ගේ ශිෂ්‍යයන් අතර

- පූජ්‍ය මහාචාර්ය වැල්ලවත්තේ ආනන්ද,
- පූජ්‍ය ගාල්ලේ අනුරුද්ධ,
- පූජ්‍ය හීනටියාන නන්දතිස්ස ,
- පූජ්‍ය මහරගම මහින්ද

ආදි හිමිවරු තවමත් ධර්මදූත කටයුතුවල නියලී සිටී. එවැනි දැවැන්ත සමාජ සහ ආගමික ක්‍රියා සම්භාරයක් ඉටුකළ පූජ්‍ය හීනටියන ධම්මාලෝක මහා නායක ස්වාමීන් වහන්සේ වසර 82 ක් ආයු වළඳා වසර 1981 දෙසැම්බර් මස 11 වෙනි දින ජාතියෙන් සමු ගත්තේය.




හීනටියන ධම්මාලෝක තිස්ස මහානාහිමියන් වෙනුවෙන් නිකුත් කර ඇති සමරු මුද්දරය




නාහිමියන් පිළිබඳ ලියැවී ඇති පොත්

**1980.02.26 දින "දවස"**

# මහානායක පදවිය

**මා මේ පදවියට — නිහඬවීමේ අදහස**
**මහ සහරුවන වෙත — දන්වන්නෙ යටහත්වයි**

ගෞතම අප බුදුන්
අසිරිමත් එක්කෙනෙක්
සද්ධර්මය එකක්
එකම ශ්‍රාවක පිරිසක්

එක බුද්ධශාසනය
දෙකට කැඩුවොත් වෙන්නේ
එක කැල්ලක්වත්
බුදුන් හෝ ශාසනෝ හෝ
නැතිවීම නොවේදෝ

කැලි තිහ හතලිහකට
ශ්‍රාවක පිරිස බෙදුනොත්
අරිය ශ්‍රාවකයන්
කොයි කැල්ලෙන් ලබමුද

කෙසේ හෝ අද දවසේ
සඟ පිරිස බෙදීලා
බුදුසසුන වෙනුවට
තිබෙන්නේ නිකායයි

අප සිරිලක්දීපේ
වෙන් වෙන් නිකායන්
තිස්ගණනකට වැඩි
ඔක්කොම එකතුවෙමු

බුදුසසුන පිහිටමු
බුදුසසුන එක සසුන
එකම බුදු පියමයි
කවුරුත් සරණ යන්නේ

එකම ධර්මයමයි
හැමගෙ එක සරණය
එක උත්තම සහරුවන
හැමගෙ එක පින්කෙත

තුනුරුවන්ගේ නෑ බෙදීමක්
නෑ නිකායක් පක්ෂයක්
මැදුම් පිළිවෙතමයි
හැමගේ ගමන් පාර

මිනිස් ජාතිය පමණයි
මිනිහාගෙ ජාතිය
එය කැඩී බෙදීයන
වෙන ජාතියක් නෑ

නොබෙදුනු ජීවිතය තුළ
සමගි වූ තෙපස තුළ
අරිඅටඟි මගතුළ
ඇති බව කියා දුන්නා

හැමට පෙන්වා දෙමු
සිරිලක වසන ජනයා
එක මිනිස් ජාතියට ගෙන
මිනිස්කම ඔසවමු.


එමඟින් මුළු ලොවම
මිනිස් ජාතිය බව
හඬ නගා පතුරමු
අසහන ලෝකයට

සමගි ධර්මය වඩන අය
දුකකට නොවැටෙති
පින්වත් හිමිවරුනි,
මෙය හොඳට තේරුම් ගෙන
ලෝකෙම සනසවමු.

*මහානායක පදවිය ලැබීමෙන් පසු දවස පුවත්පතට ලියූ කවි පෙළක් 1980.02.26 දින*

14 අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංශාලංකාර ශ්‍රී විමලධම්ම අතිගෞරවාර්හ කටුවැල්ලේගම අමරසිරි තිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (බු.ව.2523-2547,ක්‍රි.ව.1981-2005)





**ජන්මලාභය සහ ප්‍රව්‍රජාව**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය කොට්ඨාසයට අයත් කටුවැල්ලේගම නම් ගම්පියසේ 1908 මාර්තු මස 15 වන ඉරිදා මහානායක මාහිමියන් වහන්සේගේ උපත සිදු වූයේය. එගම පදිංචි ප්‍රභූ පවුලකට අයත් මල්ලව ආරච්චිගේ චාල්ස් කුලතිලක අප්පුහාමිගේ සහ මංගොනෝනා ලොකු බාලසූරිය හාමිනේගේ පුත් රුවන ලෙස උපත ලද මහානාහිමියන් එකල මල්ලව ආරච්චිගේ ඩේවිඩ් කුලතිලක යන නමින් හැඳින්විය. නිසි වයසේදී සිය ගම් පියසේ වූ බෞද්ධ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ අතර අළුතැපොල උඩුගම්පල සහ නාත්තන්ඩිය රජයේ පාසල්වලින් වැඩිදුර අධ්‍යාපනය හදාරා ඇත. දේශීය ආයුර්වේද ක්‍රමය පිළිබඳ අවධානය යොමු කොට සාරස්වතය, හිතෝපදේශය වැනි සංස්කෘත පොතපත ද ගිහි කල දී පරිශීලනය කර ඇත.

කුඩා කල සිටම ආගමික දිවියකට නැඹුරුව සිටි දරුවා සෑම රාත්‍රියකම නින්දට පෙර ධර්ම ග්‍රන්ථයක් කියවා නිදාගැනීමට පුරුදුව සිටියේය. දිනක් මහින්ද තෙරුන්ගේ සහ සංඝමිත්තා දියණියගේ පැවිද්ද පිළිබඳ ධර්ම ග්‍රන්ථයක් කියවමින් සිටියදී පියතුමන් විසින් පැවිදි වීමට කැමතිදැයි අසන ලද පැනයට එක්වරම කැමැත්ත දැක්වූ දරුවා 1921 වසරේ වස්සාන සමයේ කටාන ශ්‍රී වර්ධනාරාමාධිපති කිරිමැටියානේ සිරි සද්ධම්මාලංකාර විනයාචරිය විමලධම්ම තිස්ස නා හිමියන් වෙත බාර කරන ලදී. කටාන ශ්‍රී වර්ධනාරාමයේ චෛත්‍යයේ කොත් පැළඳවීම යෙදී තිබුණ 1922 පෙබරවාරි මස 12 වන ඉරිදා කටුවැල්ලේගම අමරසිරි යන නමින් පැවිදි බිමට පමුණුවන ලද්දේ ය. එදිනම උන්වහන්සේ සමඟ හතර නමක් පැවිදිව ඇත.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

පැවිද්දේ සිට වසර අටකට ආසන්න කාලයක් සිය ආචාර්යපාදයන් සමීපයේ පැවිද්දේ මූලික අධ්‍යාපනය ලැබූ උන්වහන්සේ පසුව 1930 වසරේ ජනවාරි මස පණ්ඩිත ශිරෝමණි කහවේ සිරි රතනසාර පරිවේණාධිපතීත්වය දරණ සමයේ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනට ඇතුළත් විය. ආභිධම්මිකාචරිය කුකුල්නාපේ සිරි දේවරක්ඛිත, පලන්නොරුවේ විමලධම්ම, මොරොන්තුඩුවේ ධම්මානන්ද වැනි විදග්‍රේසරයන් වහන්සේලා වෙතින් ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය කොට ප්‍රථම, මධ්‍යම, අවසාන පරීක්ෂණ සමත්ව 1937 වසරේ සිය පාරිවේණික අධ්‍යාපනය නිම කර ඇත.

## උපසම්පදා ප්‍රතිලාභය

1934 වසරේ එවකට අමරපුර මහා නිකායේ මහානායක අමරපුර ගණපාමොක්ඛාචරිය ධම්මකිත්ති සිරි තොටගමුවේ පඤ්ඤාමෝලි තිස්ස මහානාහිමි උපාධ්‍යාය කොටගෙන කිරිමැටියානේ සිරිධම්මාරාම විමලධම්ම තිස්ස ප්‍රධාන නායක හිමියන් ආචාර්යව අම්බලන්ගොඩ බලපිටිමෝදර උදකුක්ඛේප සීමා මාලකයේ දී අමරසිරි සමණුද්දේසයන් වහන්සේ උපසම්පන්න වූ සේක.

**ශාසන සහ ශාස්ත්‍රීය සේවය**

කටාන ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් බෞද්ධ ආගමික ප්‍රබෝධයක් ඇතිකිරීම සඳහා නායක ස්වාමීන් වහන්සේ ගෙන් ඉටු වූ සේවය ඉමහත්ය. කටාන ශ්‍රී වර්ධනාරාමය කේන්ද්‍ර කරගනිමින් විවිධ සමිති සමාගම් ආරම්භ කළ අතර 1946 වසරේ ජූලි 13 වන සෙනසුරාදා කටානේ තරුණ බෞද්ධ සංගමය ඇරඹීමට මූලිකත්වය ගැනීම, 1973 ජූලි 14 වන සෙනසුරාදා ශ්‍රී සංඝමිත්තා කුලඟන සමිතිය ඇරඹීම, 1964 දී විහාරස්ථ වෙසක් උත්සව සමිතිය ඇරඹීම නිදසුන් ය. කඩාවැටී තිබුණ විහාරස්ථ ශ්‍රී සද්ධර්මෝද්භාස දායක සභාව යළි නව ව්‍යවස්ථා සකස්කොට ප්‍රතිසංවිධානය කර කටාන ශ්‍රී වර්ධනාරාමය අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත්කරලීමට නා හිමියන් කර ඇති මෙහෙවර සුලුපටු නොවේ. වර්ධනාරාමයේ මකර තොරණ සහිත දොරටුව, විශාල මහ විහාරය අභිනවයෙන් ඉදිකිරීමත් අවශේෂ විහාරාංග ප්‍රතිසංස්කරණ කිරීමත් නාහිමියන්ගේ සමයේ සිදු වූ ඒවායි. කටානේ වෙසක් පෙරහැර 1942 වසරේ සිට ආරම්භ කර ඇත්තේ දා නාහිමියන් විසිනි. එමෙන්ම කටානේ ගංගාරාමය ද සංවර්ධනය කොට අංගසම්පූර්ණ විහාරස්ථානයක් බවට පත්වන්නේ නාහිමියන්ගේ අනුග්‍රහයෙනි. කටාන ශ්‍රී වර්ධනාරාමය කේන්ද්‍ර කරගනිමින් විහාරස්ථාන පහක විහාරාධිපති ධූරය නාහිමියන් උසුලා ඇත.

- කටාන ශ්‍රී වර්ධනාරාමය (1941 වර්ෂයේ සිට)
- කටාන ශ්‍රී ගංගාරාමය (1971 වර්ෂයේ නාහිමියන්ගේ ජ්‍යෙෂ්ඨ පැවිදි සහෝදර උන්නාරුවේ පඤ්ඤාසේඛර හිමි අපවත්වීමෙන් පසු)
- කලුවායිරිප්පුවේ ශ්‍රී ආනන්දාරාමය (1984 වර්ෂයේ සිට)

- කටුවැල්ලේගම ශ්‍රී ශ්වේතබිම්බාරාමය
- කඩවල සිරි මංගලාරාමය

අමරපුර නිකායයේ කාරක සංඝ සභාවට, විධායක සභාවට ඇතුළත් වෙමින් සිය කාලය දැනුම නිකායික උන්නතියට කැප කළ අතරම මීගමු - හලාවත මහා සංඝ සභාවේ[30] සමලේකම් පදවියටත් පසුව එම සභාවේ ම ප්‍රධාන නායක පදවියටත් පත්ව සම්බුද්ධ ශාසනයට සහ නිකාය වෙනුවෙන් කළ යුතු මෙහෙවර ඉටුකොට ඇත. 1940 වසරේ සිංහල බෞද්ධයා පත්‍රයේ ලිපි ලිවීමෙන් තම ලේඛන කලාව ආරම්භ කළ මහනාහිමිපාණන්

- දේව-අදේව වාදය
- ජීවිතය
- වෘතාන්තය (1962)
- මිනිසා හා ආගම නූතන විද්‍යාව හා බුදුදහම බෞද්ධාරක්ෂක විධි (1986)

---

30 මීගමුව හලාවත මහා සංඝ සභාව 1900 ආරම්භක සමයේ අමරපුර නිකායික විහාරස්ථානය පනහකට අධික ප්‍රමාණයක් ඒකරාශී කොට සකස් කරගත් සංඝ සභාවකි. මේ සඳහා කොළඹ සිට පුත්තලම දක්වා අමරපුර නිකායික විහාරස්ථාන අයත්ව තිබුණි. වර්තමානයේ මූලවංශික පාර්ශ්වයට සහ අඹගහපිටිය පාර්ශ්වයට අයත් විහාරස්ථාන මේ සංඝ සභාවට අයත්ව තිබී ඇත. එය ශ්‍රී සද්ධර්මෝදය සංඝ සභාව ලෙස හඳුන්වා ඇති අතර එහි ප්‍රථම සභාපති ධුරය කිරිමැටියානේ විහාරාධිපතිව වැඩ සිටි දුම්මලදෙණියේ ධම්මාරාම තිස්ස මාහිමියන් උසුලා ඇත. දෙවැනි සභාපති ධුරය උන්වහන්සේගේ ශිෂ්‍ය මෙන්ම කටුවැල්ලේගම අමරසිරි මහනාහිමිගේ ආචාර්ය කිරිමැටියානේ සිරි ධම්මාරාම විමලධම්ම තිස්ස මාහිමියන් උසුලා ඇත. ඒ 1920 වර්ෂයේයි. ඉන් දස වසරකට පසු එනම් 1930 වසරේ උන්වහන්සේ මීගමු හලාවත දෙපළාතේ ප්‍රධාන සංඝනායක ධූරයට ද පත්විය. 1941 වසරේ උන්වහන්සේගේ අපවත්වීමෙන් පුරප්පාඩුව තිබූ යථෝක්ත නායක පදවිය 1972 වසරේ දී උන්වහන්සේගේ ශිෂ්‍ය කටුවැල්ලේගම අමරසිරි තිස්ස හිමියන් වෙත අම්බලන්ගොඩ රන්දොඹේ මහා චෛතිය මූලස්ථානයේ වෙතින් පවරා ඇත.

- ශිෂ්ට සමාජයක් ගොඩනැගීම
- ඇසල පොහොය
- අනවින ලෙඩ රෝග අසහනයට බොදු පිළියම්
- ප්‍රත්‍යක්ෂ ඖෂධ යෝග මන්තර විධි හා විවිධ විභව (1998)

වැනි කෘති රැසක කතුවරයාද විය. සීමාසහිත පාවුළු සිල්වා බෞද්ධ අධ්‍යාපන සමිතියේ සභාපති ස්වාමීන්වහන්සේ ලෙස ප්‍රදේශයේ බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට උන්වහන්සේ දරන ලද ප්‍රයත්නය වෘත්තාන්තයේ නම් සිය ස්වයං ලිඛිත චරිතාපදානයේ දක්වා ඇත.


**ගරු තනතුරු**

කටාන ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ සභාපති ධුරය (වර්ෂ 1964 සිට 1977 දක්වා) දරමින් කටයුතු කළ අතර 1962 වසරේ අප හිමිපාණෝ ගෞරව නාමයක් සහිතව අමරපුර මහා නිකායයේ සම්මාන නායක පදවියක් ලදහ. 1963 වර්ෂයේ සිට අමරපුර මහා නිකායයේ කාරක සභික ධුරයකට පත් කරගත් අතර නිකායයේ විධායක මණ්ඩලයට ද බඳවා ගන්නා ලදී. මේ සමයේ ක්‍රියාත්මක වූ මීගමු හලාවත දෙපළාතේ ශ්‍රී සද්ධර්මෝදය මහා සංඝ සභාවේ සම ලේඛකාධිකාරීන් වහන්සේ ලෙස 1948 වසරේ සිට 1978 වසර දක්වා අවුරුදු තිහක කාලයක් පළාතේ අමරපුර නිකායික විහාරස්ථාන වෙනුවෙන් තම මෙහෙවර ඉටු කොට ඇත. මෙම මෙහෙවර අගයමින් අම්බලන්ගොඩ කන්දේගොඩ මහා චෛතිය මූල මහා විහාරයේ සංඝසභාවට වඩා ක්‍රමවත්ව හලාවත මීගමු දෙපළාතේ සංඝ සභාව කටුවැල්ලේගම අමරසිරි හිමියන් පවත්වාගෙන යන බවට උදම්මිට

සිරි ධම්මරක්ඛිත මහා නායක ස්වාමීන් වහන්සේ වරක් පවසා ඇත. කටුවැල්ලේගම අමරසිරි තිස්ස හිමියන්ගේ ආචාර්ය කිරිමැටියානේ සිරි ධම්මාරාම විමලධම්ම තිස්ස නාහිමියන්ගේ අපවත්වීමෙන් හිස් වූ මීගමු හලාවත දෙපළාතේ ප්‍රධාන සංඝනායක පදවියට මහා නායක ස්වාමීන් වහන්සේ ප්‍රධාන විංශත්වර්ගික කාරක මහා සභාව 1972 වසරේ දී කටුවැල්ලේගම අමරසිරි තිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ පත් කර ගන්නා ලදී. ඒ පිළිබඳව පිළිබඳව ශ්‍රී සන්නස්පත්‍ර ලබාදීම 1972 ජූලි විසි වන දා කන්දෙගොඩ මහා චෛතිය මූල මහා විහාරයේ දී සිදු කොට ඇත.

## අපවත් වීම

97 වසක් මනා සති සම්පජඤ්ඤ යෙන් යුක්තව බුද්ධ ශාසනයෙහි ස්ව නිකාය අභිවෘද්ධිය උදෙසාම කටයුතු කළ අප නාහිමිපාණන් මීගමුව මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී 2005 වසරේ සැප්තැම්බර් 13 වනදා උදෑසන 6.10 ට පමණ අපවත් වී වදාළහ.



මාදම්පේ සුදර්ශනාරාමවාසී

ඇම්. මේධානන්ද තිස්ස ආයුෂ්මතුන් වහන්සේ ගේ

මඞ්ගල ධර්මදේශනාය නිමිති කොට

කටුවැල්ලේගම අමරසිරි භික්ෂුව විසින්

නිවන්පතා පුදන ලදී.

1943. 8. 5.

කටුවැල්ලේගම අමරසිරි තිස්ස මහානාහිමියන්ගේ අත් අකුරු තරුණ කල

15 අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංශාලංකාර මහෝපාධ්‍යාය ශාස්ත්‍රාචාර්ය අතිගෞරවාර්හ හීනටියන නන්දතිස්ස මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ (ශ්‍රී .බු.ව 2547 සිට,ක්‍රි.ව. 2005 සිට)



### ජන්ම ලාභය සහ ප්‍රව්‍රජාව

බස්නාහිර පළාතේ අලුත්කුරු කෝරළයේ දාසියපත්තුවට අයත් හීනටියන ග්‍රාමය ද ලෝක පූජිත මහා තෙරවරුන්ට ජන්මය සදා ලූ පින් බිමකි. එගම විසූ දෛවඥ ඩී.චර්ලිස් සිල්වා උපාසකතුමාට සහ ඩී. අවුදියස් හාමිනේ උපාසිකාවට දාව 1937 වසරේ දෙසැම්බර් මස 12 වනදා උපත ලද අප නාහිමිපාණන් කුඩා කල සිට හීනටියන පොත්ගුල් විහාරය ඇසුරු කරමින් සිය දිවිය හැඩගස්වා ගෙන ඇත. මූලික පාසල් අධ්‍යාපනය නිම වීමෙන් පසු පසළොස් වියට පැමිණි කුල කුමරු රන්දොඹේ සාරාලංකාර තිස්ස මාහිමියන් උපාධ්‍යායව හීනටියන පොත්ගුල් විහාරාධිපති හීනටියන ධම්මාලෝක තිස්ස නාහිමියන් ආචාර්ය කොට හීනටියන නන්ද නමින් 1952 මැයි 09 වන දා පැවිදි දිවියට පිවිසුණි.

### ආචාර්ය පරපුර

අමරපුර මහා නිකායයේ දහතුන්වන ශ්‍රීමත් මහානායක පදවිය ඉසිලූ හීනටියන ධම්මාලෝක තිස්ස මහානායක හිමියන් අප කථානායක නන්දතිස්ස හිමියන්ගේ ආචාර්යන් වහන්සේ විය. හීනටියන ධම්මාලෝක තිස්ස මහානායක හිමියන් පිළිබඳ පරිච්ඡේදයයෙන් උන්වහන්සේගේ ආචාර්ය පරපුර බලන්න.

### ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

පැවිදි වීමෙන් අනතුරුව සිය පාරිවේණික අධ්‍යාපනය සඳහා රන්දොඹේ මහාචේතිය පරිවේණස්ථානයට ඇතුළු වූ අතර උදම්මිට ධම්මරක්ඛිත තිස්ස මහානාහිමියන්, වලගෙදර සෝමාලෝක තිස්ස හිමියන් වැනි උගත් පඬිවරුන් ඇසුරේ සිය දහම් දැනුම දියුණු

කරගත්තේය. පසුව ගම්පහ විද්‍යාරවින්ද පිරිවෙනට ද ඇතුළත්ව අධ්‍යාපනය හදාරා ඇත. උසස් අධ්‍යාපනය සඳහා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත්ව එහි දීප්තිමත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක බවට පත්විය. පිරිවෙන් අධ්‍යාපනය නිමා කොට 1963 දී කැලණිය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට ඇතුළත්ව බෞද්ධ සංස්කෘතිය පිළිබඳ විශේෂවේදී උපාධිය හදාරා 1967 වසරේ ප්‍රථම පන්තියේ ගෞරව සාමාර්ථයක් ලබා ගෙන ඇත.

## උපසම්පදා ප්‍රතිලාභය

බණදහම් ඉගෙන උපසම්පදාව සඳහා නිසි වයස් සම්පූර්ණ කොට සිටි හීනටියන නන්ද තිස්ස සාමණේරයන් වහන්සේ වර්ෂ 1963 ජුනි මස 03 දා එවකට අමරපුර මහා නිකායයේ මහනායක වලගෙදර සෝමාලෝක තිස්ස හිමියන් උපාධ්‍යාය කොට ගෙන හීනටියන ධම්මාලෝක තිස්ස හිමියන්ගේ ආචාර්යත්වයෙන් අමරපුර මහා නිකායයේ ප්‍රධාන උපසම්පදා සීමා මාලකය වූ බලපිටි මෝදර උදකුක්ඛේප සීමාවේ දී උතුම් වූ උපසම්පදා සීලයට පත් ව වදාළහ.

## ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය

පැවිදි වීමෙන් අනතුරුව සිය පාරිවේණික අධ්‍යාපනය සඳහා රන්දොඹේ මහාචෛතිය පරිවේණස්ථානයට ඇතුළු වූ අතර උදම්මිට ධම්මරක්ඛිත තිස්ස මහානාහිමියන්, වලගෙදර සෝමාලෝක තිස්ස හිමියන් වැනි උගත් පඬිවරුන් ඇසුරේ සිය දහම් දැනුම දියුණු කරගත්තේය. පසුව ගම්පහ විද්‍යාරවින්ද පිරිවෙනට ද යාගොඩමුල්ල සද්ධාතිස්ස පිරිවෙනට ද ඇතුළත්ව අධ්‍යාපනය හදාරා ඇත. උසස් අධ්‍යාපනය සඳහා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනට ඇතුළත්ව

එහි දීප්තිමත් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක බවට පත්විය. පිරිවෙන් අධ්‍යාපනය නිමා කොට 1963 දී කැලණිය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට ඇතුළත්ව බෞද්ධ සංස්කෘතිය පිළිබඳ විශේෂවේදී උපාධිය හදාරා 1967 වසරේ ප්‍රථම පන්තියේ ගෞරව සාමාර්ථයක් ලබා ගෙන ඇත.

**ශාසන ශාස්ත්‍රීය සේවය**

භික්ෂූන් වහන්සේ නමක ලෙස තමන් වහන්සේගෙන් සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහා ඉටුවිය යුතු යුතුකම් වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට නාහිමිපාණෝ නිරන්තරවම උත්සුක වූහ. විහාරාධිපතීන් වහන්සේ ලෙස හීනටියන පොත්ගුල් මහා විහාරයේ දියුණුව සඳහා දිරාපත්ව තිබූ සංඝාවාසය, පුරාණ සීමාමාලකය ඉවත්කොට අභිනවයෙන් ඉදි කිරීම. ශතවර්ෂාධික කාලයක් මහජනතාවගේ වන්දනාවට පාත්‍ර වූ පුරාණ විහාරය සහ සණ්ඨාර කුළුණ, බෝධි ප්‍රාකාරය ආදිය ප්‍රතිසංස්කරණය කර වීම පැසසිය යුතු කටයුත්තකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි වූ වැල්ලවත්තේ පිහිටි රාජනීතිඥ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රී නිශ්ශංක මහතාගේ නිවස එතුමාගේ දියණිය වන එච්.ගීතා ශ්‍රී නිශ්ශංක මෙනවිය මහානායක හිමියන් වෙත පූජා කළ පසු එහි යමුනා සදහම් ආරාමය ආරම්භ කරමින් අගනුවර ධර්ම ප්‍රචාරක කටයුතු සිදුකරන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපනය 1967 වසරේ නිමවීමෙන් පසු 1974 වසර දක්වා කැලණිය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ම සහය කථිකාචාර්යවරයෙකු ලෙස තම ශාස්ත්‍රීය දැනුම බෙදා දෙන ලදී. ගුරුදේවයන් වහන්සේ වූ හීනටියන ධම්මාලෝක තිස්ස මහානාහිමියන් පොත්ගුල් විහාරයේ පිරිවෙනක් ඇරඹීමට කටයුතු සම්පාදනය කළ අතර හීනටියන නන්ද තිස්ස

හිමියන් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු කරන අතරේ ම 1967 වසරේ සිට 2001 වසර දක්වා එම ශ්‍රී ලක්ෂ්මී ධර්මදූත පිරිවෙනේ පරිවේනාධිපති න් වහන්සේ ලෙස විශ්‍රාම යනතෙක් අනුපමේය සේවයක් ඉටු කොට ඇත. 2013 වසරේ පාරිවේණික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකරවීම ඉන් එකකි. හීනටියන පොත්ගුල් විහාරය කේන්ද්‍ර කරගත් දහම් අධ්‍යාපන සේවයේ තවත් දිගුවක් ලෙස හීනටියන නන්ද තිස්ස හිමියන් විසින් 1979 අප්‍රේල් 24 වනදා ශ්‍රී ධම්මාලෝක දහම්පාසල ආරම්භ කරන ලදී. හීනටියන ධම්මාලෝක තිස්ස තිස්ස මහා නායක හිමියන් ආරම්භ කොට තිබූ ශ්‍රී ලංකා ධර්මදූත සභාව මේ වන විට අකාර්යක්ෂම ව පැවති නිසා 1984 වසරේ නන්ද තිස්ස හිමියන් මුල් වී එය නැවත සක්‍රීය කොට ආරම්භ කර ඇත. ගමින් ගමට ගොස් ධර්ම දේශනා පැවැත්වීම, ලේ දන්දීමේ පිංකම් සිදුකිරීම, වාර්ෂික බැති ගී සරණි ස්ථානවල පැවැත්වීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාව පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීම සඳහා ලංකා ධර්මදූත සභාවෙන් ඉටු වූ සේවය මහත් වේ. තමන්වහන්සේ ලත් ශාස්ත්‍රීය දැනුම

- විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ පටිසම්භිදා ශාස්ත්‍රීය සංග්‍රහයේ සංස්කාරක ලෙස කටයුතු කිරීම
- මහාචාර්ය බඹරැන්දේ සිරි සීවලී නාහිමියන්ගේ සිරි සීවලී ප්‍රශස්ති සංග්‍රහයේ සහාය සංස්කාරක ලෙස කටයුතු කිරීම
- හීනටියන ධම්මාලෝක තිස්ස මහා නාහිමියන්ගේ ගුණ සමරු කලාපයේ සංස්කාරක ලෙස කටයුතු කිරීම

තුළින් ගම්‍ය වේ.

- හීනටියන පොත්ගුල් මහා විහාරය
- වැල්ලවත්ත ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය
- වැල්ලවත්ත ශ්‍රී යමුනා සදහම් ආරාමය
- මඩවල බෝධිපාදපාරාමය
- ගණේමුල්ල ශ්‍රී බෙත්තාරාමය
- ගණේමුල්ල ශ්‍රී මහින්දාරාමය
- දකුණු කදිරාන ශ්‍රී දුමින්දාරාමය
- ගොඩිගමුවේ කුලසිංහ ධර්මාශ්‍රමය

ආදී කොට ගත් විහාරස්ථාන රැසක ට නායකත්වය දෙමින් ඒවායේ දියුණුව සඳහා නා හිමියන් දුන් අනුශාසනාවන් ගෞරවයෙන් සිහිපත් කළ යුතුවේ. උන්වහන්සේ විසින් ශාසනික සහ ශාස්ත්‍රීය වශයෙන් සිදුකරන ලද සේවාව අගයමින් 1981 දෙසැම්බර් 18 වනදා අමරපුර මහා නිකායේ අනුනායක පදවියට පත් කොට ඇත. 2002 ජූලි මස 21 වනදා එවකට අමරපුර මහා නිකායේ මහනායක කටුවැල්ලේගම අමරසිරි තිස්ස මහානාහිමියන් ප්‍රධාන කාරක සංඝ සභාව උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයේ දී **ශාසන ශෝභන සිරි ධම්මාලෝක සද්ධර්ම කීර්ති ශ්‍රී උපාධ්‍යාය** යන ගෞරව නාම සම්මුතිය ප්‍රදානය කොට හීනටියන නන්ද තිස්ස හිමියන් ගෞරවයට පාත්‍ර කොට ඇත. කටුවැල්ලේගම අමරසිරි තිස්ස මහානාහිමියන් 2005 සැප්තැම්බර් මස 14  වනදා අපවත් වීමෙන් පසු උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයට රැස් වූ මහා සංඝසභාව හීනටියන නන්ද තිස්ස අනුනාහිමියන් **අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර** යන ගෞරවෝපාධිය සහිතව මහානායක පදවියට

පත් කරගත්තේය. එම අවස්ථාවේ තමන් වහන්සේට වඩා සුදුසු භික්ෂූන් වහන්සේ නමක් වෙත මහානායක පදවිය පවරන ලෙස සංඝ සභාවෙන් ඉල්ලා සිටිමුත් මහා සංඝයා වහන්සේගේ බලවත් ඉල්ලීම පරිදි මහා නායක පදවිය භාරගෙන ඇත. මහානායක පදවිය ලබා ගත් මුත් ඒ සඳහා උත්සව සබාවක් පැවැත්වීම තරයේ ප්‍රතික්ෂේප කිරීමෙන් මහානායක ස්වාමීන් වහන්සේගේ අනතිමානී ගුණය කෙතරම්දැයි ප්‍රකට වෙයි. වර්තමානය දක්වාම සම්බුද්ධ ශාසනයේත් අප නිකාය පාර්ශ්වයේත් අභිවෘද්ධිය සඳහා ම කටයුතු කරන මහා නායක ස්වාමීන් වහන්සේ සම්බුදු සසුන අනාගත ලොව වෙත මම යාම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා කිහිප නමක් සසුන් ගත කොට ඇත. ඒ අතර

- ශාස්ත්‍රපති පූජ්‍ය හීනටියන ධම්මදස්සී තිස්ස හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මොරටුවේ වප්ප තිස්ස හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මහරගම මහින්ද තිස්ස හිමි
- පූජ්‍ය හීනටියන විනීත තිස්ස හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කැන්දගොල්ලේ පාලිත හිමි
- පූජ්‍ය හෝමාගම නාලක තිස්ස හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය උඩගම නාරද තිස්ස හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය හීනටියන ඤාණවිමල තිස්ස හිමි
- රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති පූජ්‍ය මාදුවේ සාසන තිස්ස හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය හිනුක්කාගම ඤාණසිද්ධි තිස්ස හිමි

2024 මැයි 23 වෙසක් පෝ දා රාත්‍රී 7 ට පමණ අපවත් වී වදාළහ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛනාවලිය

ධම්මදස්සී ස්ථවිර, හීනටියන, උපාලි සල්ගාදු. **පූජාච පූජනීයානං (පැවිදි දිවියේ හැටතුන් වසරක් සපුරන අමරපුර මහා නිකායේ ශාසන ශ්‍රී ධම්මාලෝක අරියවංසාලංකාර මහෝපාධ්‍යාය ශාස්ත්‍රාචාර් ය අතිපූජ්‍ය හීනටියන නන්දතිස්ස මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට උපහාර පිණිසයි.)** මිනුවන්ගොඩ: බෝධිපාදපාරාමය, 2015.

16 අමරපුර ගණපාමොක්ඛාචරිය  අරියවංසාලංකාර මහා මහෝපාධ්‍යාය

සද්ධර්මවාගීශ්වරාචාර්ය ආචාර්ය මාදම්පාගම අස්සජි තිස්ස අමරපුර මහා නිකායේ

මහානායක ස්වාමීන් වහන්සේ



වර්ෂ 1753 දී කීර්ති ශ්‍රී රාජසිංහ මහරජුගේ අනුග්‍රහයෙන් මෙරට ශ්‍යාමෝපසම්පදාව පිහිටුවා අද්‍යතන බෞද්ධ ප්‍රබෝධය ඇරඹූ බෝධිසත්වගුණෝපේත වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකු වූ වැලිතර ශ්‍රී ඤාණවිමල සාමණේරයන් වහන්සේ බුරුමයේ අමරපුරයට වැඩමවා එහි සංඝරාජ ධුරය දැරූ ඤාණාභිවංශ ධම්ම සේනාපති මාහිමියන් වෙතින් මහාවිහාර උපසම්පදාව ලබයි. වර්ෂ 1802 දී මහනුවර ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමයේ ශ්‍රී ලංකාවට පැමිණ මෙරට පළමුවරට අමරපුර සමාගම ආරම්භ කර වැලිතර අම්බරුක්ඛාරාම මූල මහා විහාරය කේන්ද්‍ර කර ගනිමින් පහත රට ශාසනික පුනරුද්දීපනයක් ඇති කරන්නේ එම මහාධම්ම රාජාධි රාජගුරු වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන් ය. උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර අමරපුර මහා නිකාය යැයි ප්‍රසිද්ධව පවතියි. බහුශ්‍රැත ධර්මධර මහතෙරුන් වහන්සේලා විසින් හොබවන ලද යථෝක්ත මහා නිකායේ සොළොස් වන මහා නායක පදවිය වැලිතර ඤාණවිමල තිස්ස මාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරින් පැවත එන ආචාර්ය මාදම්පාගම අස්සජි තිස්ස නාහිමියන් උසුලනු ලබයි.

පැරණි මහ තෙරුන් වහන්සේලා රැසකට ජාත ග්‍රාමය වූ දකුණු ලක මාදම්පාගම ග්‍රාමයේ වර්ෂ 1955 අප්‍රේල් මස 28 වනදා උපත ලද කුල කුමරු එම ගමෙහි ම කුමාර කාශ්‍යප විද්‍යාලයෙන් සිය මූලික අධ්‍යාපනය ලබා බුරුමයේ හයවන ධර්ම සංගායනාවට සහභාගී වූ අමරපුර මහා නිකායේ දසවන මහානායක පදවිය දැරූ අග්ගමහා පණ්ඩිත වලගෙදර ශ්‍රී සෝමාලෝක තිස්ස මහා නා හිමියන් සහ මාදම්පේ සෝමාරාම තිස්ස මාහිමියන්ගේ ශිෂ්‍යවරයෙකු ලෙස ප්‍රව්‍රජ්‍යා

සම්පත්තිය ලබන ලදී. ඒ වර්ෂ 1962 නොවැම්බර් මස 04 වනදා අම්බලන්ගොඩ පුරාණ චෛතිය විහාරයේ දී මාදම්පාගම අස්සජී යන නාමයෙනි. උගත මනා බණ දහම් සපුරා උපතින් විසි වස පිරී සිටි අස්සජී සාමණේරයන් වහන්සේ අමරපුර මහා නිකායේ අතිගරු මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ කාරක මහා සංඝ සභාව වෙතින් වර්ෂ 1975 ජූලි මස 06 වනදා අධිශීල සංඛ්‍යාත පාරිශුද්ධ උපසම්පදා ප්‍රතිලාභය ලබන ලදී. ලංකාවේ කීර්තිමත් ගිහිපැවිදි ආචාර්ය පඬිවරුන් යටතේ සඳලංකාව ශාස්ත්‍රෝදය විශ්වවිද්‍යාල පිරුවෙනින් පණ්ඩිත උපාධිය දක්වා ද ගංගොඩවිල සුභද්‍රාරාම උසස් අධ්‍යාපන ආයතනයෙන් ද ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය සිදුකොට ඇත. ඉන්දියාවේ බොම්බේ විශ්වවිද්‍යාලයෙන් තම ශාස්ත්‍රපති උපාධිය සහ තායිලන්තයේ චෙන්මායි විශ්වවිද්‍යාලයෙන් ස්වකීය ආචාර්ය උපාධිය දක්වා ද අධ්‍යයන කටයුතු සිදුකළ අප නාහිමිපාණන් වර්ෂ 1985 සිට 1995 දක්වා කොළඹ කැතිඩ්‍රල් මහා විද්‍යාලයේ ආචාර්යවරයෙකු ලෙස ශාස්ත්‍ර දායාදය අරඹා ඇත.

තමන් වහන්සේගේ දැනුම ස්වනිකාය අභිවෘද්ධිය සඳහා යොමු කළ අතර නාහිමිපාණන්ගේ ශාසනික සේවය අගයමින් අමරපුර මහා නිකායේ මහානායක ස්වාමීන් වහන්සේ ප්‍රධාන සංඝ සභාව විසින් වර්ෂ 1978 දී නිකායික විංශත් වර්ගික කාරක සංඝ සභාව සඳහා පත් කර ගන්නා ලදී. තවදුරටත් උන්වහන්සේ විසින් සිදු කරගෙන යන්නා වූ ශාසනික සේවාව අගයමින් එයට උර දීම පිණිස 1986 වර්ෂයේ දී කොළඹ නව කෝරලයේ ප්‍රධාන සංඝනායක පදවිය ද 2005 වර්ෂයේ දී සමලේඛකාධිකාරී පදවිය ද 2020 වර්ෂයේ අනුනායක පදවිය ද පසුව මහා ලේඛකාධිකාරී පදවිය ද පිරිනමන ලදී. ශ්‍රී ලංකා අමරපුර

මහා සංඝ සභාව මඟින් 2018 වසරේ සිට 2022 වසර දක්වා ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරීන් වහන්සේ ලෙස පත් පත්කරගත් උන්වහන්සේ පාර්ශ්ව 22 ක සංඝසභාවන් සඳහා මහත් මෙහෙයක් කර ඇත. පුරා දශක ගණනාවක් විවිධ තනතුරු දරමින් අමරපුර මහා නිකායට සිදුකරන ලද නිකායාභිවෘද්ධිය සලකා 2024 ජූලි මස 23 වනදා කාරක සංඝ සභාව මඟින් අමරපුර ගණපාමොක්ඛාචරිය අරියවංසාලංකාර මහා මහෝපාධ්‍යාය යන අමරපුර මහා නිකායේ මහානායක පදවියේ සාම්ප්‍රදායික ගෞරවාභිධානය සහිතව මහානායක පදවියට පත් කරගනු ලැබූහ.

ස්වනිකායට පමණක් නොව විවිධ සමාජ සංවිධානවල ද නායකත්වයය දරමින් ඒවායේ ප්‍රගමනය සඳහා තම කාලය, දැනුම, ශ්‍රමය කැප කරමින් විශාල සමාජ සේවයක අප මහානාහිමිපාණෝ නිරත වන්නාහ. කොළඹ සමථ මූල මණ්ඩලයේ සභාපතිවරයා ලෙසත්, ධර්ම ශක්ති සංවිධානයෙහි සම සභාපතිවරයා ලෙසත්, සාමයේ මිතුරෝ සංවිධානයෙහි සහ ජාතික සම්පත් සුරැකීමේ භික්ෂු සංවිධානයෙහි මහා ලේකම් ලෙසත්, ශ්‍රී ලංකා භික්ෂු සංසදයෙහි මාධ්‍ය ලේකම්වරයා ලෙසත් කටයුතු කළේ නාහිමිපාණන්ය. ජාත්‍යන්තර සංවිධානවල ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විවිධ තනතුරු දැරූ නාහිමිපාණන් ලෝක බෞද්ධ මහා සම්මේලනයේ බුදු දහම සහ අන්තර් ආගමික කමිටුවේ සාමාජිකත්වය ද අන්තර්ජාතික ක්‍රියාකාරී බෞද්ධයන්ගේ සම්මේලනයේ ශ්‍රී ලංකා ශාඛාවේ උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය ද ආසියානු බෞද්ධ සාම සම්මේලනයේ

ශ්‍රී ලංකා ශාඛාවේ නියෝජ්‍ය ලේකම් තනතුර ද දරමින් ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් මහත් සේවයක් ඉටු කරනු ලබයි.

තම සංඝ පරම්පරාවේ මූලස්ථානයක් වන අම්බලන්ගොඩ කන්දේගොඩ මහාචෛතිය පිරිවෙන් මූල මහා විහාරය ද ඇතුළුව කොළඹ 14 ඉසිපතනාරාම මහා විහාරය, පුත්තලම බෞද්ධ මධ්‍යස්ථානය, ජාඇල දඹුව ශ්‍රී බෝධිරුක්ඛාරාමය යන විහාරයන්හි විහාරාධිපතීන් වහන්සේ ලෙස ද දායකකාරකාදීන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයෙහිලා තමන්ගෙන් විය යුතු යුතුකම් වගකීම් මැනවින් සිදුකරයි. අන්තිමානී ගුණයෙන් හෙබි අප මහානාහිමිපාණන් වහන්සේ කුළුණු ගුණෙන් යුතුව ලොකු කුඩා කා හටත් සැලකීම උන්වහන්සේගේ ජීවිතයේ විශිෂ්ට ගුණයකි. භික්ෂූන් වහන්සේ නමක ලෙස තමන් වහන්සේගෙන් ශ්‍රී සම්බුද්ධ ශාසනයෙහි චිර පැවැත්ම සඳහා ඉටුවිය යුතු මෙහෙවර මැනවින් අප නාහිමිපාණන් වහන්සේ විසින් ඉටු කරනු ලබන අතරම බෞද්ධ භික්ෂුවක් ලෙස තමන් වහන්සේට ශ්‍රී ලංකාවේ දී ජාතිකව පැවරී ඇති වගකීම් මැනවින් ඉටුකරන අයුරු ජාතික ප්‍රශ්නවල දී උන්වහන්සේ මැදිහත්ව ක්‍රියාකරන ආකාරයෙන් විද්‍යමාන වෙයි. අප නාහිමිපාණන් වහන්සේට විංශත් ශතවර්ශාධික කාලයක් ලෝක ශාසනික සේවයෙහි යෙදීමට බුද්ධාදීරත්නත්‍රයෙහි ආශිර්වාද ලැබේවායි ආශිංසනය කරමු.



# අමරපුර මහා නිකායේ මහාසාමි ධූරාවලිය

රටෙහි අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**

**සෙනෙවිරත්න මහලේකම්**

ISBN **978-624-208-801-3**